# වාර්ෂික වාර්තාව 2012



ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව





ආරක්ෂිත හා විශ්වසනීය උපයෝගිතා සේවාවන්
සාධාරණ මිල ගණන් යටතේ සැපයීම තහවුරුකිරීමෙහි නියාමන කාර්යභාරය
ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් ඉටුකරනු ලැබේ

# පටුන

## පූර්විකාව


01. කොමිෂන් සභාව
02. ආයතනික තොරතුරු
03. කොමිෂන් සභාවෙහි සාමාජිකයින්
04. සභාපතිතුමාගේ පණිවුඩය
05. අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ ප්‍රකාශය
07. 2012 සමාලෝචනය


## කාර්යසාධනය


08. විදුලිබල අංශය
08. පාරිභෝගික ආරක්ෂාව
12. මහජන උපදේශනය
12. ප්‍රතිපත්ති උපදේශ
12. බලපත්‍ර පිරිනැමීම
13. පුනර්ජනනීය විදුලිබල අංශය
15. අයකුම ක්‍රියාවලිය
15. පර්යේෂණ හා අධ්‍යයන
18. රෙගුලාසි/රීති/පටිපාටි/කේත/ක්‍රමවේද හා උපමාන
21. ඛණිජතෙල් අංශය
23. අනෙකුත් කාර්යයන්
23. විදුලිබල අංශයේ පරීක්ෂණ
25. මානව සම්පත්


## පෙරදැක්ම


26. 2013 වැඩසටහන්


## විගණනය


31. විගණකාධිපති වාර්තාව
34. විගණකාධිපති වාර්තාවට ප්‍රතිචාර


## ගිණුම්


37. මූල්‍ය ප්‍රකාශය




වැඩිදුර විස්තර සඳහා
වෙබ් අඩවියට පිවිසෙන්න:
www.pucsl.gov.lk

# දැක්ම සහ මෙහෙවර

## අපේ දැක්ම

රටේ තිරසාර සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය යටිතල පහසුකම් සහ උපයෝගිතා සේවා වඩාත් පිරිමැසුම්දායි ලෙස, සියලූම ශ්‍රී ලාංකිකයින් හට සහ එහි සංවර්ධනයට දායක වන්නන්ට ලබා දිය හැකි වාතාවරණයක් ඇති කිරීම.

## අපගේ මෙහෙවර

වඩාත් සාධාරණ හා දිගුකල් පවත්නා ආකාරයට, වර්තමාන සහ අනාගත පාරිභෝගිකයන් වෙත, ආරක්ෂා සහිතව, විශ්වාසදායි සාධාරණ මිලකට යටිතල පහසුකම් උපයෝගිතා සේවා සැපයීම තහවුරු කෙරෙන අයුරින්, ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ විෂය පථයට ඇතුළත් වන මහජන උපයෝගිතා සේවා සපයන්නන් නියාමනය කිරීම.

# පූර්විකාව

## විශේෂ තොරතුරු

පාරිභෝගික ආරක්ෂණය

පැමිණිලි 425

සමිති 21

මහජන අදහස් විමසීම

උපදේශන 02

බලපත්‍ර පිරිනැමීම

බලපත්‍ර 58

නිදහස් කිරීම් 12

පර්යේෂණ

ව්‍යාපෘති 09

ආරක්ෂිතබව

පරීක්ෂණ 26

නියාමන නීතිරීති

රීති සහ රෙගුලාසි 10

### අරමුණු

විදුලිබල පාරිභෝගික ආරක්ෂාව

සාධාරණ විදුලිබල ගාස්තු හා අයකුම

බලශක්ති සංරක්ෂණය හා කාර්යක්ෂමතාව

විදුලිබල සැපයුමෙහි විශ්වාසනීය බව හා ගුණාත්මක තත්වය

පුද්ගලයන් හා දේපල සඳහා විදුලිබල සැපයුමෙහි ආරක්ෂිත බව

සියලු පාර්ශවකරුවන් සඳහා තොරතුරු ලබාදීම

තරගකාරීත්වය ප්‍රවර්ධනය

පසුභාග බණිජතෙල් අංශය නියාමනය

# ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවට (PUCSL) විදුලිබලය, ඛණිජතෙල් සහ ජලසැපයුම් කර්මාන්තයේ අරමුණු නියාමනය කිරීමේ වගකීම පවරා ඇත. මෙම කොමිෂන් සභාවේ පරමාර්ථයන්, කාර්යභාරයන් සහ නීතිමය රාමුව 2000 අංක 35 දරණ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනතේ සහ 2009 අංක 20 දරණ ශ්‍රී ලංකා විදුලිබල පනතේ පැහැදිළි කර ඇත. කොමිෂන් සභාවේ දැක්ම වන්නේ රටේ තිරසාර සංවර්ධනය සඳහා යටිතල පහසුකම් සහ උපයෝගීතා සේවා වඩාත් කාර්යක්ෂම ලෙස සියලුම ශ්‍රී ලාංකිකයින් හට සහ සංවර්ධනයට දායකවන්නන්ට ලබාදිය හැකි වාතාවරණයක් නිර්මාණය කිරීමයි.

2009 වර්ෂය තුළදී, ශ්‍රී ලංකා විදුලිබල පනත පැනවීමත් සමඟම මෙම කොමිෂන් සභාව විසින් විදුලිබල අංශය නියාමනය කිරීම ආරම්භ කරන ලදි. කොමිෂන් සභාව ජාතික විදුලිබල කර්මාන්තයේ නියාමන ආයතනය වශයෙන් විදුලි අයකුම සහ සේවා ගාස්තු, විදුලිබල සැපයුමේ ගුණාත්මකභාවය, විශ්වසනීයත්වය, සැපයුමේ ප්‍රමාණවත්භාවය, ජීවිත සහ දේපලවලට විදුලිබලයේ ආරක්ෂාව, බලශක්ති සුරැකුම, බලශක්ති සංරක්ෂණය, විදුලිබලය කාර්යක්‍ෂම ලෙස භාවිතා කිරීම, බලශක්ති අංශයේ ආයෝජනයන්ගෙන් ඇතිවිය හැකි පාරිසරිකමය ගැටලු අවම කිරීම, විදුලිබල පාරිභෝගිකයන්ගේ ආරක්ෂාව සහතික කිරිම, තරගකාරිත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා විදුලිබල වෙළඳපල ව්‍යූහය ස්ථාපිත කිරීම සහ පාර්ශ්වකරුවන්හට විදුලිබල අංශයේ තොරතුරු බෙදාහැරීම යන ක්ෂේත්‍රයන් ආවරණය කරමින් ක්‍රියාත්මක වේ.

දැනට, මෙම කොමිෂන් සභාව පසුභාග ඛණිජ තෙල් කර්මාන්තයේ ඡායාමාත්‍ර නියාමන ආයතනය ලෙසද ක්‍රියා කරයි. (උදා-ඛණිජ තෙල් නිෂ්පාදන සිල්ලර වෙළඳාම සඳහා ඛණිජ තෙල් සම්පත් පිරිපහදු කිරීම) වර්තමානයේ, කොමිෂන් සභාව විසින් ලිහිසිතෙල් සහ දැවිතෙල් වෙළඳපලට අදාළව පවතින ප්‍රතිපත්ති සහ නියාමන අංගයන්ට අදාළ උපදෙස් සහ සහය ලබාදේ. 2013 වර්ෂය තුළ පාර්ලිමේන්තුව විසින් පැනවීමට අපේක්ෂා කරනු ලබන ඛණිජ තෙල් කර්මාන්ත නීති පද්ධතීන්ට යෝජිත සංශෝධනයන් සමඟ කොමිෂන් සභාව 2013 වර්ෂය තුළ පසුභාග ඛණිජ තෙල් කර්මාන්තයේ බලයලත් නියාමන ආයතනය වශයෙන් එහි භූමිකාව ආරම්භ කිරීමට අපේක්ෂා කරයි.

2012 ජනවාරි 01 දින සිට 2012 දෙසැම්බර් 31 දින දක්වා කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කළ කාර්යයන් මෙන්ම 2013 වර්ෂය වෙනුවෙන් කොමිෂන් සභාව විසින් සැලසුම් කරන ලද කාර්යයන් පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ අඩංගු වේ.

# ආයතනික තොරතුරු



## කොමිෂන් සභාවේ නම

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව

## නෛතික තත්ත්වය

2002 අංක 35 දරණ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනත මගින් ස්ථාපිතය.

## 2012 වර්ෂය තුළ කොමිෂන් සභාවේ සාමාජිකයන්

| | |
|---|---|
| ජනාධිපති නීතිඥ ආචාර්ය ජයතිස්ස ද කොස්තා මහතා | සභාපති |
| ආචාර්ය බන්දුල පෙරේරා මහතා | නියෝජ්‍ය සභාපති |
| මහාචාර්ය රාහුල අතලගේ මහතා | සාමාජික |
| නීතිඥ සංජය ගමගේ මහතා | සාමාජික |
| ප්‍රසාද් ගල්හේන මහතා | සාමාජික |

## අධ්‍යක්ෂ ජනරාල්

දමිත කුමාරසිංහ මහතා

## කොමිෂන් සභාවේ ලේකම්

ජානකී එම් විතානගම මහත්මිය

## ලියාපදිංචි කාර්යාලය

6 වන මහළ, ලංකා බැංකු වෙළඳ කුළුණ,
අංක 28, ශාන්ත මයිකල් පාර, කොළඹ 3,
ශ්‍රී ලංකාව
දුරකථනය : +9411 239 2607
ෆැක්ස් : +9411 239 2641
ඊ මේල් : info@pucsl.gov.lk
වෙබ් අඩවිය : www.pucsl.gov.lk

## විගණකවරු

විගණකාධිපති දෙපාර්තමේන්තුව

## බැංකුකරු

ලංකා බැකුව
1 සහ 2 වන මහළ, ලංකා බැංකු වෙළඳ කුළුණ,
අංක 28, ශාන්ත මයිකල් පාර, කොළඹ 3,
ශ්‍රී ලංකාව

# කොමිෂන් සභාවේ සාමාජිකයින්



ජනාධිපති නීතිඥ ආචාර්ය ජයතිස්ස ද කොස්තා
සභාපති



ආචාර්ය බන්දුල පෙරේරා
නියෝජ්‍ය සභාපති



මහාචාර්ය රාහුල අතලගේ
සාමාජික



නීතිඥ සංජය ගමගේ
සාමාජික



ප්‍රසාද් ගල්හේන
සාමාජික



# සභාපතිතුමාගේ පණිවුඩය

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව (කොමිෂන් සභාව) 2002 වර්ෂයේ පිහිටුවන ලද අතර අනතුරුව 2009 අංක 20 දරණ ශ්‍රී ලංකා විදුලිබල පනත මඟින් විදුලිබල අංශයේ නියාමන ආයතනය වශයෙන් බලගැන්වීය. කොමිෂන් සභාව සුදුසු ප්‍රමිතීන් සහ නියාමන මැදිහත්වීම් හරහා විදුලිබල කර්මාන්තයෙහි ඉහළ කාර්යසාධනය, ආරක්ෂාව සහ කාර්යක්ෂමතාවය සහතික කරමින් ශ්‍රී ලංකාවේ බලශක්ති සේවාවන් වර්ධනය කිරීම සඳහා අඛණ්ඩ වෑයමක නිරතව සිටී.

2012 වර්ෂයේදී එහි නියාමන මැදිහත්වීම් සිදුකරගෙන යාමේදී කොමිෂන් සභාවට බොහෝ අභියෝග සහ ඉඩ ප්‍රස්ථාවන් ඉදිරිපත් විය. කොමිෂන් සභාව විසින් 2012 වර්ෂයෙදී පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමේ ක්ෂේත්‍රය තුළ සහ සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති මිලදී ගැනීමේ අයක්‍රමයන් අනුමත කිරීම තුළ විශේෂ ඉදිරි පියවරයන් තබා ඇත. ලෝක ඛණිජ තෙල් මිල ගණන් සහ වර්තමානයේ ශ්‍රී ලංකාවේ විදුලිබල උත්පාදනය සඳහා ආනයනය කළ පොසිල ඉන්ධන මත ඇති දැඩි විශ්වාසය ඉහළයාම තුළින්, රජය සහ පාරිභෝගිකයන් මත විශාල ආර්ථික බරක් ඇති කරයි. මෙම බර පසුගිය වර්ෂ කිහිපය තුළ විදුලි මිල ගණන් තීරණය කිරීමේදී බරපතල ලෙස බලපෑම් කර ඇත. ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය තුළ 2016 වනවිට සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති මූලයන් තුළින් 10%ක බලශක්තියක් උත්පාදනය කිරීමේ ඉලක්කයක් විස්තර කර ඇති අතර මෙය දැනට සාම්ප්‍රදායික ජල විදුලි බලය තුළින් උත්පාදනය කරනු ලබන මෙගාවොට් 1000 ට අමතර උත්පාදනයකි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, කොමිෂන් සභාව විසින් බලශක්ති අංශය තුළ එහි නියාමන මැදිහත්වීම් තුළින් ශ්‍රී ලංකාව තුළ සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ප්‍රවර්ධනය කිරීම සඳහා තවදුරටත් අතිශයින් බැඳී පවතී. 2012දී, කොමිෂන් සභාව විසින් සාර්ථක මහජන උපදේශන ක්‍රියාවලියක් පවත්වන ලද අතර 2012 වර්ෂය සඳහා සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති මිලදී ගැනීමේ නව අයක්‍රමයන් අනුමත කරන ලදි. මෙම නව මිල ගණන් ව්‍යුහය මඟින් සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති අංශය තුළ ආයෝජනයන් වැඩි කිරීම ධෛර්යමත් කිරීම සඳහා දිරි ගැන්වීමක් සිදුවේයැයි අපේක්ෂා කෙරේ.

උපයෝගිතා අංශයන් තුළ පාරිභෝගික අභිලාෂයන් ආරක්ෂා කිරීම කොමිෂන් සභාවේ අභියෝගයක්ව තවදුරටත් පවතින අතර කොමිෂන් සභාව විසින් විදුලි පාරිභෝගිකයන්ගේ අයිතිවාසිකම් සහ වගකීම් පිළිබඳව උපදෙස් දෙමින් දිවයින පුරා පාරිභෝගික ප්‍රජාවට සමීප වූ මුල් පියවරයන් සපයමින් 2012 වර්ෂය තුළදී මෙම ක්ෂේත්‍රය තුළ විශාල ඉදිරි පියවරයන් තැබීමට හැකි විය. එමෙන්ම, කොමිෂන් සභාව විසින් ලංකා විදුලිබල මංඩලය සහ ලංකා විදුලිබල පුද්ගලික සමාගම විසින් සපයන පාරිභෝගික සේවාවන් සම්බන්ධයෙන් වර්තමාන පාරිභෝගික තෘප්තිමත්භාවය පිළිබඳ සංගණනයක් පවත්වන ලදි. කොමිසම් සභාව විසින් තවදුරටත් 2012 වර්ෂය තුළ පාරිභෝගිකයන්ට සහ සියලුම පාර්ශවකරුවන්ට අදාළ විදුලිබල සහ ඛණිජතෙල් රෙගුලාසීන්ට අදාළ සහ භාවිතාවන අයක්‍රමයන් සහ අදාළ කර්මාන්ත යාවත්කාලීන කිරීම් පිළිබඳ වැඩිදුර තොරතුරු සපයමින් නව පරිශීලනය කරන්නන්ට මිත්‍රශීලී වෙබ් අඩවියක් ආරම්භ කරන ලදි. මෙම වෙබ් අඩවිය තුළින් උත්සාහ කරනු ලබන්නේ කර්මාන්තයේ නිවැරදි කාර්යය සාධන දත්ත ව්‍යාප්තිය තුළින් විදුලිබල අංශය තුළ විනිවිදභාවය පෝෂණය කිරීමටත් ඒ තුළින් පාරිභෝගික දැනුවත්භාවය වැඩි කිරීමටත් සහ විදුලිබල කර්මාන්තය විසින් මුහුණපානු ලබන සැබෑ අභියෝග සම්බන්ධයෙන් මහජන කතිකාවන් සඳහා උනන්දු කරවීමයි.

විදුලිබල ආරක්ෂාව යන ක්ෂේත්‍රයද කොමිෂන් සභාවේ ප්‍රමුඛතම කාර්යයකි. 2012 වර්ෂය තුළ කොමිෂන් සභාවේ කාර්යය මණ්ඩලය විසින් දිවයින පුරා විදුලිබලය සම්බන්ධ අනතුරු සහ සිදුවීම් බොහෝමයක් පරීක්ෂා කිරීමේදී මෙන්ම කුඩා ජල විදුලි බලාගාර පවත්වාගෙන යන ස්ථානවල යොදා ගන්නා ආරක්ෂිත ක්‍රියාමාර්ග නිශ්චය කරගැනීම සඳහා එවැනි ස්ථානයන් පරීක්ෂා කරනු ලැබීය. මෙවැනි වැඩහුම් සෝදිසි කිරීම් සහ පරීක්ෂණයන්ගෙන් ලැබෙන ප්‍රතිඵල පොදු මහජනතාවට ප්‍රතිලාභ ලබාදෙන විදුලිබල ආරක්ෂිත රෙගුලාසි සංවර්ධනය කිරීමේදී කොමිෂන් සභාවට විශාල වශයෙන් සහාය වේ.

2012දී, විදුලිබල කර්මාන්ත කාර්යය සාධනය සහ සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති අංශය තුළ නව පර්යේෂණ ආරම්භ කිරීම කෙරිණි. මෙම උත්සාහයේ ප්‍රතිඵල ඉදිරි වර්ෂය තුළදී ප්‍රකාශයට පත්කරනු ලැබේ. ඊට අමතරව, එවැනි පර්යේෂණ තුළින් රැස්කළ දත්තවලින් ප්‍රතිපත්ති සකස් කිරීම සහ විශේෂයෙන් සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති අංශය වැනි තීරණාත්මක ක්ෂේත්‍රයන් තුළ රජයට ප්‍රතිපත්ති උපදෙස් සඳහා පදනමක් ලබාදේ යැයි කොමිෂන් සභාව අපේක්ෂා කරයි.

2013 වර්ෂය තුළ සිදුවීමට නියමිත ඛණිජ තෙල් අංශයේ නීති සම්පාදනයත් සමඟම, බහු අංශ නියාමන ආයතනයක් වශයෙන් කොමිෂන් සභාවේ භූමිකාව ශක්තිමත් කරනු ලැබේ. එයට අනුගාමීව, ඉදිරි වර්ෂයන් තුළදී වඩා ඉල්ලුම් සහ අභියෝගයන් කොමිෂන් සභාවට තවත් අභියෝගාත්මක මෙහෙවරක් කිරීමට සිදුවනු ඇත.

කොමිෂන් සභාවේ සාමාජිකයන්ට, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයට, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයට සහ අනෙකුත් අදාළ රජයේ ආයතනයන්ට සහ වර්ෂය මුළුල්ලේ මාහට ලබාදුන් කැපවීම වෙනුවෙන් අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු කාර්ය මණ්ඩලයට මාගේ ස්තූතිය පිරි නමමි.



ජනාධිපති නීතිඥ ආචාර්ය ජයතිස්ස ද කොස්තා
සභාපති



# අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ ප්‍රකාශය

2012 වර්ෂය කොමිෂන් සභාවට අභියෝගාත්මක මෙන්ම ක්‍රියාශලි වර්ෂයක් විය. කොමිසම් සභාව විසින් 2012 වර්ෂය තුළ විදුලිබල අංශයේ නියාමන ආයතනය වශයෙන් එහි තෙවනි වර්ෂය සාර්ථකව නිමකරන ලදි. කොමිෂන් සභාව විසින් නියාමන යාන්ත්‍රණ, උපකරණ, කේතයන් සහ ක්‍රමවේද ගණනාවක් සකසන ලදි. ඇතැම් ඒවා 2012 අවසානය වනවිට නිමවීමට ආසන්නව පැවතිනි. විදුලිබලය සැපයුමේ ආරක්ෂාව, ගුණාත්මකභාවය සහ අඛණ්ඩතාවයට අදාළවන වැදගත් රෙගුලාසීන්, සැපයුම් සේවා කේතයන් සහ අයක්‍රම සමාලෝචනය කිරීමේ ක්‍රියාපටිපාටීන් අවසන් කරන ලද අතර මේවායින් කොමිෂන් සභාවේ නියාමන භූමිකාව ශක්තිමත් කිරීම මෙන්ම ඉදිරි වර්ෂයන් තුළ විදුලිබල කර්මාන්තයේ දිගුකාලීන කාර්යක්ෂමතාවය සහ ආරක්ෂිත අරමුණු ඉටුකරගැනීම අපේක්ෂා කරයි.

කොමිෂන් සභාව විසින් පාරිභෝගික ආරක්ෂාව සම්බන්ධයෙන් විශේෂ ජයග්‍රහණ ළඟා කර ගෙන ඇත. 400ට වැඩි පාරිභෝගික පැමිණිලි විසදීම සඳහා 2012 වර්ෂය තුළ සාර්ථකව පහසුකම් සපයන ලදි. විදුලි පාරිභෝගිකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට අදාළවන නව ව්‍යාපෘති රාශියක් ඇරඹීමට පියවරගන්නා ලදි. මෙයට විදුලි පාරිභෝගිකයන්ගේ අයිතිවාසිකම් සහ වගකීම් අවධාරණය කරමින් දිවයින පුරා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, විවිධ කරුණු පිළිබඳ දැනුවත් කෙරෙන අතර අත්පත්‍රිකා සකස් කිරීම සහ විදුලි සැපයුම් සේවාවන්ට අදාළව පවත්නා පාරිභෝගික තෘප්තිය තක්සේරුකිරීම පාරිභෝගික තෘප්තිය පිළිබද සමීක්ෂණයක් පැවැත්වීමද අයත් වේ. එමෙන්ම කොමිෂන් සභාව විසින් විදුලි බිල්පත ගණනය කිරන ආකාරය වඩාත් පාරදෘශ්‍ය ආකාරයකින් සිදුකිරීම සඳහා පාරිභෝගිකයන්හට නව විදුලි බිල් ආකෘතියක් හඳුන්වාදීමට මූලික පියවරයන් ආරම්භ කරන ලදි.

2012 දී, කොමිෂන් සභාව විසින් විදුලි පාරිභෝගිකයන්ගේ පහසුව පිණිස වෙබ් අඩවිය මත පදනම්ව පාරිභෝගික පැමිණිලි ඉදිරිපත් කිරීමට පහසුකම් සලසන ලදි. මෙම පද්ධතිය කොමිෂන් සභාව සහ පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට කැමති පැමිණිලිකරුවා අතර අතරමැදියෙක් ලෙස ක්‍රියාකරන අතර විදුලිබලයට සම්බන්ධ ආරාවුලකදි කොමිෂන් සභාව සමඟ සන්නිවේදනය පවත්වාගෙන යාමට පහසුකම් සළසයි. එසේම සිංහල, දෙමල සහ ඉංග්‍රීසි භාෂා ත්‍රිත්වයෙන්ම සන්නිවේදන පහසුකම් සපයයි. පාරිභෝගික පැමිණිලි පහසු කිරීමේ පද්ධතිය සමග රාජ්‍ය භාෂා තුනෙන් ලබාගත හැකි සේවාවන් සහිත නව වෙබ් අඩවිය නිර්මාණය කිරීම 2012 වසරේදී ආරම්භකළ අතර 2013 වර්ෂය තුළ නිලවශයෙන් ආරම්භ කරනු ලැබේ.

2012 වර්ෂය තුළ බලශක්ති අංශය තුළ පර්යේෂණ සහ අධ්‍යයනයන් කොමිෂන් සභාවේ වඩා ක්‍රියාකාරී භූමිකාව වූ අතර විදුලිබල කර්මාන්තයේ පවත්නා කාර්ය සාධනයට සහ සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති අංශයට අදාළවන නව අධ්‍යයන ආරම්භ විය. කොමිෂන් සභාව විසින් මෙම පර්යේෂණ අනාගතයේදී බලශක්ති අංශයට අදාළව රජයේ ප්‍රතිපත්ති සහ මගපෙන්වීම් සකස් කිරීමේදී සහය වෙනු ඇතැයි කොමිෂන් සභාව අපේක්ෂා කරයි.

විදුලිබලය සුරැකුම සහ ආරක්ෂාවද 2012 වර්ෂය තුළ කොමිෂන් සභාවේ න්‍යාය පත්‍රයේ ඉහළින්ම පැවතුණු අතර විදුලිබලයට සම්බන්ධ අනතුරු විශාල සංඛ්‍යාවක් සහ පොදු ආයතනවලදී සහ ස්වාධීන විදුලි බලාගාරවලදී සම්මත කරගත් විදුලි සුරැකුම් ආරක්ෂණ ක්‍රියාපටිපාටීන් කොමිෂන් සභාවේ කාර්යය මණ්ඩලය විසින් විමර්ශනය කරන ලදි. 2012දී, කොමිෂන් සභාව විසින් මෙවැනි විමර්ශනයන්ගෙන් රැස්කළ දත්ත මත පදනම්ව විදුලිබලය සුරැකීමේ රෙගුලාසීන් සකස්කිරීම ආරම්භ කරන ලද අතර මේවා 2013 වර්ෂයේදී ප්‍රසිද්ධ කිරීමට නියමිතය.

2012 දී, කොමිෂන් සභාව විසින් 2013 - 2015 වසර සඳහා එහි ආයතනික සැලැස්ම සකස්කරන ලදි. මෙම සැලසුම් සඳහා මහජන අදහස් ලබාගැනීමට මහජන උපදේශන ක්‍රියාවලියක් පැවත්විණි . ආයතනික සැලැස්මෙහි කොමිෂන් සභාවේ මධ්‍ය සහ දිගුකාලීන අරමුණු හඳුනාගන්නා ලද අතර අනාගත ව්‍යාපෘතින් සකස් කරනු ලබන්නේ මෙම අරමුණු මත පදනම් විය. ආයතනික සැලැස්මෙහි දක්වා ඇති අරමුණු සහ මුල්පිරීම් මත පදනම්ව, කොමිෂන් සභාව විසින් 2013 වර්ෂය සඳහා සැලසුම්කළ වැඩසටහන් අන්තර්ගත 2013 පෙරදැක්ම වාර්තාව එළිදැක්වීමට පියවර ගන්නා ලදි.

කාර්යක්ෂම නියාමන කාර්යභාරය තුළ ප්‍රධාන සාධකයක්වන මානව සම්පත සම්බන්ධයෙන් සුවිශේෂ ජයග්‍රහණ අත්කරගෙන ඇත. 2012 වර්ෂයේදී නව විධායක නිලධාරීන් 13 දෙනෙක් කොමිෂන් සභාවට එක් වූ අතර මෙම නව බඳවාගැනීම කර්මාන්තය තුළ සියළුම පාර්ශ්වකරුවන්ට ප්‍රතිලාභ ලබාදෙන කොමිෂන් සභාවේ දිගුකාලීන අරමුණු සහ මුලපිරීම් වේගවත් කිරීමට හේතුවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

විදුලිබල අයක්‍රම පිළිබද තීරණය හා ක්‍රියාමාර්ග කොමිෂන් සභාවට පැවරී ඇති ප්‍රධාන අභියෝගයකි. නියාමන ආයතනයක් ලෙස කොමිෂන් සභාවට සාධාරණ විදුලිගාස්තු සඳහා විදුලි පාරිභෝගිකයන්ගේ අවශ්‍යතාවයන් ආමන්ත්‍රණය කිරීම සහ අඛණ්ඩ පදනමක් මත විදුලිබලය සැපයීමට ප්‍රමාණවත් ආදායම් වෙනුවෙන් විදුලිබල සේවා සපයන්නන්ගේ අවශ්‍යතාවයන් අතර තුලනයක් පවත්වාගනිමින් අභියෝගත්මක තීරණයක් ගැනීමට සිදුවේ. 2011 ජනවාරි මාසය තුළදී, කොමිෂන් සභාව විසින් රජයේ ප්‍රතිපත්තියට අනුකූලව පළමු අයක්‍රමයන් සංශෝධනය අනුමත කරන ලදි. 2012දී, ඉන්ධන මිළ ගණන්වල අධික ලෙස ඉහළයාම නිසා එයට උපකාර කිරීම සඳහා ඉන්ධන ගැලපීම් ගාස්තුව ක්‍රියාවට නගන ලදි.

ආනයනය කරන ඉන්ධන මිලෙහි වාර්ෂිකව ඉහළයාම වර්ධනය වන පිරිවැය පාලනය කළ නොහැකි අනුපාතයකින් වර්ධනය වෙමින් පවතින අතර වර්තමානයේ රජයේ ප්‍රතිපත්තිය විසින් අවධානය යොමු කරන්නේ සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති අංශය ශක්තිමත් කිරීම කෙරෙහිය. සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති මිලදී ගැනීමේ අයක්‍රමයන් කොමිෂන් සභාව විසින් 2012 නොවැම්බර්හිදී ප්‍රකාශයට පත් කරන ලදි. සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති අයක්‍රමයන් එවැනි අයක්‍රමයන් තීරණය කිරීමට භාවිතා කළයුතු නියමිත ක්‍රියාවලිය අනුගමනය කරමින් කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදි. කොමිෂන් සභාව සියලුම පාර්ශවකරුවන්ගේ අදහස් සැලකිල්ලට ගෙන අවසන් තීරණයට එලඹෙන ලදි.

වත්මන් ලිහිසිතෙල් වෙළඳපලේ ඡායාමාත්‍ර නියාමන ආයතනය වශයෙන්, කොමිෂන් සභාව විසින් ඛණිජතෙල් කර්මාන්ත අමාත්‍යාංශයේ සහයෝගය ඇතිව 2012 සැප්තැම්බර් මාසය තුළ කර්මාන්තකරුවන් සඳහා ඉතා සාර්ථක වැඩමුළුවක් පවත්වන ලදි. 2012 කාලපරිච්ඡේදය තුළ, ඛණිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශය 2002 අංක 33 දරණ ඛණිජතෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනතට සහ 1961 අංක 28 දරණ ලංකා ඛණිජතෙල් සංස්ථා පනතට සිදු කිරීමට යෝජිත සංශෝධනයන් පිළිබඳව නීතිපති දෙපාර්තමේන්තුව සමඟ පසුභාග ඛණිජ තෙල් කර්මාන්තය නියාමනය කිරීමට කොමිෂන් සභාවට බලය පැවරීමට සාකච්ඡාවක් පවත්වාගෙන ගියේය. එම පනත් දෙකම ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව සහ ඛණිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශය සමග උපදේශකත්වයෙන් නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව විසින් නැවත කෙටුම්පත් කර ඇත. දැනට, නීති පද්ධතියට යෝජිත සංශෝධන සඳහා නීතිපති දෙපාර්තමේන්තුව විසින් අනුමැතිය අපේක්ෂාවෙන් සිටී.

2012 වර්ෂය තුළ කොමිෂන් සභාවේ වැඩසටහන් ක්‍රියාවට නැගීම සඳහා මාහට ලබාදුන් කැපවීම සහ සහයෝගය වෙනුවෙන් කොමිෂන් සභාවේ සභාපති සහ සාමාජිකයන් වෙත මාගේ ස්තුතිය පුද කිරීමටද මෙය අවස්ථාවක් ලෙස සලකමි. එමෙන්ම, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් සහ සියලුම කාර්ය මණ්ඩලයට 2012 වර්ෂය තුළ කොමිෂන් සභාවේ කාර්යයන් සාර්ථක කිරීම සඳහා ඔවුන්ගේ උත්සාහය සහ කැපවීම වෙනුවෙන් ස්තුතිය පුද කිරීමට මම කැමැත්තෙමි.



දමිත කුමාරසිංහ
අධ්‍යක්ෂ ජනරාල්

# 2012 සමාලෝචනය

එක් එක් වර්ෂයක් සඳහා සැළසුම්කරන ලද ව්‍යාපෘති පිළිබඳ විස්තර ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ ආයතනික සැලැසුමෙහි අන්තර්ගතය. සමාලෝචනයට ලක්වන වර්ෂය තුලදී, කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා විදුලි පනතින් සහ ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභා පනතින් කොමිෂන් සභාව වෙත පවරනු ලැබූ බලතල අනුව නියාමන ක්‍රියාවලිය ඉදිරියට ගෙනයාම සඳහා වැඩසටහන් මාලාවක් සකස් කරන ලදි.

කොමිෂන් සභාවේ ප්‍රධාන අරමුණක් වන පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා නව ක්‍රියාමාර්ග 2012 තුළදී ගන්නා ලදි. කොමිෂන් සභාව විසින් අඛණ්ඩව දැනුවත් කිරීමේ වැඩසටහන් සහ විදුලිබල පාරිභෝගිකයන්ගේ අයිතිවාසිකම් සහ වගකීම් අවධාරණය කෙරෙන දැනුවත් කිරීම් පත්‍රිකා සකස් කිරීම හා බෙදාහැරීම සිදුකරන ලදි. මහජන උපයෝගීතා කොමිෂන් සභාව විසින් සමාලෝචනය කරන වර්ෂය තුළ වයඹ, බස්නාහිර, දකුණු, සබරගමුව, ඌව, මධ්‍යම, නැගෙනහිර සහ උතුරු පළාත්වල පාරිභෝගිකයින් දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ 21ක් පවත්වන ලදි.

කොමිෂන් සභාව විසින් විදුලි පාරිභෝගිකයන් සඳහා අතිරේක සේවාවන් සහිත නව වෙබ් අඩවියක් හඳුන්වා දෙන ලදි. මෙම නව වෙබ් අඩවිය තුළින් අන්තර්ජාලය හරහා ඔවුන්ගේ පැමිණිලි ඉදිරිපත් කිරීමට පහසුකම් ලබාදේ. (පාරිභෝගික ආරාවුල් විසඳීමේ ක්‍රමය). මෙම ක්‍රමය කොමිෂන් සභාව සහ තමන්ගේ දුක්ගැනවිලි ඉදිරිපත් කිරීමට කැමති පැමිණිලිකරු අතර අතුරු මුහුණතක් වශයෙන් ක්‍රියා කරයි. එමෙන්ම, එම ක්‍රමය විසින් ප්‍රගති සමාලෝචනයට පහසුකම් සපයන අතර ඔවුන්ගේ විශේෂිත ආරාවුල් පිළිබඳ කොමිෂන් සභාව සමඟ සන්නිවේදනය පවත්වාගෙන යයි. රජයේ ප්‍රතිපත්තින්ට අනුකූලව රාජ්‍ය භාෂා තුනෙන්ම පාරිභෝගික පැමිණිලි ඉදිරිපත් කිරීමට ඉඩ සලසයි. සෑම පැමිණිල්ලකටම යොමු අංකයක් ලබාදෙන අතර ඉන්පසුව නියමිත පියවරයන් අනුගමනය කෙරේ. මෙම පද්ධතිය හරහා පාරිභෝගික ආරාවුල් සහ පැමිණිලි වඩා කාර්යක්ෂමව විසඳීම සඳහා පහසුකම් ලබාදේ යැයි අපේක්ෂා කෙරේ.

කොමිෂන් සභාව විසින් බලපත්‍රලාභීන් (විදුලි සේවා සපයන්නන්) විසින් සපයන සේවාවන් පිළිබඳ පාරිභෝගික තෘප්තිය අගය කිරීම සඳහා නියැදි සමීක්ෂණයක් දියත් කරන ලදි. මෙම සමීක්ෂණයේ අරමුණ වන්නේ විදුලි සැපයුම් සේවාවන් සහ පාරිභෝගිකයන් සඳහා බලශක්තිය කාර්යක්ෂමව වැඩිදියුණු කිරීමේ ක්ෂේත්‍රයන් හඳුනා ගැනීමයි. මෙම සමීක්ෂණයෙන් බලශක්තිය කාර්යක්ෂමව භාවිතා කිරීම සහ බලශක්ති සංරක්ෂණය පිළිබද තොරතුරු රැස්කිරීමද අරමුණු කරන ලදි.

අධ්‍යයනයේ පළමු අදියර තුළ තෝරාගත් පාරිභෝගිකයන් අතර නියාමන සමීක්ෂණයක් සහ දළ ප්‍රශ්නාවලියක් බෙදාහරින ලද අතර සමීක්ෂණයේ ක්ෂේත්‍ර කාර්යයන් 2012 දෙසැම්බර් මුල ආරම්භ කරන ලදි. ගෘහස්ථ සහ කර්මාන්ත කාණ්ඩයන් යටතට වැටුණු දිවයිනේ සෑම කොටසක් තුළම විසිරුණු පාරිභෝගිකයින් 2500කගෙන් දත්ත ලබාගැනීමට, බෙදාහැරීමේ බලපත්‍රලාභීන් වන ලංකා විදුලිබල මණ්ඩලය (CEB) සහ ලංකා විදුලි පුද්ගලික සමාගම (LECO) යන බලපත්‍රලාභි සමාගම් වල පාරිභෝගිකයන්ට මෙම සමීක්ෂණය සඳහා තොරතුරු ලබාදෙන මෙන් ඉල්ලා සිටින ලදි. මෙම සමීක්ෂණයෙහි සොයාගැනීම් 2013 අප්‍රේල් වනවිට නිකුත් කිරීමට අපේක්ෂා කරමු.

පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතීවලින් සපයනු ලබන විදුලිය 100%ක් විදුලිබලය යෙදීමේ රජයේ පරමාර්ථය මුදුන්පත් කර ගැනීමේදී සුවිශේෂී දායකත්වයක් ලබා දේ. ජාතික පද්ධතිය පුළුල් කිරීමත් සමගම මෙම ජාතික පද්ධතියෙන් බාහිර ව්‍යාපෘති බොහෝමයකට ඔවුන්ගේ පාරිභෝගිකයන් අහිමි වූ අතර එය මූල්‍ය දුෂ්කරතාවයන්ට සහ අඛණ්ඩ පදනමක් මත කරගෙන යාමට නොහැකිවන තත්ත්වයකට මග පාදන ලදි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, එවැනි ව්‍යාපෘතිවල ආයෝජන කළ ගම්වැසියන්ට ඔවුන්ගේ මූලික ආයෝජනය අහිමි විය. මෙම තත්ත්වය සැලකිල්ලට ගැනීමෙන්, කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකාව තුළ ජාතික පද්ධතියෙන් පරිබාහිර අංශයේ සංවර්ධනය වෙනුවෙන් කළහැකි විකල්පයන් සොයා බැලීම සඳහා අධ්‍යයනයක් ආරම්භ කරන ලදි. සමාලෝචනය යටතේ පවතින වර්ෂය තුළදී, අධ්‍යයනයේ ප්‍රතිඵලය කෙටුම්පත් වාර්තාවක් ලෙස සකස් කළ අතර ජාතික පද්ධතියෙන් පරිබාහිර අංශය තුළ යෙදී සිටින සම්පත් දායකයන්ගේ අදහස් සමඟ මෙම කෙටුම්පත් වාර්තාව වැඩි දියුණු කිරීමට කොමිෂන් සභාව බලාපොරොත්තු වේ.

ලිහිසි තෙල් කර්මාන්තය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා ලිහිසි තෙල් කර්මාන්තය පිළිබඳව වැදගත් වැඩමුළුවක් කොමිෂන් සභාව විසින් සංවිධානය කළ අතර ඛණිජ තෙල් කර්මාන්ත අමාත්‍යංශයේ සහයෝගයෙන් එය 2012 සැප්තැම්බර් මාසයේදී පවත්වන ලදි. පුද්ගලික සහ රාජ්‍ය අංශය නියෝජනය කරමින් 100ට වැඩි පිරිසක් මෙම අවස්ථාවට සහභාගී වූ අතර එහිදී ලිහිසි තෙල් පිළිබඳව පත්‍රිකාවන්ද බෙදාහරින ලදි. වැඩසටහන මගින් ප්‍රතිපත්ති අරමුණුකරගත් ශාස්ත්‍රයන් සහ මාධ්‍ය පිළිබඳව ඵලදායි සාකච්ඡාවක් නිර්මාණය කිරීමට දායක විය.

# විදුලිබල අංශය

## පාරිභෝගික ආරක්ෂාව

කොමිෂන් සභාව එහි පාරිභෝගිකයින් ආරක්ෂා කිරීමේ භූමිකාව තුළ ඔවුන්ගේ දුක්ගැනවිලි විසඳීමේදී විදුලි පාරිභෝගිකයන්ට උපදෙස් සහ සහයෝගය ලබා දෙන අතර පාරිභෝගික ආරක්ෂාව සහතික කිරීම සඳහා පාරිභෝගික අයිතිවාසිකම් පිළිබඳව දැනුම වර්ධනය කිරීමේද යෙදී සිටී. මෙම තත්ත්වය තුළ, කොමිෂන් සභාව විසින් පාරිභෝගිකයන් සහ බලපත්‍රලාභී බෙදාහරින්නන් අතර ආරාවුල් විසඳීමේ ක්‍රියාවලියට පහසුකම් සපයයි. පාරිභෝගික කටයුතු පිළිබඳ කොමිෂන් සභාවට උපදෙස් ලබාදෙන ස්වාධීන පාරිභෝගික උපදේශක කමිටුව ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ පාරිභෝගික කටයුතු අංශය මඟින් සම්බන්ධීකරණය කරනු ලබයි. 2012 වර්ෂය තුළදී, කොමිෂන් සභාව පාරිභෝගික ආරක්ෂාව සම්බන්ධයෙන් පහත සඳහන් කාර්යයන් සහ මුල්පිරීම් සිදුකර ඇත.

## පාරිභෝගික තෘප්තිය පිළිබඳ සමීක්ෂණය

2012දී, කොමිෂන් සභාව විසින් විසිරී පවතින විදුලි පාරිභෝගිකයන්ගේ තෘප්තිය ඇගයීම සඳහා සමීක්ෂණයක් දිවයින පුරා ආරම්භ කරන ලදී. මෙම සමීක්ෂණයේ පරමාර්ථය වූයේ විදුලි සැපයුම් සේවාවන් තුළ සහ පාරිභෝගිකයන් අතර බලශක්ති කාර්යක්ෂමතාවය පිළිබඳ සංවර්ධනය කළයුතු ක්ෂේත්‍රයන් හඳුනා ගැනීමයි. කොමිෂන් සභාව විසින් සමීක්ෂණය කරගෙන යාම සඳහා බාහිර උපදේශකවරුන්ගේ සේවය ලබාගන්නා ලදී. සමීක්ෂණය 2012 දෙසැම්බර් මුල ආරම්භ කරන ලදි. සමීක්ෂණය සඳහා සියලුම බලපත්‍ර ප්‍රදේශයන් සහ භූගෝලීය සහ විවිධ ප්‍රජාවන් ආවරණය කරමින් සියලුම වර්ගයේ පාරිභෝගිකයන් (එනම් ගෘහස්ථ, ආගමික, පොදු අරමුණු, කර්මාන්ත, ආපන ශාලා යනාදී වශයෙන්) නියෝජනය කරමින් 2,400ක නියැදියක් තෝරා ගන්නා ලදි. සමීක්ෂණයේ ප්‍රතිඵල 2013 වැද වනවිට ප්‍රකාශයට පත් කිරීමට අපේක්ෂා කෙරේ.

## විදුලි බිල සඳහා නව ආකෘතියක් ක්‍රියාත්මක කිරීම

දිවයින පුරා සිදුකළ සමීක්ෂණයේ සොයාගැනීම් සහ ලංකා විදුලිබල මණ්ඩලයේ සහ ලංකා විදුලි පෞද්ගලික සමාගමේ යෝජනාද මත පදනම්ව, පහත තොරතුරු ඇතුළත් කරමින් විදුලි බිල සඳහා නව ආකෘතියක් හඳුන්වාදීමට 2012දී මූලික පියවරගනු ලැබූහ.

ගෘහස්ථ පාරිභෝගිකයින් සඳහා බිල්පත සැකසෙන්නේ  කෙසේද යන්න පිළිබඳ විස්තර (භාවිතා කරන ලද ඒකක පිළිබඳව වෙනස් කාණ්ඩයන් (කොටස්) සඳහා ගාස්තු)

- විදුලිබලය උත්පාදනය, සම්ප්‍රේෂණය සහ බෙදා හැරීමේ පිරිවැය වෙනවෙනම දැක්වීය යුතුවීම
- විදුලිය සැපයීම වෙනුවෙන් රජය විසින් සපයන දිරි දීමනාවන්
- බදු සහ අනෙකුත් ගාස්තු

කොමිෂන් සභාව විසින් පාරිභෝගිකයන්ට අවශ්‍යවන තොරතුරු ඇතුළත් කරමින් මෙම නව විදුලි බිල් ආකෘතිය හඳුන්වා දීමට පියවර ගන්නා මෙන් ලංකා විදුලිබල මණ්ඩලයට සහ ලංකා විදුලි පෞද්ගලික සමාගමට දන්වන ලදි.

## පාරිභෝගික අධ්‍යාපනය සහ බල ගැන්වීම

කොමිෂන් සභාව විසින් අඛණ්ඩව පාරිභෝගිකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වමින් සිටී. 2012 වර්ෂය තුළදී, පහත සඳහන් ක්‍රියා මාර්ග පාරිභෝගික අධ්‍යාපනය සහ බලගැන්වීම සම්බන්ධයෙන් සිදු කරන ලදි.

## කොමිෂන් සභාවේ නියාමන මැදිහත්වීම් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්

2012දී, කොමිෂන් සභාව රටතුළ සියලුම පළාත්වල පාරිභෝගිකයින් සහ පාර්ශ්වකරුවන් සඳහා සහභාගිත්ව දැනුවත් කිරීමේ වැඩසටහන් 21ක් සංවිධානය කරන ලදි. මෙවැනි වැඩසටහන් තුළින්, 2009 අංක 20 දරණ ශ්‍රී ලංකා විදුලිබල පනතින් හඳුන්වා දුන් නියාමන නීතිමය රාමුව සහ සහ එම පනතේ විධිවිධානයන්ට අනුකූලව වැඩි දියුණු කළ යුතු නියාමන උපකරණයන් පිළිබඳ පාරිභෝගික දැනුම වැඩි කිරීමට කොමිෂන් සභාවට හැකි විය. විශ්වාසදායී සහ ආරක්ෂිත විදුලිබල සැපයුමක් ලබාගැනීම සඳහා පාරිභෝගිකයාගේ අයිතිවාසිකම්, නව සම්බන්ධතාවයක් ලබා ගන්නා අවස්ථාවේදී පාරිභෝගිකයන්ගේ අයිතිවාසිකම්, සේවා සපයන්නා සමඟ පවත්නා ගිවිසුම නතර කිරීම සහ අවසන් කිරීම, සැපයුම නැවත ලබාගැනීම, බලපත්‍රලාභියා විසින් පැමිණිලි විසඳීම, මනු කියවීමේ ක්‍රියාපටිපාටි, සේවා ගාස්තු, අයකුම සහ බිල්පත් ගෙවීමේ ක්‍රියා පටිපාටීන් මෙන්ම විදුලි පාරිභෝගිකයන්ගේ වගකීම් පිළිබඳ පාරිභෝගික දැනුම වර්ධනය කිරීමට කොමිෂන් සභාව බලාපොරොත්තු වේ.

# දැනුවත් කිරීමේ අත් පත්‍රිකා

### කොමිෂන් සභාවේ නියාමන භූමිකාව සහ කාර්යයන් පිළිබඳ පත්‍රිකාවන්

කොමිෂන් සභාවේ භූමිකාව සහ එහි සේවාවන් සහ කාර්යයන් පිළිබඳ පොදු කරුණු පාරිභෝගිකයන්ට සහ අදාළ පාර්ශ්වකරුවන්ට ලබාදීමේ අරමුණින් මෙම පත්‍රිකා සකස් කරන ලදි.

### විදුලි පාරිභෝගික පැමිණිලි මෙහෙයවීමේ ක්‍රියාපටිපාටිය පිළිබඳ පත්‍රිකා

විවිධ පැමිණිලි සහ ඒවා විසඳීමේදී බලපත්‍රලාභීන් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ දැනුවත්කිරීම ඇති කිරීමේ අරමුණින් මෙම පත්‍රිකා සකස් කරන ලදි. එයට අමතරව, එවැනි ගැටලුවලට පහසුකම් සැපයීමේදී කොමිෂන් සභාවේ භූමිකාව පිළිබඳ තොරතුරු මෙම පත්‍රිකාවලට ඇතුළත් විය.

ඉහත අත් පත්‍රිකා භාෂා 3න්ම මුද්‍රණය කරන ලද අතර 2012 වර්ෂයේ කොමිෂන් සභාව විසින් පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන්වලදී බෙදාහරින ලදි. එමෙන්ම එම පත්‍රිකාවන් පොදු මහජනතාවගේ ප්‍රයෝජනය සඳහා කොමිෂන් සභාවේ කාර්යාලයේදී ලබාගැනීමට පහසුකම් සලසා තිබිණි.

## පාරිභෝගික අයිතිවාසිකම් සහ වගකීම් ප්‍රකාශය

2009 අංක 20 දරණ ශ්‍රී ලංකා විදුලිබල පනතේ 3 (1) (ඉ) වගන්තියට අනුකූලව සහ විදුලි පාරිභෝගිකයන්ගේ අයිතිවාසිකම් සහ වගකීම් පිළිබඳ දැනුවත්භාවය වැඩි කිරීමේ අරමුණින්, ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව, 2013දී, පාරිභෝගික අයිතිවාසිකම් සහ වගකීම් පිළිබඳ විධිමත් ප්‍රකාශනය එළිදැක්වීමට පියවර ගෙන ඇත. 2012, ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව විසින් එහි මාර්ගෝපදේශකත්වය යටතේ විදුලිබලය බෙදාහැරීමේ බලපත්‍රලාභීන් විසින් සකස් කරමින් පවතින, සැපයුම් සේවා කේතය ක්‍රියාවට නැගීම මත විධිමත් කරනු ලබන, අයිතිවාසිකම් සහ වගකීම් පිළිබඳ ප්‍රකාශනයේ කෙටුම්පතට එකඟ විය. අයිතිවාසිකම් සහ වගකීම් පිළිබඳ ප්‍රකාශනයේ අවසන් කෙටුම්පත අවසන් කිරීමට පෙර මහජනතාවගෙන් ප්‍රතිචාරයන් ලබාගැනීම සහ මහජන උපදෙස් සඳහා ඉදිරිපත් කරනු ලැබේ. අවසන් ප්‍රකාශනය කොමිෂන් සභාවේ දැනට පවත්නා පාරිභෝගිකයින් දැනුවත් කිරීමේ වැඩසටහන්වලට විෂයවන කොටසක් ලෙස ඇතුළත් කරනු ලැබේ.

## පාරිභෝගික පැමිණිලි සඳහා පහසුකම් සපයන අන්තර්ජාල පද්ධතිය

2012දී, කොමිෂන් සභාව විසින් වෙබ් අඩවිය පදනම් කරගෙන පාරිභෝගික පැමිණිලි සඳහා පහසුකම් සපයන පද්ධතියක් හඳුන්වා දෙන ලදී. එම පද්ධතිය පැමිණිලිවල තත්ත්වය පිළිබඳ පරීක්ෂා කිරීමට සහ කොමිෂන් සභාව සමග සන්නිවේදනය පවත්වා ගැනීමට කොමිෂන් සභාව සහ පැමිණිලි ඉදිරිපත් කිරීමට කැමති පැමිණිලිකරුවන් අතර අතුරු මුහුණතක් වශයෙන් ක්‍රියා කරයි. එම පද්ධතිය රජයේ අවශ්‍යතාවයන්ට අනුකූලව සියලුම රාජ්‍ය භාෂා (සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි) වලින් ප්‍රවේශ වීමට පහසුකම් සපයයි. මෙම අතුරු මුහුණත තුළින්, පාරිභෝගිකයින්ට ඔවුන්ගේ පැමිණිලි තැපෑලෙන්, ඊමේල් තුළින් සහ පෞද්ගලිකව ඉදිරිපත් කිරීමට මෙන්ම කොමිෂන් සභාව වෙත ඔවුන්ගේ පැමිණිලි කෙලින්ම ඉදිරිපත් කළ හැකිය. පද්ධතිය තුළින් සිදුකරන සෑම ඉදිරිපත් කිරීමකටම යොමු අංකයක් සපයනු ලබන අතර පද්ධතිය විසින් ඉන්පසුව අනුගමනය කළ යුතු පියවරයන් පිළිබඳව පැමිණිලිකරුට උපදෙස් ලබා දේ. පද්ධතිය පාරිභෝගික පැමිණිලි වඩාත් කාර්යක්ෂමව විසඳීම සඳහා පහසුකම් ඇති කරයි.

## පාරිභෝගික පැමිණිලි කළමනාකරණය කිරීම

2012 වර්ෂය කාලසීමාව තුළ, කොමිෂන් සභාව වෙත පැමිණිලි 466ක ප්‍රමාණයක් ලැබුණු අතර කොමිෂන් සභාව විසින් එම පැමිණිලිවලින් 91%ක් සාර්ථකව විසඳන ලදු. කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ පැමිණිලිවලින් බහුතරය විදුලි සැපයුම සහ විසන්ධි කිරීම් කාණ්ඩයේ වූහ.

### 2012 වර්ෂය තුළ කොමිෂන් සභාවේ මැදිහත්වීමෙන් විසඳනු ලැබූ පාරිභෝගික පැමිණිලි

| කාණ්ඩ අංකය | පැමිණිලි වර්ගය | ලැබුණු | විසඳන ලද | ඉතිරි |
|---|---|---|---|---|
| 01 | විදුලි බිල්පත් සහ මනු | 73 | 71 | 02 |
| 02 | පාරිභෝගික කාණ්ඩය | 7 | 7 | 00 |
| 03 | රැහැන් මංපෙත් | 149 | 132 | 17 |
| 04 | නව සම්බන්ධතා | 88 | 81 | 07 |
| 05 | විසන්ධි කිරීම සහ නැවත සම්බන්ධ කිරීම් | 77 | 70 | 07 |
| 06 | වෙනත් | 72 | 64 | 08 |
| | මුළු ගණන | 466 | 425 | 41 |

## පාරිභෝගික පැමිණිලි කාණ්ඩ




## 2012 පැමිණිලි විසඳීම




### ආරාවුල් විසඳීමේ නියෝගය ක්‍රියාත්මක කිරීම

බලපත්‍රලාභියෙක් සහ පාරිභෝගිකයෙක්, වෙනත් බලපත්‍රලාභියෙක්, හෝ යම් වෙනත් පාර්ශ්වයක් අතර මතුවන්නාවූ ආරාවුල්, එම පාර්ශ්වයන්ට විසඳාගත නොහැකිනම්, කොමිෂන් සභාව විසින් විස්තර කරන ලද විදුලිබල නියෝග (ආරාවුල් විසඳීමේ ක්‍රියාපටිපාටි) යටතේ සහ 2011 මැයි 25 දින අති විශේෂ ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත්කරන ලද මැදිහත්වීම යටතේ විසඳීම සඳහා කොමිෂන් සභාව වෙත යොමු කරනු ලැබේ.

එසේවුවත්, මෙම ක්‍රියාපටිපාටිය ආරම්භ කිරීමට අවශ්‍ය විධිමත් ක්‍රියාපටිපාටීන් සහ ලිපි ලේඛනවල අප්‍රමාවත්භාවය නිසා ආරාවුලක් පවතින අවස්ථාවක කොමිෂන් සභාව විසින් මෙම ක්‍රියාපටිපාටිය යොදා ගැනීම සීමාකරයි. 2012දී, කොමිෂන් සභාව විසින් විදුලිබල (ආරාවුල් විසඳීමේ ක්‍රියාපටිපාටිය) නියෝග ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන සියලුම විධිමත් ලිපි ලේඛන සහ ක්‍රියා පටිපාටීන් වැඩි දියුණු කරන ලදී.

## ප්‍රාදේශීය පාරිභෝගික සංගම් පිහිටුවීම

පාරිභෝගිකයන් සහ නියාමන සහ ප්‍රතිපත්ති කාර්යයන්හි සහභාගිත්වය අතර කාර්යයන් බෙදාගැනීමට පහසුකම් ඇති කිරීම පිණිස, කොමිෂන් සභාව ප්‍රාදේශීය පාරිභෝගික සංගම් (RCS) පිහිටුවීමට තීරණය කරන ලදි.

මෙම සංගම්වල පරමාර්ථය නම්:

- විදුලි පාරිභෝගිකයන්ට සපයනු ලබන සේවාවන් ඇගැයීම සහ උසස් තත්ත්වයේ විදුලබලිය සැපයුම් සේවාවක් සහතික කිරීමේදී කොමිෂන් සභාවට සහාය වීම.
- අයිතිවාසිකම් සහ වගකීම් පිළිබඳ පාරිභෝගික දැනුම වැඩි කිරීම.
- ප්‍රාදේශිය විදුලි පාරිභෝගිකයින් විසින් මුහුණපානු ලබන ගැටලු පිළිබඳව සහ විදුලි පාරිභෝගිකයින් සමග සේවාවේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමේ මාර්ගයන් පිළිබඳව ඔවුන් විසින් සිදුකළ යෝජනාවන් සාකච්ඡා කිරීම සහ පාරිභෝගික උපදේශන කමිටුව (CCC) තුළින් කොමිෂන් සභාව දැනුවත් කිරීම.
- විදුලි අයකුමයන් සම්බන්ධ ප්‍රමිතීන් හඳුන්වාදීම, අයකුමයන් සංශෝධනය කිරීම සහ සේවාවේ ගුණාත්මකභාවය ඇතුළත්ව තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුළ පාරිභෝගිකයින්ට සෘජුවම බලපාන කරුණු පිළිබඳව කොමිෂන් සභාව දැනුවත් කිරීම.
- 2002 අංක 35 දරණ ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂම් සභා පනත ප්‍රකාරව, විදුලිබල අංශයේ නියාමනය සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ භූමිකාව පිළිබඳව දැනුම වර්ධනය කිරීම
- විදුලි කණු සිටුවීම සහ කම්බි එලීම සම්බන්ධයෙන් අවශ්‍යවන රැහැන් මංපෙත් අවසරය ලබාගැනීම/ ප්‍රදානය කිරීම සඳහා විධිමත් ක්‍රියාපටිපාටීන් පිළිබඳ ඉඩම් හිමියන් සහ පොදු ජනතාව අතර දැනුවත්භාවය ඇතිකිරීම.
- පාරිභෝගික සමීක්ෂණ ඇතුළත්ව, ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව විසින් ක්‍රියාවට නගන අනෙකුත් කාර්යයන්හිදී අවශ්‍යවන සහයෝගය ලබාදීම.

එමෙන්ම, පොදු මහජනතාවට විශාල වශයෙන් බලපාන කරුණු පිළිබඳව තීරණය කිරීම සඳහා පැවති මහජන තොරතුරු විමසන අතරතුරේදී පාරිභෝගික/ මහජන අදහස් ලබාගැනීමට යාන්ත්‍රණයක් ලෙස මෙම සංගම් කටයුතු කරනු ඇතැයි කොමිෂන් සභාව බලාපොරොත්තු වේ.

2012දී මෙන්, ඌව සහ බස්නාහිර හැර සියලුම පළාත් තුළ, පළාතකට ප්‍රාදේශීය පාරිභෝගික සංගම් පහක් (5) අඩංගු වන සේ මෙම සංගම් තිස් පහක් (35) පිහිටුවන ලදී. 2012දී, මෙවැනි සංගම් විස්සක් (20) දකුණු, උතුරු, උතුරු මැද සහ නැගෙනහිර පළාත්වල පිහිටුවන ලදී. මේ සම්බන්ධයෙන්, දිස්ත්‍රික් ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන්, ග්‍රාම නිලධාරීන් සහ මෙම සංගම්වල සාමාජිකයන්ගේ සහභාගිත්වය සහිතව ආරම්භක රැස්වීම් හතරක් (4) 2012 වර්ෂයේදී පවත්වන ලදී. කොමිෂන් සභාව, එහි කාර්යයභාරය (විශේෂයෙන් විදුලි අයකුමයන් සකස් කිරීම තුළ), පාරිභෝගික උපදේශක කමිටුවේ කාර්යයභාරය, ප්‍රාදේශිය පාරිභෝගික සංගම් පිහිටුවීමේ අරමුණ සහ එවැනි සංගම්වල සාමාජිකයන්ගේ කාර්යයභාරය පිළිබඳව සහභාගිවූවන් දැනුවත් කරන ලදි.

## පාරිභෝගික උපදේශන කමිටුව (CCC)

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිසම් පනතේ 29 වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් නිර්මාණය කරන ලද පාරිභෝගික උපදේශක කමිටුව (CCC) නියාමන කර්මාන්තයේ දැනට සිටින සහ අනාගත කුඩා පාරිභෝගිකයන්ගේ අයිතිවාසිකම් නියෝජනය කරන අතර රජයට, සේවා සපයන්නන්ට සහ තොග පාරිභෝගිකයන්ට අදහස් උදහස් ලබාගැනීමේදී අතරමැදියෙකු ලෙස ක්‍රියා කරයි.

දැනට මෙම කමිටුව පුළුල් පරාශයක පාරිභෝගික අයිතිවාසිකම් නියෝජනය කිරීමට තොරා ගනු ලබන කමිටු සාමාජිකයන් 15 දෙනෙකුගෙන් සමන්විත වේ. මෙම සාමාජිකයන් කර්මාන්තයට සම්බන්ධ විවිධ ගැටලු සාකච්ඡා කිරීම සඳහා ස්වේච්ඡා පදනමක් මත නිතිපතා රැස්වීම්වලදී සහභාගි වේ.

## වර්තමාන සාමාජිකත්වය

පාරිභෝගික උපදේශන කමිටුවක වර්තමාන සාමාජිකත්වය පළාත් 9න් සාමාජිකයන් 15දෙනෙකුගෙන් සමන්විතය.

- ඛණිජතෙල් කර්මාන්තය නියෝජනය කිරීමට නම් කරන ලද තැනැත්තෙක්
- ජල කර්මාන්තය නියෝජනය කිරීමට නම් කරන ලද තැනැත්තෙක්
- විදුලිබල කර්මාන්තය නියෝජනය කිරීමට නම් කරන ලද තැනැත්තෙක්
- ජාතික වාණිජ මණ්ඩලයෙන් නම් කරන ලද තැනැත්තෙක්
- ලංකා වාණිජ මණ්ඩලයෙන් නම් කරන ලද තැනැත්තෙක්
- වාණිජ මණ්ඩල සම්මේලනයෙන් නම් කරන ලද තැනැත්තෙක්

2012 පසු භාගය තුළදී, පාරිභෝගික උපදේශක කමිටුවේ තනතුරු තුනක් ඇබෑර්තු වූ අතර එම තනතුරු සඳහා සුදුසු අයදුම්කරුවන් තෝරා ගැනීමට සම්මුඛ පරීක්ෂණ පවත්වන ලදි. එම ඇබෑර්තු 2013 ප්‍රථම භාගය තුළදී පිරවීමට අපේක්ෂා කෙරේ.
පාරිභෝගික උපදේශක කමිටුවක කාර්යයන්

ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂම් සභා පනතේ 29(3) වගන්තියේ විස්තර කර ඇති පරිදි පාරිභෝගික උපදේශක කමිටුවක කාර්යයන් වන්නේ,

- සුදුසු පාරිභෝගික සේවා ප්‍රමිතීන් පිළිබඳව ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවට උපදෙස් ලබාදීම
- මහජන උපයෝගීතා කර්මාන්ත විසින් සපයනු ලබන භාණ්ඩ සහ සේවාවන් පිළිබඳව පාරිභෝගික අවශ්‍යතාවයන් සෑහීමට පත්කරනු ලබන්නේද යන්න නියාමනය කිරීම
- විස්තර කරන ලද හෝ තීරණය කරන ලද ප්‍රමිතීන් පිළිබඳ දැනුවත්භාවය සහ එම ප්‍රමිතීන් සම්බන්ධ පාරිභෝගික අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම

## 2012 වර්ෂය තුළ පාරිභෝගික උපදේශන කමිටුවේ දායකත්වය

2012 නොවැම්බර් මාසය තුළ, පාරිභෝගික උපදේශන කමිටුව ආරක්ෂාව, ගුණාත්මකභාවය සහ අඛණ්ඩතාවය පිළිබඳ රෙගුලාසීන් සහ කාර්යය සාධන (බෙදාහැරීම) පිළිබඳ රෙගුලාසීන් සහ සාම්ප්‍රදායික නොවන පුනර්ජනීනය බලශක්ති අයකුමයන් නිවේදනය මත මහජන අදහස් උදහස් විමසීමට පෙර කොමිෂන් සභාවට උපදෙස් ලබාදීමේදී ක්‍රියාකාරීව සහභාගිවූහ.

## මහජන උපදේශනය (නියාමන ක්‍රියාවලිය තුළ මහජන සහභාගිත්වය)

මහජන උපදේශන හරහා නියාමන තීරණ ගැනීමට පෙර අපගේ යෝජනාවන් පිළිබඳව අදහස් දැක්වීමට සහ ප්‍රතිචාර දැක්වීමට ඉඩ ලබාදේ. 2012 වර්ෂය තුළ, පහත සඳහන් උපදෙස් ලබාගැනීම් සම්පූර්ණ කරන ලදි.

### 2012 - 2013 සඳහා සාම්ප්‍රදායික නොවන පුනර්ජනීනය බලශක්ති මිලදී ගැනීමේ අයකුමයන් පිළිබඳව මහජන උපදේශන

2012 සහ 2013 වර්ෂය සඳහා ලංකා විදුලිබල මණ්ඩලය විසින් අලුතින් ඉදිකළ සාම්ප්‍රදායික නොවන පුනර්ජනීනය බලශක්ති උත්පාදන පහසුකම්වලින් විදුලිය මිලදී ගැනීම සඳහාවන යෝජිත මිලගණන් ලංකා විදුලිබල මණ්ඩලය විසින් අනුමැතිය සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලදි. යෝජිත මිල ගණන් පිළිබඳ තීරණයක් ගැනීමට පෙර, ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව විසින් 2012 අගෝස්තු මාසයේදී සඳහා පාර්ශවකරුවන්ගෙන් උපදෙස් ලබාගැනීමක් (මහජන උපදේශනයක්) සිදුකරන ලදි. උපදෙස් ලබාගැනීමේ ක්‍රියාවලියේදී ලිඛිත සහ වාචික ඉදිරිපත්කිරීම් රැස්කරන ලදි. කොමිෂන් සභාව විසින් මිලදී ගැනීමේ අයකුමය 2012 ඔක්තෝබර් මාසයේදී ප්‍රකාශයට පත්කරන ලදි. මෙම අයකුමය 2012 සහ 2013 තුළ සම්මත බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම් මත පදනම් වූ පුනර්ජනීනය බලශක්ති සඳහා යොදා ගත හැකිවේ.

### විදුලිබල ආරක්ෂාව, තත්ත්වය සහ අඛණ්ඩතාවය පිළිබඳ යෝජිත රෙගුලාසි කෙරෙහි උපදෙස් ලබාගැනීම

2012 වර්ෂය තුළ, විදුලිබල ආරක්ෂාව, තත්ත්වය සහ අඛණ්ඩතාවය පිළිබඳව කොමිෂන් සභාව විසින් සකස් කරන ලද රෙගුලාසි කෙටුම්පත 2012 ඔක්තෝබර් මාසය තුළ ජාතික පුවත්පත්වල ප්‍රකාශයට පත්කළ දැන්වීමක් මගින් මහජන උපදෙස් ලබාගැනීම සඳහා ඉදිරිපත් කරන ලදි. එම දැන්වීම අනුව, පාර්ශවකරුවන් සහ පොදු මහජනතාවගෙන් එක් මාසයක කාලපරිච්ඡේදයක් තුළදී ඊ මේල් සහ ලිඛිත ලිපි වුවමාරුව තුළින් අදහස් හා යෝජනා ලබාගන්නා ලදි. ලැබුණු අදහස් සහ ප්‍රතිචාර කොමිෂන් සභාවට සහ ඉන්පසු 2013දී අමාත්‍යංශයට ඉදිරිපත් කරනු ලබන අවසාන රෙගුලාසිවලට ඇතුළත් කර ඇත.

## රජයට ප්‍රතිපත්ති උපදෙස්

### ජාතික පද්ධතියෙන් පරිබාහිර විදුලියබල පහසුකම් සම්බන්ධ යෝජනාව පිළිබඳ රජයට ප්‍රතිපත්ති උපදෙස්

2012 දී, ජාතික පද්ධතියෙන් බැහැරව ක්‍රියාත්මක විදුලිබල සේවා පිළිබඳ සමීක්ෂණයක් සහ අධ්‍යයනයක් යන තේමාව යටතේ කොමිෂන් සභාව විසින් පවත්වන ලද අධ්‍යයනයක ප්‍රතිඵල මත පදනම්ව, කොමිෂන් සභාවේ බලපත්‍ර අංශය විසින් ශ්‍රී ලංකාව තුළ පද්ධතියෙන් පරිබාහිරව පවත්නා විදුලිබලය යෙදවීමේ විෂයය මත රජයට උචිත නිර්දේශයන් සකස්කිරීම ආරම්භ කරන ලදි. අධ්‍යයනයෙන් ලබාගත් සොයාගැනීම් පද්ධතියෙන් පරිබාහිර කුඩා ජල විදුලි ව්‍යාපෘතීන් සඳහා ප්‍රාදේශිය වැඩමුළු ඇතුළත් ව්‍යාපෘතිය 2013 දී ක්‍රියාවට නැගීම අපේක්ෂිතය.

### බලපත්‍ර ලබාදීම

ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව විසින් එහි බලපත්‍ර ලබාදීමේ කාර්යයේදී ඇගැයීම, තෝරාගැනීම (විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා සමග එකගතාවයෙන්) සහ පුද්ගලික බලශක්ති නිෂ්පාදකයින්ට විදුලිබලය උත්පාදනය කිරීමේ බලපත්‍ර ලබාදීමට බලය පැවරී ඇත. එමෙන්ම, මෙම හැකියාව තුළ, ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව බලපත්‍රලාභීන්ගේ (වර්තමානයේ ලංකා විදුලිබල මණ්ඩලය සහ ලංකා විදුලි පුද්ගලික සමාගම) බෙදාහැරීමේ කාර්යයන් නිතිපතා නියාමනය කරන අතර මෙම බලපත්‍රලාභීන්ගේ උත්පාදන හා බෙදාහැරීම්පිරිවැය පිළිබඳ තොරතුරු එක්රැස් කර අධ්‍යයනය කරනු ලැබේ.

### විදුලිබලය උත්පාදනය කිරීමේ බලපත්‍ර ලබාදීම

2009 අංක 20 දරණ ශ්‍රී ලංකා විදුලිබල පනතට අනුව, විදුලිබලය උත්පාදනය කිරීමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීමට හෝ මෙහෙයවීමට කැමති යම් පාර්ශ්වයක් විසින් ඒ සඳහා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය වේ. රට තුළ නිෂ්පාදනය කරන විදුලිබලයේ ආරක්ෂාව, තත්ත්වය සහ කාර්යක්ෂමතාවය සහතික කිරීම සඳහාවන හේතූන් විසින් මෙය අවශ්‍ය බවට පත්කරන අතර විදුලි උත්පාදන කර්මාන්තය තුළ අවශ්‍යවන ප්‍රමිතීන් නියාමනය කිරීමටද අවශ්‍ය වේ. ඒ අනුව, ශ්‍රී ලංකාව තුළ දැනට විදුලිය උත්පාදනය කරන සියලුම පාර්ශ්වයන්ට උත්පාදන බලපත්‍රයක් කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබයි.

අද දක්වා, ලංකා විදුලිබල මණ්ඩලයට විශාලතම උත්පාදන බලපත්‍රය සතු වේ. 2012දී, උත්පාදන බලපත්‍ර 58ක් ප්‍රධාන වශයෙන් කෘෂිකාර්මික සහ කර්මාන්ත අපද්‍රව්‍ය, ජෛව ස්කන්ධ, සූර්ය බලය, කුඩා ජල විදුලි බලාගාර සහ සුළං බලය යන කාණ්ඩයන්ගෙන් සමන්විත වන සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති අංශයේ කුඩා විදුලිය නිපදවන්නන්ට නිකුත් කරන ලදි.

| තාක්ෂණය | නිකුත් කරන ලද උත්පාදන බලපත්‍ර සංඛ්‍යාව |
|---|---|
| කෘෂිකාර්මික සහ කර්මාන්ත අපද්‍රව්‍ය | 1 |
| ජෛව ස්කන්ධ | 9 |
| සූර්ය බලය | 1 |
| සුළං බලය | 4 |
| ජල විදුලිය | 42 |

කාර්යසාධනය

# 2012 දී නිකුත් කරන ලද උත්පාදන බලපත්‍ර සංඛ්‍යාව




## බලපත්‍රවලින් නිදහස් කිරීම

2009 අංක 20 දරණ ශ්‍රී ලංකා විදුලිබල පනත අනුව, කොමිෂන් සභාවට ඇතැම් පුද්ගලයින් හෝ පුද්ගල කාණ්ඩයන් විදුලිබලය උත්පාදනය කිරීමට සහ බෙදා හැරීමට බලපත්‍රයක් ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කළ හැකිය. මෙය ප්‍රදානය කරනු ලබන්නේ එවැනි පුද්ගලයෙක් හෝ පුද්ගල කාණ්ඩයක් විසින් උත්පාදනය කරනු ලැබිය හැකි බෙදාහැරිය හැකි ප්‍රමාණය සහ ආකාරය සැලකිල්ලට ගැනීමෙනි.

කොමිෂන් සභාව මගින් නිදහස් කිරීමක් ප්‍රදානය කිරීමෙන් අනතුරුව, ගැසට් නිවේදනයක් ජාතික පුවත්පත්වල ප්‍රසිද්ධ දැන්වීමක් සහිතව ප්‍රකාශයට පත් කරනු ලබන අතර එම දැන්වීම් විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය ඇතුළුව අදාළ පාර්ශ්වයන් වෙත යවනු ලැබේ.

නිදහස් කිරීමක් ප්‍රදානය කිරීමෙන් අනතුරුව, කොමිෂන් සභාවේ අනුමැතිය අපේක්ෂාවෙන්, යෝජිත මිල ගණන් අනුපාතය සමග එකගවීමට බෙදාහරින්නාගෙන් ඉල්ලා සිටිනු ලැබේ. බෙදාහැරීමේ බලපත්‍රලාභීන්ගෙන් විදුලිය මිලදී ගන්නා කුඩා බෙදාහරින්නන් (සභාධිපත්‍යන්, නේවාසික ගොඩනැගිලි, සාප්පු සංකීර්ණයන් යනාදි) ඉන් පසුව ඒවා කුලී නිවැසියන්ට බෙදාහරින පුද්ගලයන් නියමානුකූලව එවැනි බලපත්‍ර ප්‍රදානය කරනු ලබන පුද්ගල කාණ්ඩයන් වේ.

2012 වර්ෂය තුළදී, කොමිෂන් සභාව විසින් එවැනි බලපත්‍ර 12ක් කුඩා බෙදාහරින්නන් වෙත ප්‍රදානය කරන ලදි.

## බලපත්‍රලාභි තොරතුරු ඉදිරිපත් කිරීමේ පද්ධතිය (LISS) සහ මාසික කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS)

විදුලබල කර්මාන්තය නියාමනය කිරීම පිණිස, කොමිෂන් සභාවට ඔවුන්ගේ මෙහෙයුම් සම්බන්ධව සම්ප්‍රේෂණය, බෙදාහැරීම සහ උත්පාදනය පිළිබඳ විධිමත් සහ පිළිගත් තොරතුරු යාවත්කාලීන කිරීම් අවශ්‍ය වේ. එමනිසා, පද්ධතියක් වැඩි දියුණු කරන ලද අතර තොරතුරු රැස්කිරීමේ ආකෘති පත්‍රය භාවිතා කරමින් වෙබ් අඩවිය පදනම් පද්ධතියක් මගින් දැනට දත්ත එක්රැස්කරමින් සිටී. මේ සම්බන්ධයෙන් භාවිතා කරන පද්ධතිය ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ බලපත්‍රලාභි තොරතුරු ඉදිරිපත් කිරීමේ පද්ධතිය(LISS) වශයෙන් නම් කෙරේ. එම පද්ධතිය තුළින් ලැබෙන දත්ත සත්‍යදැයි පරීක්ෂා කරනු ලබන අතර නියාමන අරමුණ වෙනුවෙන් කලින් කලට විවිධ වාර්තාවන් සකස් කරනු ලබයි. කොමිෂන් සභාවේ බලපත්‍රලාභි තොරතුරු ඉදිරිපත් කිරීමේ පද්ධතිය 2011 මාර්තු මාසයේ සිට ක්‍රියාකාරීව පවතී. කොමිෂන් සභාව විසින් නියම වශයෙන් සඳහන් කරන ලද තොරතුරු දෛනිකව සහ මාසිකව බලපත්‍රලාභීන් විසින් ඉදිරිපත්කරනු කරයි. බලශක්ති මිලදී ගැනීම සහ අලෙවිකිරීම් පිළිබඳ තොරතුරුද රැස්කරනු ලබයි. විදුලි පාරිභෝගිකයින් අවසාන භාවිතකරන්නා වෙත බලශක්ති අලෙවිකිරීම් පිළිබඳ තොරතුරුද බෙදාහැරීමේ බලපත්‍රලාභීන්ගෙන් එක්රැස් කරනු ලැබේ.

2012දී, මාසික කළමනාකරණ තොරතුරු පද්ධති වාර්තා උත්පාදන පහසුකම හඳුන්වා දීමත් සමගම බලපත්‍රලාභි තොරතුරු ඉදිරිපත් කිරීමේ පද්ධතියට තවදුරටත් පහසුකම් ඇතුළත් කරන ලදි. මෙම මාසික කළමනාකරණ තොරතුරු පද්ධති වාර්තා (MIS) උත්පාදන අංගය තුළින්, කොමිෂන් සභාවේ කළමනාකරණයට බලපත්‍රලාභීන්ගේ කාර්ය සාධන මට්ටම සහ විශාල වශයෙන් විදුලිබල අංශයේ පොදු කාර්ය සාධනය (පාරිභෝගික බලශක්ති පරිභෝජනය) විශ්ලේෂණය කිරීම සඳහා අවශ්‍යවන දත්තවලට පහසුවෙන් ප්‍රවේශ විය හැකිය.

## සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති අංශය - ප්‍රතිපත්ති ඉලක්ක

2013 වර්ෂය සඳහා, 2012 නොවැම්බර් මස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද අයවැය යෝජනාව මගින් පුනර්ජනනීය බලශක්ති සම්පත් දියුණු කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරනු ලැබ ඇත. අයවැය යෝජනාව අනුව, බලශක්ති ඉල්ලුම වර්ධනයත් සමගම සැලකිය යුතු ලෙස ඉහළ යන බව පෙන්වාදී ඇත. මෑත කාලය තුළ ඛණිජ තෙල් නිෂ්පාදන පිරිවැය විශාල වශයෙන් වැඩිවී ඇති බැවින්, වත්මන් රජයේ ප්‍රතිපත්ති උපදේශයන් වන්නේ දැනට පවතින ජල, සුළං සහ වෙනත් පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍රයන් ගවේශණය කිරීම ධෛර්යමත් කිරීමයි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, පුනර්ජනනීය බලශක්ති අංශයේ යෙදී සිටින සියලුම ආයතනයන්ගේ වගකීම වන්නේ මේ සම්බන්ධයෙන් රජයට එහි ප්‍රතිපත්ති මගපෙන්වීම්වලදී සහායවීමයි.

ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සහ ක්‍රමෝපායන් විසින් 2015 වර්ෂය වනවිට, සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍රවල දායකත්වය මුළු විදුලි උත්පාදනයෙන් 10%ක ඉලක්කයක් වශයෙන් හඳුනාගෙන ඇත. මහින්ද චින්තන ඉදිරි දැක්ම මගින් 2020 වර්ෂය වනවිට, සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍රවලින් මුළු විදුලි උත්පාදනයෙන් 20%ක ඉලක්කයන් නියම කර ඇත. මෙම ප්‍රත්පත්ති මග පෙන්වීම් පුනර්ජනනීය බලශක්ති සඳහා වෙනම අමාත්‍යංශයක් ඇති කිරීම මගින් තවදුරටත් ශක්තිමක් කරනු ලැබ ඇත.

ඇස්තමේන්තු අනුව, සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය මඟින් මුළු විදුලි උත්පාදනයෙන් 10%ක් ළඟාකර ගැනීමේ රජයේ ප්‍රතිපත්තිමය ඉලක්කය සපුරා ගැනීම පිණිස 2015 වර්ෂයේදී සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය තුළින් විදුලිය ගිගා වොට් 1,500ක් උත්පාදනය කිරීමට අවශ්‍ය වේ. දැනට ගිගා වොට් 700ක විදුලිය සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍රවලින් උත්පාදනය කරයි. එමනිසා, රජයේ ප්‍රතිපත්තිමය ඉලක්කය සපුරා ගැනීම පිණිස තවදුරටත් ගිගා වොට් 800ක බලශක්තියක් 2015 වනවිට සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍රවලින් උත්පාදනය කර ගැනීමට අවශ්‍ය වේ.

දිගු කාලීන සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති සංවර්ධන සැලසුම් සකස් කිරීමට වගකීම පවරා ඇති සුනිත්‍ය බලශක්ති අධිකාරියෙන් ලබාගත් සංඛ්‍යා ලේඛණ අනුව, 10%ක ප්‍රතිපත්තිමය උත්පාදනය කිරීමට (තක්සේරුකළ) අවශ්‍ය කරනු ලබන සමුච්චිත ධාරිතා එකතුකිරීම් පහත පරිදි වේ ථ

| වර්ෂය | තාක්ෂණය ( අමතර ධාරිතාවය-මෙගාවොට) | | | | | % මුළු උත්පාදනයෙන් |
|---|---|---|---|---|---|---|
| | ජෛව ස්නක්ධ | ජල | සුලං | වෙනත් | මුළු ගණන | |
| 2012 | 20 | 280 | 35 | 1 | 336 | 9.1 |
| 2013 | 20 | 295 | 85 | 2 | 402 | 9.8 |
| 2014 | 30 | 310 | 85 | 2 | 427 | 9.9 |
| 2015 | 40 | 330 | 85 | 5 | 460 | 10.0 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

පුනර්නනීය බලශක්ති අංශයේ විශේෂත්වය වනුයේ සියලුම බලාගාර පුද්ගලික අංශයට අයත්වීමයි. මේනිසා, ආයෝජන් මත තරගකාරි ඉපැයීම් පුද්ගලික ආයෝජකයන්ට අංශය තුළ තවදුරටත් රැඳී සිටීමටත් නව ආයෝජකයන් ආකර්ෂණය කර ගැනීමටත් ප්‍රධාන සාධකයකි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති අංශය තුළ ආයෝජන ධෛර්යමත් කිරීමේදී කොමිෂන් සභාවට ප්‍රධාන කාර්යභාරයක් පැවරේ.

## ප්‍රතිපත්තිමය ඉලක්කයන් සපුරාගත යුත්තේ පාරිභෝගිකයන්ට ඕනෑම පිරිවැයක් තුළදී යන්න අදහස් කරන්නේද?

ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සහ ක්‍රමෝපායන් තුළ සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ක්‍රමෝපාය මගින් අවසන් පාරිභොගිකයාගේ මිල ගණන් මත අමතර බරක් ඇති නොකරයි යන්න පැහැදිළිව සඳහන් කර ඇත. කෙසේවෙතත්, එකිනෙකට පරස්පර පරමාර්ථයන් දෙකක් අතර සමබරතාවයක් පවත්වා ගන්නේ කෙසේද යන ප්‍රශ්නය ඉතිරිව පවතී. තුලනය කළ හැකි පිරිවැය සටහනක් ප්‍රතිපත්තිය තුළ නියම කර නොමැති බැවින්, 'අතිරේක' යන වචනය අර්ථ දැක්වීමේදී දුෂ්කරතාවයන් පැන නගී. එමනිසා, පුනර්ජනනීය බලශක්ති පිරිවැය එම විශේෂ වර්ෂය තුළදී විදුලිබල සාමාන්‍යය පිරිවැය ඉක්මවා නොයා යුතුය යන්න පිළිගැනීම යුක්ති සහගතය.

## පුනර්ජනනීය බලශක්ති අයක්‍රමයන් 2012-2013

කලින් ප්‍රකාශයට පත්කළ සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති මිලදී ගැනීමේ අයක්‍රමයන් 2011 දෙසැම්බර් 31 දින දක්වා පමණක් වලංගු වූ අතර සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති අයක්‍රමයන්ගේ සංශෝධනය 2011 දෙසැම්බර් 31 දිනට පෙර සිදුකළ යුතුය. කෙසේවෙතත්, සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා වශයෙන් ලංකා විදුලිබල මණ්ඩලය විසින් 2012- 2013 වර්ෂය සඳහා සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති මිලදී ගැනීමේ අයක්‍රමයන් පිළිබඳ ඔවුන්ගේ යෝජනාවන් 2012 ජූනි මස 21 දින ඉදිරිපත් කරන ලදී. ඉන්පසුව මේ සම්බන්ධයෙන් විස්තරාත්මක තොරතුරු 2012 ජූලි මස 09 දින කොමිෂන් සභාව වෙත ලැබුණි.

ඉන් අනතුරුව, මෙම කරුණ සම්බන්ධව මහජන උපදෙස් ලබාගැනීමක් පැවැත්වීමට කොමිෂන් සභාව තීරණය කළ අතර ලංකා විදුලිබල මණ්ඩලයේ යෝජනාවන් අඩංගුවන අදාළ උපදෙස් ලබා ගැනීමේ ලියවිල්ල 2012 ජූලි මස 26 දින ජාතික පුවත්පත්වල ප්‍රකාශයට පත් කරන ලදි. වාචික අදහස් නියෝජනය කිරීමේ සැසිය අවසන් කිරීමත් සමගම මහජන උපදෙස් ලබාගැනීමේ ක්‍රියාවලිය 2012 අගෝස්තු මස 28 දින අවසන් කරන ලදි. පාර්ශවකරුවන් දහනව (19) දෙනෙකු යෝජිත උපදෙස් ලබාගැනීමේ ලියවිල්ල මත ඔවුන්ගේ ලිඛිත සහ වාචික අදහස් ඉදිරිපත් කරන ලදි. කොමිෂන් සභාව විසින් අයක්‍රමය පිළිබඳ යෝජනාවන් ඇගැයීම සඳහා පිරිවැය නැඹුරුව පිළිබඳව අන්තර්ජාතික වශයෙන් ප්‍රකාශයට පත් කර ඇති තොරතුරුද පරීක්ෂා කරන ලදි.

2012 ජනවාරි 1 දින සිට 2013 දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදය තුළ, සම්මත විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් අත්සන් කරන ලද මෙගා වොට් 10ට අඩු උත්පාදන ධාරිතාවයෙන් යුක්ත සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය මත පදනම් වූ උත්පාදන බලාගාරයන් සඳහා අනුමත මිලදී ගැනීමේ අයක්‍රමයන් 2012 ඔක්තෝබර් මාසයේදී සම්ප්‍රේෂණ බලපත්‍රලාභීන් වෙත නිකුත් කරන ලදි.

## අයක්‍රම ක්‍රියාවලිය

- ලංකා විදුලිබල මණ්ඩලයේ අයක්‍රම යෝජනා සමාලෝචනය කිරීම
  සම්ප්‍රේෂණ බලපත්‍රලාභීන් විසින් බෙදාහැරීමේ බලපත්‍රලාභීන්ට විදුලිබලය අලෙවිකිරීමේදී අදාල වන තොග මිල සංශෝධනය කරනු ලබන්නේ මාස 6ට වරකි. සම්ප්‍රේෂණ බලපත්‍රලාභීන් විසින් යෝජනා කරන පිරිවැය තක්සේරුකිරීම් මෙය මත පදනම් වේ.
  2012 වර්ෂයේ පළමු සහ දෙවන භාගය සඳහා විශාල සැපයුම් අයක්‍රම යෝජනා (BST) ලංකා විදුලිබල මණ්ඩලය විසින් ගොනු කළ අතර කොමිෂන් සභාව විසින් අවශ්‍ය ගැලපීම් සහ තක්සේරුකිරීම්වලින් පසු 2012 වර්ෂයේ පළමු භාගය සඳහා විශාල සැපයුම් අයක්‍රම (BST) අනුමත කරන ලදි. 2012 වර්ෂයේ දෙවන භාගය සඳහා විශාල සැපයුම් අයගණන් (BST) සකස්කිරීම අවසන්කර ඇති අතර කොමිෂන් සභාවේ අනුමැතිය අපේක්ෂාවෙන් සිටී.

- ලංකා විදුලිබල මණ්ඩලය සහ ලංකා විදුලි පුද්ගලික සමාගම (LECO) 2012 සඳහා ගොනුකළ අනුමත ගාස්තු
  2012 වර්ෂය සඳහා ලංකා විදුලිබල මණ්ඩලය සහ ලංකා විදුලි පුද්ගලික සමාගම (LECO) විසින් අනුමත ගාස්තු (නව විදුලි සම්බන්ධතාවයක් සැපයීම, බලශක්ති මනු පරීක්ෂණය, පරීක්ෂණ ස්ථාපිත කිරීම, කණු ගෙනයාම සහ විදුලි පාරිභෝගිකයෙන් විසින් සිදුකළ ඉල්ලීමකදී, බලපත්‍රලාභියෙක් විසින් සැපයීමට අවශ්‍ය වන වෙනත් සේවාවන් වැනි සේවාවන් සඳහා පිරිවැයට පාරිභෝගිකයෙකුගෙන් අයකිරීමට බලපත්‍රලාභියෙකු අනුමත කරනු ලබන ගාස්තු) අනුමත ගාස්තු ක්‍රමවේදයන් මත පදනම්ව 2011 වර්ෂය සඳහාඉඩදුන් ගාස්තු සමාලෝචනය කරන ලද අතර යම් වෙනස්වීම් පරීක්ෂා කිරීමෙන් පසුව අනුමත කරන ලදි.

## පාරිභෝගික පාර්ශ්වයේ බලශක්ති කළමනාකරණය පිළිබඳ රෙගුලාසි

පාරිභෝගික පාර්ශ්වයේ බලශක්ති කළමනාකරණය (DSM) යන සංකල්පය මගින් විදුලිබලය සඳහා පාරිභෝගික ඉල්ලුම ස්වේච්ඡාවෙන් අඩුකිරීම ඉලක්ක කර ඇති අතර දිගුකාලීනව බලශක්ති කාර්යක්ෂමතාවය වැඩි කෙරේ. 2009 අංක 20 දරණ ශ්‍රී ලංකා විදුලිබල පනත ප්‍රකාරව, කොමිෂන් සභාවේ ප්‍රධාන පරමාර්ථයක් වන්නේ පරිශ්‍රයන් වෙත සපයනු ලබන විදුලිය කාර්යක්ෂමව භාවිතා කිරීම ප්‍රවර්ධනය කිරීමයි. පවත්නා උපයෝගිතාවයන් තුළ ඉල්ලුම් පැති කළමනාකරණයට සම්බන්ධ කටයුතු දුර්වල හෝ එසේ නැත්නම් නොපවතින බව සහ 1990 දශකය තුළ බිදුලිබල අංශයේ ප්‍රතිසංස්කරණයෙන් අනතුරුව මෙම තත්ත්වය වඩාත් නරක අතට පත්වී ඇති බව ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව නිරීක්ෂණය කර ඇත.

ඒ අනුව, කොමිෂන් සභාව බලශක්ති කාර්යක්ෂමතාවය සහ සංරක්ෂණයට අදාළ කොමිෂන් සභාවේ පරමාර්ථයන් ඉටුකරගැනීමට මෙවලමක් වශයෙන් ඉල්ලුම් පැති කළමනාකරණය පිළිබඳ රෙගුලාසි සකස් කිරීමේ කාර්යය කරගෙන යාම සඳහා සුදුසුකම්ලත් උපදේශකයෙකු යොදාගැනීමට අදහස් කරන ලදි. මෙම රෙගුලාසිවලින් බලශක්ති කාර්යක්ෂමතා වැඩසටහන් බොහොමයක් ඵලදායි වශයෙන් ක්‍රියාත්මක කළහැකි වීමට අවශ්‍ය නීතිමය සහ ආයතනික රාමුවක් නිර්මාණය කිරීම අපේක්ෂා කෙරේ. මෙම රෙගුලාසි සකස්කිරීම සඳහා 2012 නොවැම්බර් මාසය තුළ සුදුසුකම්ලත් පාර්ශ්වයන්ගෙන් තරගකාරි ලංසු කැඳවන ලද අතර ඉන්පසුව එම කාර්යය කරගෙන යාම සඳහා ප්‍රයිස් වෝටර් හවුස් කෝපර්ස් සමාගම (කල්කටා) තෝරා පත්කරගන්නා ලදි. තෝරාගත් උපදේශක සමාගම වෙත ගිවිසුම භාරදීම සඳහා කොමිෂන් සභාවේ විධිමත් අනුමැතිය ලබාගැනීමට ඇත.

## පර්යේෂණ සහ අධ්‍යයන

## පවත්නා විදුලි යෝජනා ක්‍රම පිළිබඳ සමීක්ෂණ සහ අධ්‍යයනයන්

දැනට, පැවති රජයන්ගේ ප්‍රතිපත්ති තීරණ තුළින් ක්‍රමානුකූලව පද්ධති පුළුල් කිරීමේ ව්‍යාපෘති හේතුවෙන් 89% මට්ටමක පද්ධතියක් ශ්‍රී ලංකාව සතුවන අතර එය ශ්‍රී ලංකාවේ බොහෝ දුෂ්කර ප්‍රදේශයන්ට අවශ්‍ය ජාතික විදුලි පද්ධතිය පුළුල් කිරීම සඳහා බලපෑහ. කෙසේ වෙතත්, මෙම පුළුල් කිරීමේ වැඩසටහන්වල ආන්තික පිරිවැය සැලකිලිමත් ලෙස තක්සේරු කර නොමැති අතර ජාතික මට්ටමේදී ඇතිවූ ආර්ථික ප්‍රතිලාභයන් සමග සන්සන්දනය කර නොමැත. ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ජල විදුලිබල යෝජනා ක්‍රමයන් බොහෝමයක් සඳහා ආධාර කරනු ලබන්නේ ලෝක බැංකුව සහ ගෝලීය පරිසර පහසුකම විසින් අරමුදල් ලබාදෙන රීරෙඩ් (RERED) ව්‍යාපෘතිය මගිනි. මෙම මුල් පියවරයන් මගින් කිලෝ වොට් 3-50 අතර පරාසයක ධාරිතාවයක් සහිත ග්‍රාමීය ජල විදුලිබල යෝජනා ක්‍රමයන් 100-150 ක් රටතුළ ස්ථාපිත කර ඇත.

2012 වර්ෂය තුළදී, ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව විසින් රත්නපුර සහ කෑගල්ල දිස්ත්‍රික්කය තුළ මෙන්ම දෙනියාය ප්‍රදේශය තුළ දැනට පවත්නා ජාතික පද්ධතියෙන් පරිබාහිර විදුලි යෙදවුම් යෝජනා ක්‍රමයන් පිළිබඳව අධ්‍යයනයක් සිදුකරන ලදි. විදුලි උත්පාදනය කිරීම සහ බෙදාහැරීමේ බලපත්‍රවලින් නිදහස්කරන මෙන් අයදුම්පත් ඉදිරිපත් කර ඇති මෙන්ම ජාතික පද්ධතියෙන් පරිබාහිර යෝජනා ක්‍රමයන්ගෙන් තොරාගත් ප්‍රමාණයක් ආරක්ෂිත රෙගුලාසීන් සමග අනුකූලදැයි කොමිෂන් සභාව විසින් පරීක්ෂා කරන ලදි. මෙම ජල විදුලිබල යෝජනා ක්‍රමයන් පරීක්ෂා කරන සහ සමීක්ෂණය කරන කාලය තුළදී, ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ කාර්යය මණ්ඩලය විසින් මේවායේ ප්‍රජාවන්ට නිර්දේශයන් සපයන ලදි. මෙවැනි පරීක්ෂණයන්ගෙන් එක්රැස්කළ තොරතුරු කොමිෂන් සභාව විසින් රැස්කරන ලද පවත්නා දත්ත සමග සම්බන්ධ කරන ලද අතර පවත්නා ජාතික පද්ධතියෙන් පරිබාහිර විදුලිබලය යෙදීමේ යෝජනා ක්‍රමයන් පිළිබඳ සමීක්ෂණයක් සහ අධ්‍යයනයක් යන මාතෘකාව යටතේ වාර්තාවක් සම්පාදනය කරන ලදි. වාර්තාව මගින් ශ්‍රී ලංකාවේ විදුලිබල හා බලශක්ති අංශය සම්බන්ධ සංවර්ධනයේ ප්‍රජා මූල ආකෘතිය පිළිබඳ දර්ශනයන්ද ඉදිරිපත් කරන ලදි.

සමීක්ෂණයෙන් ලබාගත් සොයාගැනීම් කොමිෂන් සභාව වෙත නිල වශයෙන් ඉදිරිපත් කරන ලද අතර මහජන අදහස් සහ ප්‍රතිචාරයන් සදහා ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ වෙබ් අඩවියෙහි පල කරන ලදි .

මෙම යෝජනා ක්‍රමයන්ගේ සමහර ක්‍රියා මාර්ගයන් ඉහළ මට්ටමේ බලශක්ති අපතේ යාමකට දායකවෙමින් පවතින බව, මෙම යෝජනා ක්‍රමයන්ට අදාළවන ඉදිකිරීමේ වැඩ සහ බෙදාහැරීමේ ක්‍රමය තුළ ඉතා යෝග්‍ය තාක්ෂණික විධිවිධානයක අවශ්‍යතාවය, මෙවැනි යෝජනා ක්‍රමයන් කළමනාකරණය සහ පරිපාලනය කිරීම ආසන්නව පවතින සමාජ-ආර්ථික සාධක, අධ්‍යයනය තුළින් අනාවරණය කරගත් ප්‍රධාන නිරීක්ෂණයන් වූහ.

## පවත්නා දිගුකාලීන උත්පාදන සැලසුම් පිළිබඳ අධ්‍යයනය 2009-2022

දිගු කාලීන වශයෙන් ජනතාවට විශ්වාසදායි විදුලිබල සහ බලශක්ති පද්ධතියක් ආරක්ෂා කිරීම පිණිස අනාගත විදුලිබල ඉල්ලුම සහතික කිරීම සඳහා විදුලි බලය උත්පාදන පද්ධතිය තුළ ප්‍රමාණවත් සැලසුම් කිරීම අත්‍යවශ්‍ය වී ඇත.

2012දී, කොමිෂන් සභාව විසින් ලංකා විදුලිබල මණ්ඩලයේ දිගු කාලීන උත්පාදන පුළුල්කිරීමේ සැලසුම් (2009-2022) විශ්ලේෂණය කිරීම මත පදනම්ව වාර්තාවක් සම්පාදනය කරන ලදි. එම වාර්තාව තුළින් ලංකා විදුලි බල මණ්ඩලයේ වර්තමාන විදුලි උත්පාදන සැලසුම්වල අඩුපාඩුකම් සහ එවැනි දිගුකාලීන උත්පාදන සැලසුම් සඳහා බලපාන සැබෑ පසුබිම හඳුනාගන්නා ලදි. වාර්තාව තුළින් අනාවරණය කරගත් ප්‍රබල කරුණක් වූයේ ලංවීම විසින් පුරෝකථනය කළ දිගුකාලීන විදුලිබල ඉල්ලුම් සහ සැබෑ දිගුකාලීන ඉල්ලම් අතර පවතින සැලකිය යුතු විෂමතාවයයි.

## විදුලි බලයෙන් සිදුවන අනතුරු  සහ ආරක්ෂක වාර්තාව

විදුලිබල රෙගුලාසි අනුව, ආරක්ෂාව, තත්ත්වය සහ අඛණ්ඩතාවය කොමිෂන් සභාව යටතේ පවතින බැවින්, විදුලි බලයෙන් සිදුවන සියලුම අනතුරු, බලපත්‍රලාභින්, නිදහස් කරන ලද පුද්ගලයින් හෝ පොදු මහජනතාව විසින් ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව වෙත දැන්විය යුතු බව නිශ්චිතව සඳහන් වේ.

එසේවුවත් දිගුකාලීන විශ්ලේශණ සහ විදුලි ආරක්ෂක රෙගුලාසී වැඩි දියුණු කිරීමක් නොමැතිවම විධිමත් වාර්තාකරන යාන්ත්‍රණයක් නිර්මාණය කර ක්‍රියාත්මක කිරීමට නියමිතය. වර්තමානයේ විදුලිබල සහ බලශක්ති අමාත්‍යාංශය, කම්කරු දෙපාර්තමේන්තුව යන ආයතන දෙක විසින් විදුලිබලය සම්බන්ධ අනතුරු සහ මාරක විපත් වාර්තා කිරීම මෙහෙයවනු ලබයි. 2012දී, කොමිෂන් සභාවේ බලපත්‍ර නිකුත් කිරීමේ අංශය විසින් විදුලි බලයෙන් සිදුවන අනතුරු සහ ආරක්ෂක වාර්තාව' යන මාතෘකාව යටතේ වාර්තාවක් සකස් කළේය. එම වාර්තාව මගින් කොමිෂන් සභාව විසින් විමර්ශණය කර ඇති මෑත කාලයේදී ශ්‍රී ලංකාව තුළ සිදුවූ විදුලිබල අනතුරු පිළිබඳ විශ්ලේෂණයක් ඉදිරිපත් කරන අතර විදුලි බලයෙන් සිදුවන අනතුරු සහ එයටම සම්බන්ධ මූල්‍යමය අලාභයන් හා සම්බන්ධ අවදානම් සහ අන්ත්‍රාවන් අවම කරගත හැකි ප්‍රති ක්‍රියාමාර්ගයන් යෝජනා කිරීම සඳහා උත්සාහ දරා ඇත. මෙම වාර්තාව කොමිෂන් සභාවේ විමර්ශණ අංශය විසින් සිදුකළ ආරක්ෂිත විමර්ශනයන්ට අදාළවන දත්ත සහ අනෙකුත් රටවල පවත්නා ක්‍රියාමාර්ගයන් සහ ක්‍රියාපිළිවෙලවල් මෙන්ම විදුලිබලයෙන් සිදුවන අනතුරුවලට අදාළව ගුණාත්මක තක්සේරුකිරීම් සඳහා භාවිතා කරන ලද වාර්තාවන් මත පදනම් විය. එයට අමතරව, වාර්තාවෙන් ඉදිරිපත් කරන ලද නිගමනයන් සහ යෝජනා සලකා බැලීමේදී දේශිය මාධ්‍ය වාර්තාවන්ද උපයෝගී කර ගන්නා ලදි.

විදුලි ආරක්ෂාව සහ උපකරණ සුදුසු පරිදි මෙහෙයවීම සඳහා තාක්ෂණික ප්‍රමිතීන් බලාත්මක කිරීම සහ සමාලෝචනය කිරීම අවශ්‍යයෙන්ම කළ යුතු වීම, වෙළඳපලේ උපකරණ සහ මෙවලම්වල තත්ත්වයන් පාලනය කිරීම, විදුලිබලය සම්බන්ධ අනතුරු සහ සිදුවීම් දැනුම්දීම සඳහා දත්ත පද්ධතියක් සංවර්ධනය කිරීමේ අවශ්‍යතාවය, අනතුරු ඇගැයීම සහ අවදානම් තක්සේරු කිරීම සඳහා පිරිවැයට (ප්‍රතිලාභ අලාභ) මූල්‍යමය වර්තමාන අගයක් (වර්තමානයට ගැලපෙන මූල්‍ය අගයක්) නියම කිරීමේ වැඩ පිළිවෙලක් සංවර්ධනය කිරීමේ අවශ්‍යතාවය, විදුලි ආරක්ෂාව සඳහා මිණුම් සලකුණක අවශ්‍යතාවය, විදුලිබල ආරක්ෂාව පිළිබඳ තිරසාර දැනුවත් කිරීම් නිර්මාණය කිරීමේ අවශ්‍යතාවය එම වාර්තාවේ ප්‍රධාන නිර්දේශයන් වූහ.

එම වාර්තාවේ නිර්දේශයන් අනුව යමින්, 2013 වර්ෂය තුළ විදුලියෙන් සිදුවන අනතුරු සහ සිදුවීම් පිළිබඳ දත්ත  පදනමක් නිර්මාණය කිරීමට කොමිෂන් සභාව සූදානමින් සිටී. මෙය ආරක්ෂාව සම්බන්ධ තොරතුරු සහ තොරතුරු ගලායාම විධිමත් කිරීමේදී සියලුම පාර්ශවකරුවන්ට සහ පොදු මහජනතාවට විශාල වශයෙන් සහාය විය හැකිය.

## පුනර්ජනනීය බලශක්ති කාර්යසාධන වාර්තාව

දේශිය බලශක්ති සම්පත් ප්‍රවර්ධනය කිරීම ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්තියේ අනිවාර්ය අංගයක් බවට පවතී. 2011 දී මෙන්, සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍රයන් තුළින් ජාතික පද්ධතියට විදුලිබල උත්පාදන 6ග25 බැගින් පැවතීය. 2011 අවසානය වන විට, සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍රයන්ගෙන් විදුලි උත්පාදනය සඳහා පද්ධතියට සම්බන්ධිත ස්ථාපිත ධාරිතාවය මෙගා වොට් 243ග7 කි. මෙයට කුඩා විදුලිබල නිෂ්පාදකයන් ලෙස හඳුන්වන කුඩා ජල විදුලි බලාගාර 91ක්, සුළං බලාගාර 6ක්, සූර්ය බලාගාර 4ක් සහ ජෛව ස්කන්ධ බලාගාර 4ක් ඇතුළත් වූහ. එසේ වුවත්, විශාල සාම්ප්‍රදායික විදුලි බලාගාර සමග සැසැඳීමේදී, ජාතික පද්ධතියට සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති (NCRE) අංශයෙන් සිදුකරන මුළු දායකත්වය තවමත් සැලකිය යුතු මට්ටමකින් නොපවතී.

2012දී, කොමිෂන් සභාව විසින් 2011 වර්ෂය සඳහා පුනර්ජනනීය බලශක්ති අංශය තුළ ලබාගත් ජයග්‍රහණ පිළිබඳ වාර්තාවක් කෙටුම් පත් කරන ලදී. මෙම වාර්තාව සම්පූර්ණ කිරීමේදී, ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ බලපත්‍රලාභී තොරතුරු ඉදිරිපත් කිරීමේ පද්ධතියෙන් බලශක්ති අනුව දත්ත රැස් කරන ලදි. මෙයට අමතරව, සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති බලාගාරවල ධාරිතා සංවර්ධනය පිළිබඳ තොරතුරු සුනිත්‍ය බලශක්ති අධිකාරියෙන් ලබාගන්නා ලදි. මෙම වාර්තාව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අතර මහජන අදහස් සහ ප්‍රතිචාරයන් සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ වෙබ් අඩවියෙන් දැන් ලබාගත හැකිය.

මූලික වශයෙන් ඉහළ ආයෝජන සිදුකිරීමෙන් සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති බලාගාර නොනැසී පවත්වා ගැනීම සඳහා රජයේ අනුග්‍රහයන්ගේ අවශ්‍යතාවය, සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති අංශය තුළ තාක්ෂණික දැනුම සහ කුසලතාවයන් වැඩි දියුණු කිරීමේ අවශ්‍යතාවය, ජාල මීටර් යෝජනා ක්‍රමය සහ විදුලි බලය උත්පාදනය කිරීමට අපේක්ෂා කරන ගෘහස්ථ පාරිභෝගියන්ගේ සම්බන්ධතාවය තුළින් එහි භාවිතා කිරීම පිළිබඳ දැනුම ඇති කිරීම, වාර්තාවේ ප්‍රධාන නිර්දේශයන්ට ඇතුළත් වේ.

## සම්ප්‍රේෂණ පද්ධතියේ කාර්යසාධන 2011 සහ සම්ප්‍රේෂණ පද්ධතියේ කාර්ය සාධන වාර්තාව 2012 (පළමු භාගය)

ශ්‍රී ලංකාවේ විදුලිබල සම්ප්‍රේෂණ ජාලය ලංකා විදුලි බල මණ්ඩලයේ ඒකාධිකාරය යටතේ මෙහෙයවනු ලබයි. ශ්‍රී ලංකාව තුළ විදුලිබල සම්ප්‍රේෂණයේ සුරක්ෂිතභාවය, ආරක්ෂාව සහ කාර්යක්ෂමව මෙහෙයවීම සඳහා ලං.වි.ම. වගකිව යුතුය. සම්ප්‍රේෂණ ජාලය උත්පාදන ස්ථානවල සිට විදුලිය බෙදාහරින තොග සැපයුම් ස්ථානයන් වෙත ප්‍රවාහනය කිරීම සඳහා දහසු වෝල්ට් 220 (220kV) සහ දහසු වෝල්ට් 132 (132kV) මට්ටම්වලින් මෙහෙයවනු ලබයි. විදුලිබල කර්මාන්තයේ නියාමනආයතනය වශයෙන් ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව සම්ප්‍රේෂණ පද්ධතියේ තාක්ෂණික කාර්යය සාධනය නියාමනය කිරීම අවශ්‍ය වේ. 2012දී, කොමිෂන් සභාව 2011 වර්ෂය වෙනුවෙන් සහ 2012 වර්ෂයේ මුල් භාගය වෙනුවෙන්ද සම්ප්‍රේෂණ කාර්ය සාධන වාර්තාවක් සම්පාදනය කරන ලදි. ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ සම්ප්‍රේෂණ කාර්යය සාධන වාර්තාවෙන් ශ්‍රී ලංකාව තුළ විදුලිබල සම්ප්‍රේෂණ පද්ධතිය සඳහා ප්‍රධාන කාර්යය සාධන දර්ශකයන් සමූහයක් විස්තර කර ගණනය කරනු ලබයි. වාර්තාව සඳහා දත්ත බලපත්‍රලාභින්ගේ තොරතුරු ඉදිරිපත්කිරීමේ පද්ධතිය සහ ලංකා විදුලිබල මණ්ඩලයේ මාසික සමාලෝචන වාර්තා තුළින් සපයා ගනු ලැබූ අතර කාර්යය සාධන දර්ශකයන් ඉන්පසුව හඳුනාගනු ලැබුහ. හඳුනාගනු ලැබූ කාර්ය සාධන දර්ශකයන් තුළින් උපයෝජ්‍යතාවය, සැපයුමේ සුරක්ෂිතතාවය සහ සම්ප්‍රේෂණ ජාලයේ සේවාවන්ගේ තත්ත්වය ආවරණය කරයි. මෙම හඳුනාගත් දර්ශකයන් සම්ප්‍රේෂණ බලපත්‍රලාභීන්ගේ කාර්යසාධනයේ අනාගත සහ ඓතිහාසික සන්සන්දනයන්වලදීද සහය විය හැකි අතර ජාත්‍යන්තර ප්‍රමිතීන් හා සන්සන්ධනයේදී ද උපකාරි වේ.

2011 වාර්තාවෙන් සම්ප්‍රේෂණ අලාභ, සැපයුමේ සුරක්ෂිතභාවය, විදුලිබලයේ තත්ත්වය සහ සම්ප්‍රේෂණ රැහැන් සහ ට්‍රාන්ස්ෆෝමර්වල උපයෝජ්‍යතාවයට අයත්වන ක්ෂේත්‍ර පිළිබඳ කරුණු වාර්තා කරයි. 2012 ප්‍රථම භාගය ආවරණය කරන වාර්තාව මඟින් 2011දී ලබාගත් සංඛ්‍යා ලේඛන සහ 2012 ප්‍රථම භාගය තුළදී ලබාගත් සංඛ්‍යා ලේඛණ අතර සන්සන්දනයක් සිදුකරයි. 2012 ප්‍රථම භාගයේ වාර්තාව තුළ ප්‍රධානම නිරීක්ෂණයන් වන්නේ, 2011 සමග සැසැඳීමේදී සම්ප්‍රේෂණ රැහැන් උපයෝජ්‍යතාවයේ වර්ධනය, සම්ප්‍රේෂණ අලාභයන්ගේ වැඩිවීම, 2011 4.5%ක අනුපාතය හා සසඳන විට 2012 සඳහා අනුපාතය 5.1% වීමයි. එමෙන්ම, 2011 තුළ නිරීක්ෂණය කළ බලශක්ති අපතේයාම් අනුපාතය සමග සැසැඳීමේදී, සම්ප්‍රේෂණ රැහැන්වල බාධකයන් හේතු කොට ගෙන භාවිතයට නොගත් බලශක්තියේ වැඩිවීමක් 2012දී නිරීක්ෂණය විය. වාර්තාවන් දෙක 2012දී කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අතර පාර්ශ්වකරුවන්ගේ සහ මහජනතාවගේ තොරතුරු සඳහා කොමිෂන් සභාවේ වෙබ් අඩවියෙහි පළකරන ලදි.

## උත්පාදන කාර්යසාධන වාර්තාව - 2011 සහ උත්පාදන කාර්යසාධන වාර්තාව 2012 (පළමු භාගය)

2011 වර්ෂය සහ 2012 ප්‍රථම භාගය සඳහා කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කළ උත්පාදන කාර්යසාධන වාර්තාවන් තුළ 2011 වර්ෂය සහ 2012 ප්‍රථම කාර්තුව සඳහා ශ්‍රී ලංකාව තුළ උත්පාදන ඒකකයන්ගේ තොරතුරු සහ කාර්යසාධන සංඛ්‍යා ලේඛනවල සාරාංශයක් අඩංගු වේ. 2011 සංඛ්‍යා ලේඛන අනුව ශ්‍රී ලංකාවේ උපරිම විදුලිබල ඉල්ලුම මෙගා වොට් 2163ක් විය. (2163.1MW) වර්තමානයේ, එම විදුලිබල අවශ්‍යතාවය සපුරා ගැනීම පිණිස, මෙගා වොට් 3140ක මුළු ස්ථාපිත ධාරිතාවයක් සහිත ජාතික පද්ධතිය හා බැඳුණු බලාගාර 139ක් 2011 සිට ක්‍රියාත්මක විය. ජලවිදුලි බලාගාර 16ක්, තාප බලාගාර 6ක් සහ සුළං බලාගාර 1ක් ඇතුළත් මෙම බලාගාරවලින් 23ක් ලංකා විදුලිබල මණ්ඩලයට අයත්වන අතර මණ්ඩලය මඟින් කළමණාකරණය කරනු ලබයි. තාප විදුලි බලාගාර 11ක් ස්වාධීන විදුලිබල නිෂ්පාදකයන්ට (IPPs) අයත්වන අතර ඔවුන් විසින් ඒවා කළමණාකරණය කරනු ලබන අතර කුඩා බලාගාර 104ක් කුඩා විදුලිබල නිෂ්පාදකයන්ට (SPPs) අයත්වන අතර ඔවුන් විසින් ක්‍රියාත්මක කරනු ලබයි. මෙයට කුඩා ජල බලාගාර, සූර්ය බලාගාර, සුළං බලාගාර සහ ජෛව ස්කන්ධ බලාගාර ඇතුළත් වේ. 2012 වර්ෂයේ ප්‍රථම භාගයේ වාර්තාවට අනුව ශ්‍රී ලංකාවේ උපරිම විදුලිබල ඉල්ලුම මෙගා වොට් 3146ක් (3146.4MW) විය. (සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් රහිතව) එමනිසා, 2011 වර්ෂය තුළ අත්විඳි ඉල්ලුම සමග සැසැඳීමේදී 2012 වර්ෂයේ ප්‍රථම භාගය තුළ ඉල්ලුමෙහි සුළු අඩුවීමක් දැකිය හැකිවිය. 2012 වර්ෂයේ ප්‍රථම භාගය තුළ, මෙගා වොට් 3277ක මුළු ස්ථාපිත ධාරිතාවයක් සහිත (3277MW) ජාතික පද්ධතිය හා බැඳුණු බලාගාර 145ක් සහ යාපනය අර්ධද්වීපය තුළ බලාගාර 3ක් ක්‍රියාත්මක මට්ටමේ පැවැතිණි. ජලවිදුලි බලාගාර 17ක්, තාප බලාගාර 6ක් සහ සුලං බලාගාර 1ක් ඇතුළත් මෙම බලාගාරවලින් 24ක් ලංකා විදුලිබල මණ්ඩලයට අයත්වන අතර මණ්ඩලය මඟින් මෙහෙයවනු ලබයි. 2012 මුල් මාස 6ක කාලසීමාව තුළ, ඉහළ කොත්මලේ ජල විදුලි බලාගාරය මඟින් ලංවීමේ උත්පාදන ධාරිතාවය වැඩි කිරීම සඳහා ජාතික පද්ධතියට මෙගා වොට් 150ක (150MW)la එකතු කරන ලදි. 2012 වර්ෂයේ ප්‍රථම භාගය තුළ, තාප විදුලි බලාගාර 11ක් ස්වාධීන විදුලිබල නිෂ්පාදකයන් (IPPs) විසින් ක්‍රියාත්මක කළ අතර පුනර්ජනනීය බලශක්ති බලාගාර 109ක් කුඩා විදුලිබල නිෂ්පාදකයන් (SPPs) විසින් ක්‍රියාත්මක කරන ලදි. මෙයට කුඩා ජල බලාගාර, සූර්ය බලාගාර, සුළං බලාගාර සහ ජෛව ස්කන්ධ බලාගාර ඇතුළත් වේ. රට තුළ උත්පාදන ධාරිතාවය ඉහළ දැමීම සඳහා නව පුනර්ජනනීය බලශක්ති බලාගාර 5ක් 2012 වර්ෂයේ ප්‍රථම භාගය තුළ ආරම්භ කරන ලදි.

ඉහත වාර්තා 2012දී කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ අතර පාර්ශවකරුවන්ගේ තොරතුරු සඳහා කොමිසන් සභාවේ වෙබ් අඩවියෙහි පළකරන ලදි.

## බෙදාහැරීමේ බලපත්‍රලාභීන්ගේ කාර්යසාධන වාර්තාව 2011 සහ බෙදාහැරීමේ බලපත්‍රලාභීන්ගේ වාර්තාව (2012 ප්‍රථම භාගය)

ශ්‍රී ලංකාවේ විදුලිබල අංශය බෙදාහැරීමේ බලපත්‍රලාභීන් (DL) එනම්, ලංවීම කලාප 1, ලංවීම කලාප 2, ලංවීම කලාප 3, ලංවීම කලාප 4 සහ ලංකා විදුලිබල පුද්ගලික සමාගම යනුවෙන් පස් දෙනෙකුගෙන් සමන්විත වේ. වර්තමානයේ, බෙදාහැරීමේ බලපත්‍රලාභීන් විසින් පාරිභෝගිකයන් වෙත විදුලිය (බලශක්තිය) අලෙවිය වර්ෂයකට කිලෝ වොට් පැය (10 billion kWh) බිලියන 10ට ළඟාවෙමින් පවතී.

2012දී, කොමිෂන් සභාව විසින් 2011 වර්ෂය සහ 2012 ප්‍රථම භාගය සඳහා එක් එක් බෙදාහැරීමේ බලපත්‍රලාභීයෙකුගේ කාර්යසාධනය විශ්ලේෂණය කරමින් වාර්තාවන් දෙකක් සම්පාදනය කරන ලදි. 2011 වාර්තාව අනුව, බලශක්ති අලාභයන් සම්බන්ධයෙන් ඉඩදුන් උපරිම සීමාවන්ට (කොමිෂන් සභාව විසින් නියම ලෙස සඳහන් කළ අලාභයන්) පහළ මට්ටමක බලශක්ති අලාභයන් (බෙදාහැරීමේ ක්‍රියාවලිය තුළ දරන ලද) පවත්වා ගැනීමේ තත්ත්වයක සිටි බැවින්, හා සියලුම බෙදාහැරීමේ බලපත්‍රලාභීන්ගෙන් ඉහළම මට්ටම පවත්වා ගනිමින් ලං.වි.ම. කලාප 2 හොඳින් ක්‍රියා කර ඇති අතර ලං.වි.ම. කලාප 3 ඔවුන්ගේ ඉඩදුන් අලාභයන් ඉහළම මට්ටමක පැවතින බවට සොයා ගත් බැවින් දුර්වලව ක්‍රියා කර ඇති බව සහ සමස්තයක් වශයෙන් 2011දී, බෙදාහැරීමේ ක්‍රියාවලිය තුළ විදුලිය අපතේ යාම (බලශක්ති අලාභයන්) 7.5 % ත් බවට සොයා ගන්නා ලදි.

2011දී ඉහළම පාරිභෝගික වර්ධනය වාර්තා කළේ දෙවන විශාල පාරිභෝගික පදනම අයත් ලං.වි.ම. 1 කලාපයයි. විශාලතම අලෙවි ප්‍රදේශයක් සහිත ලං.වි.ම. කලාප 2ට විශාලතම පාරිභෝගික පදනම අයත් විය. සපයන ලද පාරිභෝගික ආරක්ෂාවේ තත්ත්වය අගය කරනු ලැබුවේ ලබාදුන් නව සැපයුම් සම්බන්ධතාවයන් සහ නිමකිරීමට ඇති ඉතිරිව පවතින සේවා සම්බන්ධතාවයන් සැලකිල්ලට ගැනීමෙනි. මෙම විශ්ලේෂණයේදී, ලං.වි.ම. කලාප 1 වෙනත් ලං.වි.ම. ට අයත් බෙදාහැරීමේ බලපත්‍රලාභීන් සාපේක්ෂව දුර්වලව ක්‍රියා කරමින් සිටින බවත් ලංවීමට අයත් හොඳම කාර්යසාධකයා 4වන බෙදාහැරීමේ බලපත්‍රලාභියා (DL4) බවත් නිරීක්ෂණය විය. 2011 වර්ෂය සඳහා සියලුම බලපත්‍රලාභීන් විසින් මිලදී ගත් මුළු බලශක්ති ප්‍රමාණය (kWh) කිලෝ වොට් පැය ඒකක (kWh) බිලියන 11කට ආසන්න වූ අතර සම්පූර්ණ අලෙවිය කිලෝ වොට් පැය ඒකක (kWh) බිලියන 9.8කට ආසන්න විය (වීදි ලාම්පුවල බලශක්ති පරිභෝජනය ඇතුළත් නොකර).

කොමිෂන් සභාව විසින් සම්පාදනය සහ විශ්ලේෂණය කළ බෙදාහැරීමේ බලපත්‍රලාභීන්ගේ කාර්යසාධන දත්ත අනුව, 2012 වර්ෂයේ ප්‍රථම භාගය තුළ බෙදාහැරීමේ බලපත්‍රලාභීන් පස්දෙනා විසින් සිදුකළ විදුලි අලෙවිය ඒකක බිලියන පහක් විය. බෙදාහැරීමේ බලපත්‍රලාභීන් ශ්‍රී ලංකා රුපියල් බිලියන 51ක් පමණ වියදම්කරමින් සම්ප්‍රේෂණ බලපත්‍රලාභීන්ගෙන් විදුලිය මිලදී ගෙන ඇති අතර බෙදාහැරීමේ ව්‍යාපාරයෙන් ලබාගත් ආදායම ශ්‍රී ලංකා රුපියල් බිලියන 71කි. ඊට අමතරව, 2012 වර්ෂයේ ප්‍රථම භාගය තුළ, සියලුම බෙදාහැරීමේ බලපත්‍රලාභීන් විසින් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් නියම කරන ලද ඉඩදුන් අලාභයන්ට පහළින් ඔවුන්ගේ ජාලයේ අලාභයන් පවත්වා ගැනීමට සමත්ව ඇති බව විශේෂයෙන් සඳහන් කළ යුතුය. ලංකා විදුලිබල පුද්ගලික සමාගම (LECO) අඩුම ජාලගත අලාභයන් වාර්තා කර ඇති අතර එම ප්‍රමාණය 4.5% ක් වූ අතර බෙදාහැරීමේ බලපත්‍රලාභී ලං.වි.ම. 2 විසින් ඉහළම ප්‍රමාණය (9.6%) වාර්තාකර ඇත. 2012 වර්ෂයේ ප්‍රථම භාගය තුළ, සමස්ත බලශක්ති අලාභයන් අඩුවීමක් වාර්තා කරමින් 7.4%ක් බවට පත් විය.

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් බෙදාහැරීමේ බලපත්‍රලාභීන්ගේ වාර්ෂික කාර්යසාධනය, ප්‍රගතිය පිළිබඳ විශ්ලේෂණය කිරීම සහ වාර්තා සම්පාදනය කිරීම තුළින් සියලුම පාරිභෝගිකයින්ට සහ පාර්ශ්වකරුවන්ට බෙදාහැරීමේ බලපත්‍රලාභීන්ගේ කාර්යසාධනය පිළිබඳ විනිවිදභාවයකින් තොරතුරු සැපයීමට පියවර ගෙන ඇත. තවදුරටත්, කොමිෂන් සභාව විසින් බෙදාහැරීමේ බලපත්‍රලාභීන් විසින් දරන ලද ජාලගත අලාභයන් මැනැවින් හඳුනා ගැනීම තුළින් බෙදාහැරීම් ක්‍රියාවලිය තුළ විදුලිය අපතේයාම අඩුකර ගැනීම සඳහා අවශ්‍ය පියවරයන් ගැනීමට බෙදාහැරීමේ බලපත්‍රලාභීන්ට සහාය වන අතර බෙදාහැරීමේ බලපත්‍රලාභීන්ගේ මෙහෙයුම් කාර්යක්ෂමතාවය වැඩි කිරීමේදී පිළිවෙළින් උදව් වේ.

2011 බෙදාහැරීමේ බලපත්‍රලාභී කාර්යසාධන වාර්තාව කොමිෂන් සභාවේ වෙබ් අඩවියෙන් දැන් ලබාගත හැකි අතර වාර්තාව අවසාන කිරීමට පෙර බෙදාහැරීමේ බලපත්‍රලාභීන්ගෙන් අදහස් සහ ප්‍රතිචාරයන් ලබාගනු ලැබූහ. 2012 (ප්‍රථම භාගය) බෙදාහැරීමේ බලපත්‍රලාභී කාර්යසාධන වාර්තාව දැනට අවසාන වෙමින් පවතින අතර 2013දී කොමිෂන් සභාවේ වෙබ් අඩවිය තුළින් පොදු මහජනතාවට ලබාගැනීමට කටයුතු කරනු ලැබේ.

## කාර්ය බහුල වේලාවේදී විදුලිබල ඉල්ලුමේ වෙනස් කිරීම පිළිබඳ අධ්‍යයන වාර්තාව

මෙම අධ්‍යයනයෙන් සවස්වරුවේ ඉතා ඉහළ විදුලි ඉල්ලුමක් සඳහා දායකවන්නාවූ සාධක ඇතුළත්ව පවත්නා පැතිකඩ විශ්ලේෂණය කරන ලද අතර අමතර වැඩිවීම අවම කිරීම සඳහා ප්‍රායෝගික පාරිභෝගික ඉල්ලුම් පැති කළමනාකරණ විකල්පය ගවේශණය කරන ලදි. මෙයට අමතරව, 2011 තුළ අයක්‍රමයන් වෙනස්වීම් පිළිබඳව පාරිභෝගික ප්‍රතිචාරයන් ඇතුළත් තොරතුරු සහ මේ සම්බන්ධ අදාළ නිගමනයන් සහ නිර්දේශයන් වාර්තාව තුළට ඇතුළත් කර ඇත. මෙම වාර්තාව කොමිෂන් සභාවේ වෙබ් අඩවියෙන් දැන් ලබාගත හැකිය.

## පාරිභෝගිකයින් බලශක්ති පරිභෝජනය කරන ආකාරයන් පිළිබඳ වාර්තාව

මෙම වාර්තාවේ විවිධ පාරිභෝගික ප්‍රභේදයන්ගේ විදුලි පරිභෝජන ආකාරයන් පිළිබඳව රැස්කළ තොරතුරු සහ සංඛ්‍යා ලේඛන සමග 2011 වර්ෂය තුළදී මෙම විවිධ පාරිභෝගික ප්‍රභේදයන්ගෙන් බලපත්‍රලාභීන් විසින් රැස්කළ ආදායම් පිළිබඳ තොරතුරු අඩංගු වේ. මෙම වාර්තාව කොමිෂන් සභාවේ වෙබ් අඩවියෙන් දැන් ලබාගත හැකිය.

## රෙගුලාසි/නියමයන්/ ක්‍රියා පටිපාටි/කේත/ක්‍රමවේද සහ මාර්ගෝපදේශ

# රෙගුලාසි

## කාර්යසාධන ප්‍රමිතීන් (බෙදාහැරීම) පිළිබඳ රෙගුලාසි

2009 අංක 20 දරණ ශ්‍රී ලංකා විදුලිබල පනත ප්‍රකාරව, විදුලිය සැපයුම් සේවාවන් සහ බලශක්ති මිනුම්කරණ සේවාවන්ගේ ආරක්ෂාව, තත්ත්වය, අඛණ්ඩතාවය සහ විශ්වාසනීයත්වය පිළිබඳ තාක්ෂණික සහ අනෙකුත් ප්‍රමිතීන් කොමිෂන් සභාව විසින් සකස් කර බලාත්මක කිරීම සිදුකෙරේ. මෙය අවසාන කිරීම සඳහා, 2012 වර්ෂය තුළ, කොමිෂන් සභාව විසින් ආසියානු සංවර්ධන බැංකුව (Project No. 7265- SRI) විසින් අරමුදල් ලබාදුන් විදුලිබල අංශයේ නියාමනය සඳහා හැකියාව වැඩි දියුණු කිරීම පිළිබඳ තාක්ෂණික සහයෝගී ව්‍යාපෘතියක් යටතේ බෙදාහැරීමේ බලපත්‍රලාභීන් සඳහා (බෙදාහැරීම) කාර්යසාධන ප්‍රමිතීන් පිළිබඳ රෙගුලාසීන් වැඩි දියුණු කරන ලදි. මෙම රෙගුලාසීන්ගෙන් විදුලිබලය බෙදාහැරීම සහ සැපයුම සම්බන්ධයෙන් බෙදාහැරීමේ බලපත්‍රලාභීන් විසින් අත්කරගත යුතු ප්‍රමිතීන් මෙන්ම අලාභ සහ අනතුරු සඳහා ගෙවිය යුතුවන වන්දි සහ එවැනි කාර්යසාධන ප්‍රමිතීන් සමග අනුකූල නොවීම සඳහා පැනවිය යුතු දඩමුදල් විස්තර කෙරේ. මෙම රෙගුලාසි සකස් කරනු ලැබුවේ ලං.වි.ම. සහ ලංකා විදුලිපුද්ගලික සමාගමේ (LECO) උපදේශකත්වයෙන් වන අතර අවසානයට ගෙන ඒමට පෙර මහජන අදහස් උදහස් ලබා ගන්නා ලදී. ඉන්පසු, මෙම රෙගුලාසී ගැසට් කිරීම සඳහා කොමිෂන් සභාව විසින් විදුලිබල හා බලශක්ති අමාත්‍යංශය වෙත අනුමත කර නිර්දේශ කරන ලදි.

## ආරක්ෂාව, ගුණාත්මක තත්ත්වය සහ අඛණ්ඩතාවය පිළිබඳ රෙගුලාසි

ඉහත සඳහන් අවශ්‍යතාවය ප්‍රකාරව, විදුලිබලය උත්පාදනය, සම්ප්‍රේෂණය, බෙදාහැරීම සහ සැපයීම තුළ මතුවන අනතුරුවලින් පොදු ජනතාව සහ පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම ඉලක්ක කරමින් ආරක්ෂාව, තත්ත්වය සහ අඛණ්ඩතාවය පිළිබඳ රෙගුලාසිඳ කෙටුම්පත් කරමින් සිටී. 2012 වර්ෂය තුළදී, කොමිෂන් සභාව විසින් ලං.වි.ම., ලංකා විදුලිපුද්ගලික සමාගම (LECO) සහ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව යන ආයතනයන්ගේ නියෝජිතයින්ගෙන් සමන්විත කමිටුවක් මගින් 2010 වර්ෂයේදී සකස් කරන ලද රෙගුලාසි කෙටුම්පත සමාලෝචනය කරන ලදි. ඉන්පසුව සමාලෝචනය කරන ලද රෙගුලාසි අවසන් මත විමසුම සඳහා ලං.වි.ම. සහ ලංකා විදුලිබල පුද්ගලික සමාගම වෙත ඉදිරිපත් කරන ලදි. පසුව, ජාතික පුවත්පත්වල පළකරන ලද දැන්වීම් තුළින් පොදු ජනතාවගෙන් මෙන්ම ඍජු තැපැල්ක්‍රමය මගින් කොටස්කරුවන්ගෙන් අදහස් උදහස් ලබා ගන්නා ලදි. අවසන් රෙගුලාසි කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීම සඳහා සූදානම්ව ඇති අතර ඉන්පසුව ගැසට් කිරීම සඳහා විදුලිබල හා බලශක්ති අමාත්‍යංශය වෙත යවනු ලැබේ.

# නියමයන්

## අයක්‍රමයන් සමාලෝචනය කිරීමේ ක්‍රියාපිළිවෙළ

2009 අංක 20 දරණ ශ්‍රී ලංකා විදුලිබල පනත ප්‍රකාරව, කොමිෂන් සභාවට සම්ප්‍රේෂණ සහ විශාල අලෙවි අයක්‍රමයන් මෙන්ම අයක්‍රමයන් සමාලෝචනය කිරීම සඳහා කාල සටහනක් ඇතුළත් කරන බෙදාහැරීමේ සහ සැපයීමේ අයක්‍රමයන් සමාලෝචනය කිරීම සඳහා ක්‍රියාපටිපාටියක් සහ සමාලෝචනය කිරීමේ ක්‍රියා පිළිවෙළට පාරිභෝගිකයන්ට සහ වෙනත් සම්බන්ධකම් ඇති පාර්ශ්වයන්ට සහභාගිවීම සඳහා විධිවිධාන අවශ්‍ය කෙරේ. මෙය අවසන් කිරීමට 2012 කාලපරිච්ඡේදය තුළ, කොමිෂන් සභාව විසින් අයක්‍රමයන් සමාලෝචනය කිරීමේ ක්‍රියාපටිපාටිය පිළිබඳ කෙටුම්පත් නියමයන් සහ සියළුම අයක්‍රම සමාලෝචනයන් හා අනුමත පිරිවැය පිළිබිඹුවන ක්‍රමවේදය තුළින් හඳුනාගත් ගැලපීම් ක්‍රියාත්මක කරන්නේ කෙසේද යන්න පිළිබඳව අයක්‍රමයන් සඳහාවන ඒකී ක්‍රමවේදය තුළට ඇතුළත් කළයුතු පරිච්ඡේදයක් සකස් කරන ලදි. ආසියානු සංවර්ධන බැංකුව (Project No. 7265- SRI) විසින් අරමුදල් සපයන විදුලිබල අංශ නියාමනය සඳහා හැකියා වර්ධනය පිළිබඳ තාක්ෂණික සහායෝගීතා වැඩසටහන යටතේ මේවා වැඩි දියුණු කරන ලදි. කොමිෂන් සභාව විසින් කෙටුම්පත් නියමයන් සහ ඒකී ක්‍රමවේදයට ඇතුළත් කළ යුතු පරිච්ඡේදය සමාලෝචනය කරමින් සිටී.

# කේත

## බෙදාහැරීමේ කේතය

2009 අංක 20 දරණ ශ්‍රී ලංකා විදුලිබල පනත ප්‍රකාරව, කොමිෂන් සභාව විසින් බලපත්‍රලාභීන් විසින් වැඩි දියුණු කළ යුතු, එවැනි තාක්ෂණික සහ මෙහෙයුම් කේතයන් සහ ප්‍රමිතීන් කලින් කළ අවශ්‍ය වන බැවින් අනුමත කිරීම සිදුකළ යුතුවේ. මීට අමතරව, ඉහත සඳහන් 2009 අංක 20 දරණ පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍ර ප්‍රකාරව, බලපත්‍රලාභීන් විසින් එවැනි මෙහෙයුම් කේතයන් ක්‍රියාත්මක කර පවත්වාගෙන යාම අනිවාර්ය කෙරේ. මෙය අවසන් කිරීමට 2012 කාලපරිච්ඡේදය තුළ, කොමිෂන් සභාව විසින් ආසියානු සංවර්ධන බැංකුව (Project No. 7265- SRI) විසින් අරමුදල් සපයන විදුලිබල අංශ නියාමනය සඳහා හැකියා වර්ධනය පිළිබඳ තාක්ෂණික සහයෝගීතා වැඩසටහන යටතේ බෙදාහැරීමේ කේත වැඩි දියුණු කිරීම සම්බන්ධීකරණය කරන ලදි. බෙදාහැරීමේ කේතය තුළින් බෙදාහැරීමේ බලපත්‍රලාභීන් සතු විදුලිය බෙදාහැරීමේ පද්ධතීන්ගේ මෙහෙයුම, නඩත්තුව සහ සංවර්ධනය පාලනය කරනු ලබන නිර්ණායකය නිශ්චිතව සඳහන් කෙරේ. කේතයේ මූලික පරමාර්ථය වන්නේ බෙදාහැරීමේ සේවාවන්ගේ විධිවිධාන සහ අවසන් භාවිතකරන්නා විසින් බෙදාහැරීමේ ජාලයට ඇති සම්බන්ධය නියාමනය කිරීමයි. අනුමත කළ කේතයන් ක්‍රියාත්මක කිරීම සඳහා සියලුම බෙදාහැරීමේ බලපත්‍රලාභීන් වෙත ඉදිරිපත් කරන ලදි.

## පද්ධති කේතය

ඉහත සඳහන් අවශ්‍යතාවය අනුව, 2012 කාලපරිච්ඡේදයේදී, කොමිෂන් සභාව විසින් ආසියානු සංවර්ධන බැංකුව (Project No. 7265- SRI) විසින් අරමුදල් සපයන විදුලිබල අංශ නියාමනය සඳහා හැකියා වර්ධනය පිළිබඳ තාක්ෂණික සහායෝගීතා වැඩසටහන යටතේ පද්ධති කේත වැඩි දියුණු කිරීම සම්බන්ධීකරණය කරන ලදි. පද්ධති කේතයන් තුළින් සම්ප්‍රේෂණ බලපත්‍රලාභීන් සහ කාර්යක්ෂමව, විශ්වාසනීයත්වයෙන්, භාවිතා කරන වෙනත් පුද්ගලයින් විසින් අනුගමනය කළ යුතු නියමයන්, මාර්ගෝපදේශයන් සහ ප්‍රමිතීන් නියම කරයි. කෙටුම්පත් කළ පද්ධති කේතය පිළිබඳ අදහස් විමසීම සඳහා ලං.වි.ම. වෙත ඉදිරිපත් කරන ලද අතර මෙම කාරණය සාකච්ඡා කිරීම සඳහා වැඩමුළුවක් පවත්වන ලදි. කෙටුම්පත් කළ පද්ධති කේතය ලං.වි.ම. ඉදිරිපත්කළ අදහස් මත පදනම් වී සමාලෝචනය කරමින් පවතින අතර ඉදිරියේදී කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට නියමිතය.

## සැපයුම් සේවා කේතය

2009 අංක 20 දරණ ශ්‍රී ලංකා විදුලිබල පනත සහ ඒ යටතේ නිකුත් කරන ලද බෙදාහැරීමේ සහ සැපයුම් බලපත්‍ර ප්‍රකාරව, බෙදාහැරීමේ බලපත්‍රලාභීන් විසින් පාරිභෝගිකයින්ගේ ආරක්ෂාව සඳහා අවශ්‍යයැයි කොමිෂන් සභාව සලකනු ලබන ඒවැනි විධිවිධාන අඩංගු කරමින් පාරිභෝගික ගැටලු සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු පටිපාටිය ඇතුළත් සංග්‍රහයක් ප්‍රකාශයට පත්කර පිළිපැදීම අවශ්‍ය වේ. සැපයුම් සේවා කේතය මගින් බිල්පත්, මීටර්, බිල්පත් ගෙවීම, විදුලිය සැපයුමක් ලබාදීම සඳහාවන කොන්දේසි සහ විධිවිධානයන්, පාරිභෝගික ආරක්ෂක තැන්පතු, බලපත්‍රලාභීන් විසින් පාරිභෝගික පරිශ්‍රයන්ට ප්‍රවේශවීම, බිල්පත් ගෙවීම පැහැරහැරින පාරිභෝගිකයින්, සම්බන්ධතාවයන් සහ විසන්ධි කිරීම්, රෝගී/ආබාධිත/විශ්‍රාමිකයන් සඳහා සේවා විධිවිධාන (ඇත්නම්), පැමිණිලි මෙහෙයවීමේ ක්‍රියාපටිපාටිය, සහ පාරිභෝගිකයන්ගේ වගකීම් හා බලපත්‍රලාභීන් සඳහා තොරතුරු විධිවිධාන වැනි පාරිභෝගිකයින්ට විදුලිබලය සැපයීමට අදාළවන සියලුම අංගයන් පිළිබඳ තොරතුරු ලබාදේ. 2012 කාලපරිච්ඡේදයේදී, ලංකා විදුලිබල මණ්ඩලය විසින් සකස් කරන ලද සැපයුම් සේවා කේතය කොමිෂන් සභාව විසින් නැවත කෙටුම්පත් කර අදහස් විමසීම සඳහා ලං.වි.ම. සහ ලංකා විදුලි පුද්ගලික සමාගම වෙත ඉදිරිපත් කරන ලදි. ඉන් අනතුරුව, දැනට කොමිෂන් සභාව විසින් සමාලෝචනය කරමින් සිටින සංශෝධිත කේතය ලංකා විදුලිපුද්ගලික සමාගමෙන් (LECO) ලැබුණි. ලං.වි.ම. විසින් එහි බෙදාහැරීමේ බලපත්‍රලාභීන් සම්බන්ධයෙන් සංශෝධිත කේත ඉදිරිපත්කර නොමැති බැවින්, දැනට කොමිෂන් සභාව විසින් ලං.වි.මේ බෙදාහැරීමේ බලපත්‍රලාභීන් හතර දෙනා සඳහා සාමාන්‍ය කේතයක් කෙටුම්පත් කරමින් සිටී. කොමිෂන් සභාව විසින් සැපයුම් සේවා කේත අවසාන කිරීමට පෙර මහජන තොරතුරු විමසීමක් පැවැත්වීමට සැලසුම් කරයි.

## ක්‍රමවේද

### බලශක්තිය ඇස්තමේන්තු කිරීමේ ක්‍රමවේදය

2009 අංක 20 දරණ ශ්‍රී ලංකා විදුලිබල පනත සහ ඒ යටතේ නිකුත් කරන ලද බෙදාහැරීමේ සහ සැපයුම් බලපත්‍ර ප්‍රකාරව, කිසියම් ගිවිසුමක් නොමැතිව, බලපත්‍රලාභියෙක්ට බලපත්‍රය තුළින් ලබාදී ඇති අය කිරීමේ යම් ක්‍රමයකට අනුකූලව යම් පාරිභෝගිකයෙක් වෙත සපයනු ලබන විදුලිය වෙනුවෙන් අයකළ හැකිය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, බෙදාහැරීමේ බලපත්‍රලාභීන්ට විදුලි මීටරයක් නොමැතිවීම, මීටරය වැරදියට දක්වන බව සොයාගැනීම, යම් මීටරයක වැරදි ක්‍රියාකාරිත්වය සහ යම් අයෙක් යම් මීටරයක ලියාපදිංචිය වෙනස් කරමින් සිටීම වැනි අවස්ථාවන්හිදී පාරිභෝගිකයින්ට සපයන බලශක්තිය ඇස්තමේන්තුකිරිම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීමට අවශ්‍ය වේ.

2012 කාලපරිච්ඡේදය තුළදී, මෙම ක්‍රමවේදය සකස්කර අවසන් කිරීම සඳහා පියවර ගැනුණි, එහිදී කොමිෂන් සභාව බෙදාහැරීමේ බලපත්‍රලාභීන්ගේ වර්තමාන භාවිතයන් නිශ්චය කර ගැනීම සඳහා ඔවුන් සමග කරුණු එක්රැස්කිරීමේ රැස්වීම් පවත්වූහ. ඉන්පසුව, කොමිෂන් සභාව ඉහත සඳහන් සිදුවීම් සඳහා විශේෂිත ක්‍රමවේදයන් වැඩි දියුණු කර අදහස් විමසීම සඳහා එය ලං.වි.ම. සහ ලංකා විදුලිබල පුද්ගලික සමාගම වෙත ඉදිරිපත් කළේය. කොමිෂන් සභාව විසින් දැනට ලංකා විදුලිපුද්ගලික සමාගමේන් (LECO) ලැබුණු අදහස් මත පදනම්ව එකී ක්‍රමවේදයන් සංශෝධනය කරමින් සිටී.

### උත්පාදනය, සම්ප්‍රේෂණය සහ බෙදාහැරීමේ බලපත්‍රලාභීන් සඳහා සමාදර්ශක සකස්කිරිමේ ක්‍රමවේදය

2002 අංක 35 දරණ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනත අනුව, කොමිෂන් සභාව හැකි අවස්ථාවන්හිදී ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව උපයෝගිතා සේවාවන් සඳහා සමාදර්ශක සකස්කරනු ලැබිය යුතුය. 2012 කාලපරිච්ඡේදය තුළදී, කොමිෂන් සභාව විසින් ලබාගතහැකි තොරතුරුවලින් සමාදර්ශක සැකසීමේ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමේ හැකියාව අධ්‍යයනය කරන ලදි. අධ්‍යයනයෙන් අරමුණු කලේ වඩා උසස් කාර්යසාධනයක් සහිත බෙදාහැරීමේ බලපත්‍රලාභීයා හඳුනා ගැනීම සඳහා වන උත්සාහයක් තුළ බෙදාහැරීමේ බලපත්‍රලාභීන් පස් දෙනාගේ කාර්යසාධන මට්ටම් සලකුණු කිරීමටයි. කොමිෂන් සභාව විසින් දැනට යෝජිත දර්ශකයන් සහ ආදර්ශ ගණනය කිරීම් සංශෝධනය කරමින් සිටී.



## මාර්ගෝපදේශ

### නියාමන ගිණුම්කරණය සඳහා මාර්ගෝපදේශ

2009 අංක 20 දරණ ශ්‍රී ලංකා විදුලිබල පනත සහ ඒ යටතේ නිකුත් කරන ලද විදුලි උත්පාදන බලපත්‍ර, විදුලි සම්ප්‍රේෂණ සහ තොග සැපයුම් බලපත්‍ර සහ විදුලිය බෙදාහැරීම් සහ සැපයුම් බලපත්‍ර අනුව, එවැනි බලපත්‍රලාභීන් විසින් ඉදිරිපත් කරන ලද සාමාන්‍ය ගිණුම්වලට වඩා වැඩි විස්තරාත්මක හෝ එයින් වෙනස්වන ගිණුම්කරණ තොරතුරු කොමිෂන් සභාවට කැඳවිය හැකි අතර ඒවා කොමිෂන් සභාව විසින් නියම වශයෙන් සඳහන් කළ යම් විස්තරයක් සහ යම් ආකෘතියක් අනුව විය යුතුය. බලපත්‍රලාභීන් විසින් දැනට ඉදිරිපත් කරන ලද සාමාන්‍ය ගිණුම්වල නියාමන අරමුණු සඳහා ප්‍රමාණවත් තොරතුරු අඩංගු නොවන බැවින් සහ බලපත්‍රලාභීන් අතර සංසන්දනයක් කළ නොහැකි බැවින්, නියාමන ගිණුම් සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ සකස් කිරීමට සැලසුම් කරයි. මේ සම්බන්ධයෙන්, 2012 කාලපරිච්ඡේදය තුළදී, කොමිෂන් සභාව විසින් එවැනි මාර්ගෝපදේශ වැඩි දියුණු කිරීමට සහ ඒවා ක්‍රියාත්මක කිරීමේදි සහාය වීමට අවශ්‍ය සුදුසුකම් සහිත පිළිගත් ජාත්‍යන්තර උපදේශන ආයතනයක සේවාව ලබාගැනීමට තීරණය කළේය.

### නියාමන අත්පොත සඳහා සංශෝධන

කොමිෂන් සභාවේ නියාමන අත් පොත කොමිෂන් සභාවේ කාර්යයන් පාලනය කරනු ලබන යහපාලනය සඳහා වු මාර්ගෝපදේශ සංග්‍රහයකි. 2012 කාලපරිච්ඡේදය තුළදී, කොමිෂන් සභාව විසින් ජාතික අවශ්‍යතාවය සහ කොමිෂන් සභාවේ අවශ්‍යතාවයන් සැලකිල්ලට ගැනීමෙන් එතෙක් පැවති නියාමන අත්පොත සංශෝධනය කිරීම ආරම්භ කරන ලදි.

# ඛනිජතෙල් අංශය

## ඛනිජතෙල් අංශයේ නීති පද්ධතීන් කෙටුම්පත්/සංශෝධනය කිරීමේදී සහායවීම

2012 කාලපරිච්ඡේදය තුළදී, ඛනිජතෙල් කර්මාන්ත අමාත්‍යාංශය විසින් නීතිපති දෙපාර්තමේන්තුව සමග 2002 අංක 33 දරණ ඛනිජ තෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනතට සහ පසුභාග ඛනිජතෙල් කර්මාන්තය නියාමනය කිරීමට කොමිෂන් සභාවට බලය පැවරීමට අදාළ වන 1961 අංක 28 දරණ ලංකා ඛනිජතෙල් සංස්ථා පනතට යෝජිත සංශෝධන පිළිබඳ සාකච්ඡාව අඛණ්ඩව සිදුකරන ලදි. යෝජිත සංශෝධන කොමිෂන් සභාවේ සහ ඛනිජතෙල් කර්මාන්ත අමාත්‍යාංශයේ උපදේශකත්වය යටතේ නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව විසින් නැවත කෙටුම් පත්කරනු ලැබ ඇත. දැනට, යෝජිත සංශෝධන සඳහා නීතිපති දෙපාර්තමේන්තුවෙහි අනුමැතිය සඳහා ඉදිරිපත්කර ඇති.

## ඡායාමාත්‍ර නියාමන භූමිකාව

ඛනිජතෙල් නිෂ්පාදනයන්ට පෙට්රල්, ඩීසල්, භූමිතෙල්, ගුවන්යානා ඉන්ධන, නාවික ඉන්ධන, දැවි තෙල්, එල්පී ගෑස් ඇතුළත්වන අතර ඛනිජ තෙල් සම්පත් වශයෙන් බොර තෙල්, ස්වාභාවික වායු සහ ද්‍රව, වායු හෝ අර්ධ ඝන තත්ත්වයෙන් පැවතියද හයිඩ්‍රෝකාබනේට් සළකනු ලැබේ. පසුභාග ඛනිජතෙල් කර්මාන්තය පහත සඳහන් කාර්යයන්ගෙන් සමන්විත වේ.

- ඛනිජතෙල් නිෂ්පාදන සහ ඛනිජ තෙල් සම්පත් ආනයනය සහ අපනයනය කිරීම
- ඛනිජතෙල් සම්පත් පිරිපහදු කිරිම සහ සංයෝග කිරීම හෝ ඛනිජතෙල් නිෂ්පාදන නිෂ්පාදනය කිරීම
- ඛනිජතෙල් නිෂ්පාදන සහ ඛනිජතෙල් සම්පත් ගබඩා කිරිම, බෙදාහැරීම සහ ප්‍රවාහනය කිරීම
- ඛනිජතෙල් නිෂ්පාදන තොග සහ සිල්ලරට අලෙවි කිරීම

වර්තමානයේදී පසුභාග ඛනිජතෙල් කර්මාන්තයේ නියාමනය කිරීම පාලනය කරනු ලබන්නේ 2002 අංක 33 දරණ ඛනිජතෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනත සහ 1961 අංක 28 දරණ ලංකා ඛනිජතෙල් සංස්ථා පනත මඟිනි. දැනට, ඛනිජතෙල් කර්මාන්ත අමාත්‍යවරයාට ඛනිජතෙල් කර්මාන්තය නියාමනය කිරීම සඳහා සියලු බලතල සතු වුවද, බලපත්‍ර නිකුත් කිරීමේදී, අවශ්‍යවන උපදෙස් සහ සහාය සම්බන්ධයෙන් 2002 අංක 2 දරණ බලශක්ති සැපයුම් (තාවකාලික විධිවිධාන) පනත යටතේ පිහිටුවනු ලැබූ බලශක්ති සැපයුම් කමිටුව (ESC) 2004දී අවලංගු කළ බැවින් නියාමන හිඩැසක් පවතී. ලංකා ඛනිජතෙල් සංස්ථා පනත සහ ඛනිජතෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනත ඛනිජතෙල් කර්මාන්තය සම්පූර්ණයෙන් නියාමනය කිරීම සඳහා කොමිෂන් සභාවට බලය පැවරීමට සංශෝධනය කරමින් පවතී.

## ලිහිසිතෙල් වෙළඳපල නියාමනය කිරීම

ලිහිසිතෙල් වෙළඳපල නියාමනය කිරීම සහ පාලනය කරනු ලබන්නේ 2002 අංක 33 දරණ ඛනිජතෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනත සහ 1961 අංක 28 දරණ ලංකා ඛණිංතෙල් සංස්ථා පනත මඟිනි.

ග්‍රීස් ඇතුළුව ලිහිසි තෙල් ආනයනය කිරිම, අපනයනය කිරීම, සංයෝග කිරීම, නිෂ්පාදනය කිරීම, අලෙවි කිරීම, සැපයීම සහ බෙදාහැරීම සඳහා රජයෙන් විශේෂ අවසර ලබාදීම අවශ්‍ය වේ.

වෙළඳපලට බාල නිෂ්පාදන් ඇතුළුවීම වැලැක්වීම සහතික කිරීම සඳහා අවසර ලබාදීම ප්‍රදානය කරනු ලබන්නේ සුදුසු තාක්ෂණික දැනුමක් සහිත සහ ප්‍රමාණවත් මූල්‍ය හැකියාවක් ඇති සුදුසුකම්ලත් පාර්ශ්වයන්ට පමණී.

රජය ලිහිසිතෙල්වල ඡායාමාත්‍ර නියාමන අයතනය වශයෙන් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව පත්කර ඇත. ලිහිසිතෙල් වෙළඳපලේ ඡායාමාත්‍ර නියාමන ආයතනය වශයෙන් කොමිෂන් සභාව විසින් ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශයට ලිහිසිතෙල් කර්මාන්තයේ ලිහිල්කරණය සම්බන්ධ ප්‍රතිපත්ති සහ නියාමන කාරණාවන් පිළිබඳ උපදෙස් ලබා දේ.

## ලිහිසිතෙල් ප්‍රමිතිකරණ සහ දැනුවත් කිරීම

### ලිහිසිතෙල් ප්‍රමිතිකරණ

ජාත්‍යන්තර වෙළඳපල තුළ, ලිහිසි තෙල්වල තත්ත්වය පාලනය කරනු ලබන්නේ ඇමරිකානු ඛනිජතෙල් ආයතනය (API) සහ ජපාන ඔටෝමොබයිල්ස් ප්‍රමිති සංවිධානය (JASO) මෙන්ම එක් එක් උත්පාදක උපකරණ නිෂ්පාදකයන් වැනි සංවිධානයන් විසින් නිකුත් කරනු ලැබූ ප්‍රමිතීන් මඟිනි.

2012දී, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව මෝටර් රථ අංශය සඳහා ලිහිසිතෙල් ප්‍රමිතීන් සකස් කිරීමටත් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය ග්‍රීස් සඳහා ප්‍රමිතීන් සකස් කිරීමටත් ආරම්භ කරන ලද අතර ප්‍රමිතිකරණ කමිටුවේ සාමාජිකයෙක් වශයෙන්ද සේවය කරන ලදි. රජය විසින් ශ්‍රී ලංකාව තුළ ලිහිසිතෙල් හා ග්‍රීස් සඳහා අවම ප්‍රමිතීන් වශයෙන් මෙම ප්‍රමිතීන් නියම කර ඇත.
2012දී, කොමිෂන් සභාව විසින් ලිහිසි තෙල් වෙළඳපලේ ඡායාමාත්‍ර නියාමකයා වශයෙන් එහි භූමිකාව තුළ පහත සඳහන් කාර්යයන් සිදුකරන ලදි.

## ලිහිසිතෙල් වෙළඳපල සඳහා යෝග්‍යතා ලේඛනය (RFQ) සඳහා අයදුමක් සකස් කිරීම

කොමිෂන් සභාව විසින් ලිහිසිතෙල් සහ ග්‍රීස් වෙළඳපලේ ෂායාමාත්‍ර නියාමකයා වශයෙන් එහි භූමිකාව තුළල ලිහිසි තෙල් වෙළඳපලට ඇතුළුවීමට නව කර්මාන්තකරුවන් සඳහා ලේඛනයක් සහ මාර්ගෝපදේශයක් සකස් කරන ලදි. කෙටුම්පත් කළ ලේඛනය සහ මාර්ගෝපදේශය ඛණිජ තෙල් කර්මාන්ත අමාත්‍යංශයට ඉදිරිපත් කරනු ලැබූ අතර කොමිෂන් සභාව දැනට ඉදිරිපත් කළ කෙටුම්පත පිළිබඳව අමාත්‍යංශයෙන් උපදෙස් සහ ප්‍රතිචාර අපේක්ෂාවෙන් සිටී.

## ලිහිසිතෙල් කර්මාන්තය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන්

මහජනතාව සහ අනෙකුත් කොටස්කරුවන් අතර ලිහිසිතෙල් ප්‍රමිතීන්ට අයත්වන්නාවූ ලිහිසිතෙල් භාවිතය සහ තාක්ෂණික අංගයන් සම්බන්ධයෙන් දැනුම වර්ධනය කිරීමේ අරමුණින් සහ කොමිෂන් සභාව ලිහිසිතෙල් වෙළඳපලේ ෂායාමාත්‍ර නියාමකයා වශයෙන් එහි භූමිකාව තුළ ලිහිසිතෙල් කර්මාන්තය පිළිබඳව වැඩමුළුවක් ඛණිජතෙල් කර්මාන්ත අමාත්‍යංශයේ සහයෝගිත්වයෙන් 2012 සැප්තැම්බර් මස 11 දින සංවිධානය කරන ලදි.

ඛණිජතෙල් කර්මාන්ත අමාත්‍යංශයේ ලේකම් ආචාර්ය ආර්. එච්. එස්. සමරතුංග මහතා විසින් කොළඹ සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේදී පැවති වැඩමුළුවේදී මූලික දේශනය පවත්වන ලදි. ලිහිසිතෙල් වෙළඳපලේ යෙදී සිටින්නන්, මෝටර් රථ ආනයනකරුවන්, රේගු දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය ඇතුළු පුද්ගලික සහ රාජ්‍ය අංශයෙන් 100ට වැඩි සහභාගිකයන් එම අවස්ථාවට පැමිණි අතර එහිදී ලිහිසිතෙල් පිළිබඳව තොරතුරු ඇතුළත් පත්‍රිකාවක් ලිහිසිතෙල් භාවිතා කරන්නන් අතර බෙදාදීම සඳහා ලිහිසිතෙල් වෙළඳපලේ යෙදී සිටින්නන් වෙත බාර දුන්හ.

වැඩමුළුවේ පිළිගැනීමේ කථාව සිදු කරනු ලැබුවේ ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ සභාපති ජනාධිපති නීතිඥ ආචාර්ය ජයතිස්ස ද කොස්තා මහතා විසිනි. කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් දමිත කුමාරසිංහ මහතා මහජන උපයෝගීතා කොමිෂන් සභාව සහ අංශ නියාමනය කිරීම පිළිබඳ කථාකළ අතර ලිහිසි තෙල් කර්මාන්තයේ උපදේශක ආචාර්ය ගාමිණී අමරසේකර මහතා විසින් ලිහිසි තෙල් තාක්ෂණය යන මැයෙන් වැඩමුළුව අමතන ලදි. චෙව්රන් ලුබ්රිකන්ට්ස් ලංකා පුද්ගලික සමාගමේ කළමනාකරණ අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී කිෂු ගෝමස් මහතා විසින් කර්මාන්තරුවන්ගේ දෘෂ්ටිකෝණයෙන් නියාමන පරිසරය සමාලෝචනය කිරීම පිළිබඳ දේශනයක් පැවැත්වූ අතර කොමිෂන් සභාවට අනුයුක්ත වී සිටින ඛණිජතෙල් කර්මාන්තයේ උපදේශක රාජා අමරතුංග විසින් ලිහිසිතෙල් කර්මාන්තයේ නියාමනය-වර්තමානය සහ අනාගතය යන මැයෙන් වැඩමුළුව අමතන ලදි. වැඩමුළුව Q&A සැසියක් සමග පවත්වන ලදි.



## දැනට පවතින ලිහිසිතෙල් ගිවිසුම් අළුත්කිරීම

2012 වර්ෂය තුළ කොමිෂන් සභාව විසින් අත්සන් කරන ලද දැනට පවතින ගිවිසුම් දහ තුනක් (13) අතරින් ලිහිසිතෙල් ගිවිසුම් හයක් (06) කොමිෂන් සභාව විසින් අළුත්කරන ලදි. මෙසේ අලුත්කරන ලද ගිවිසුම් පහතින් දැක්වේ.

| සමාගම | ආයතනය |
|---|---|
| • ටොයෝටා ට්සුසෝ සමාගම | ටොයෝටා ලංකා පුද්ගලික සමාගම |
| • ඉන්දියන් ඔයිල් සමාගම | ලංකා අයිඕසී පිඑල්සී |
| • ටෝටල් ලුබ්රිකන්ට්ස් ඉන්දියා සමාගම | නවලෝක ඒබීසී ලුබ්රිකන්ට්ස් පුද්ගලික සමාගම |
| • ඇස්ලන්ඩ් ඉන්ක් | යුනයිටඩ් මෝටර්ස් ලංකා ලිමිටඩ් |
| • බාරට් පෙට්රෝලියම් කෝර්පරේෂන් | ටීවීඑස් ඔටෝමොබයිල්ස් ප්‍රයිවට් ලිමිටඩ් |
| • සිනොපෙක් සමාගම | ඉන්ටර් ඕෂන් ලුබ්රිකන්ට්ස් ලිමිටඩ් |

# අනෙකුත් කාර්යයන්

## විදුලිබල කර්මාන්තයේ පිළිබඳ තොරතුරු

විදුලිබල අංශයේ තොරතුරු සියලුම පාර්ශවකරුවන්ට මෙන්ම විදුලි පාරිභෝගිකයින්ට වැදගත් වන අතර එසේ වන්නේ මේ මගින් නියාමන ක්‍රියාවලිය තුළ කාර්යක්ෂම සහභාගිත්වය සඳහා පහසුකම් ඇති කිරීම සහ විදුලි කර්මාන්තයේ කාර්යසාධනය පිළිබඳ දැනුවත්කම විශාල වශයෙන් වැඩිකිරීමට හේතුවෙනි.

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ වෙබ් අඩවිය, මාධ්‍ය, අත් පත්‍රිකා, සම්මන්ත්‍රණ සහ වැඩමුළු තොරතුරු පතුරුවා හැරීම සඳහා භාවිතා කරනු ලබන ප්‍රධාන මාධ්‍යයන් වේ. ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් 2009 නොවැම්බර් මාසයේදී එහි වෙබ් අඩවිය ආරම්භ කරන ලදි. විදුලිබල පනත, රෙගුලාසි, නියමයන්, කේතයන් සහ වගකීම්, තීරණයන්, ඉල්ලුම් පත්‍ර, අංශයේ තොරතුරු යනාදිය වැනි ප්‍රධාන තොරතුරු වෙබ් අඩවිය තුළින් මහජනතාවට සහ කොටස්කරුවන්ට ලබාගත හැකි විය. 2012දී අලුතින් වැඩි දියුණු කළ භාවිතයාට මිත්‍රශීලී වෙබ් අඩවියක් පිළිබඳව අදහසක් පහළ වූ අතර එය 2013දී නිල වශයෙන් ආරම්භ කරනු ලැබේ. තොරතුරු කාර්යක්ෂමව සහ දිවයිනේ සෑම ප්‍රදේශයකටම පතුරුවා හැරීම පිණිස සියලුම රාජ්‍ය භාෂා තුනෙන් ලබාගත හැකිවන පරිදි තවදුරටත් පහසුකම් සපයන ලදි. වෙබ් අඩවියේ ප්‍රධාන අංගය (සහ භාවිතා කරන්නන් අතර වඩාත් ජනප්‍රිය) වී ඇත්තේ අවශ්‍ය මූලික තොරතුරු පේනු කිරීම මගින් ඔවුන්ගේ විදුලි බිල් පිළිබඳව සැකයන් පැහැදිලි කර ගැනීමට ඉඩ ලබාදෙන සහ ගෙවිය යුතු ප්‍රමාණය මත ප්‍රතිචාරයන් ලබාගැනීමේ "විදුලි බිල් ගණනය කිරීම"යි.

## පරීක්ෂා කිරීම්

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් එහි පරීක්ෂා කිරීමේ බලතල අනුව ශ්‍රී ලංකාව තුළ විදුලිබල උත්පාදනය කිරීමේ සහ සම්ප්‍රේෂණ පද්ධතීන්ගේ ආරක්ෂාව, අඛණ්ඩතාවය, තත්ත්වය, විශ්වාසනීයත්වය සහ කාර්යක්ෂමතාවය පරීක්ෂා කිරීම සඳහා වගකිව යුතුය. මෙම හැකියාව තුළ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව පාරිභෝගික මට්ටම තුළ සහ බලපත්‍රලාභීන්ගේ උත්පාදනය සහ සම්ප්‍රේෂණ ක්‍රියාවලිය තුළ සිදුවන විශේෂිත අනතුරු සහ සිදුවීම් විමර්ශණය කිරීම සඳහා වගකිව යුතු වේ. පොදු ජනතාවට විදුලි ආරක්ෂාව පිළිබඳ දැනුම වැඩි කිරීම සහ අයක්‍රමයන් සඳහා යෙදවුම් ලබාදීම සහ ක්ෂේත්‍ර මට්ටමේ නිරීක්ෂණයන් මත පදනම්ව රෙගුලාසි සකස් කිරීමද එම බලතලවල කොටසක් වේ.

2012 වර්ෂය තුළදී, කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය විසින් සිදුකළ පහත සඳහන් ක්ෂේත්‍රයන්ට අදාළවන පරීක්ෂණයන්

| පරීක්ෂා කිරීමේ වර්ගය | පරීක්ෂා කිරීම් ගණන |
|---|---|
| විදුලි රැහැන් මංපෙත් අවසරපත් | 10 |
| අය ක්‍රමය | 9 |
| විදුලි මනු නිරවද්‍යතාවය | 1 |
| විදුලි සැර වැදීම | 2 |

## සම්බාධක පිළිබඳ නිර්දේශ

VII වන පරිච්ඡේදය පරිදි 2009 අංක 20 දරණ ශ්‍රී ලංකා විදුලිබල පනතින් විස්තර කරන ලද වරදවල් සහ රෙගුලාසීන් මත විදුලිබල පනත යටතේ වරදක් සඳහා කොමිෂන් සභාවේ ලිඛිත අනුමැතියකින් තොරව කිසිදු නඩුවක් ආරම්භ කළ නොහැකිය. 2012 වර්ෂය කාලපරිච්ඡේදයේදී විදුලිය සම්බන්ධ වැරදි පිළිබඳ සම්බාධක නිර්දේශයන් 123ක් ලංවිම සහ ලංකා විදුලිබල පුද්ගලික සමාගම වෙනුවෙන් අනුමත කරන ලදි.

## විදුලියට සම්බන්ධ මාරක අනතුරු පරීක්ෂා කිරීම සහ වාර්තා කිරීම

2012 කාලපරිච්ඡේදය තුළ විදුලිබල පද්ධතිය තුළ ආරක්ෂක දෝෂයන්ගේ පැහැදිලිව පෙනෙන අංගයන් හඳුනාගනු ලැබූ අතර මෙම දෝෂයන් නව ආරක්ෂණ රෙගුලාසීන් තුළට ඇතුළත් කිරීමේ ක්‍රියාවලියක නිරත වෙමින් සිටී.

## ආදායම් මීටර්වල කාර්යසාධනය සහ නිරවද්‍යතාවය පිළිබඳ පරීක්ෂණ වාර්තාව

2012දී කොමිෂන් සභාව විසින් ශ්‍රී ජයවර්ධනපුර ප්‍රදේශයේ සසම්භාවී නියැදි ක්‍රමයක් තුළින් කාර්යසාධනය සහ නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා වසර 15ට වඩා පැරණි ආදායම් මීටර් 350ක් පරීක්ෂා කිරීම ආරම්භ කරන ලදි. මෙහිදී ලබාගත් දත්ත විශ්ලේෂණය කර සොයාගැනීම් පිළිබඳ වාර්තාවක් සකස් කරන ලදි. වාර්තාවේ පිටපතක් සමග අවශ්‍ය කරන අනාගත ක්‍රියාමාර්ගයන් 2013 ජනවාරියේදී ලං.වි.ම. ට යවනු ලැබේ.

## හඳුනාගත් ප්‍රධාන රාජ්‍ය ආයතනවල විදුලි ආරක්ෂාව පිළිබඳ පරීක්ෂා කිරීම

කොමිෂන් සභාව විසින් 2012 වර්ෂය තුළදී ප්‍රධාන රාජ්‍ය ආයතනවල පරීක්ෂා කිරීම් 12ක් අවසන් කරන ලදි. ඒවා අතර කළුබෝවිල මහා රෝහල, කළුතර මහා රෝහල සහ සෙත් සෙවන වැඩිහිටි නිවාසය සහ කුරුණෑගල මහා නගර සභාව සහ සාප්පු සංකීර්ණය ඇතුළත් වේ. මෙම සෝදිසි කිරීම්වල සොයාගැනීම් සහ නිර්දේශයන් කොමිෂන් සභාව විසින් වාර්තාවක් ලෙසට සම්පාදනය කර ඇත.

## “විදුලිබලය ආරක්ෂිතව භාවිතා කිරීම” පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්

2012දී සතුන් මැරීම සඳහා නීති විරෝධීව විදුලිය ටැප් කිරීමේ අනතුරු පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් ලං.වි.මේ ප්‍රධාන ඉංජිනේරුවරයාගේ සහභාගිත්වයෙන් හඟුරන්කෙත ප්‍රදේශයේදී පවත්වන ලදි. එමෙන්ම විදුලි ආරක්ෂාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් අනුරාධපුර තිසාවැව මහා විද්‍යාලයේදීද පවත්වන ලදි.

## පද්ධතියට සම්බන්ධ පුනර්ජනනීය බලශක්ති බලාගාර සහ පද්ධතියෙන් පරිබාහිර කුඩා ජලවිදුලි බලාගාර පරීක්ෂා කිරීම්

2012 වර්ෂයේ රත්නපුර දිස්ත්‍රික්කය තුළ කොලොන්න කුඩා ජල විදුලි බලාගාරය සහ කොලොන්න, වෙලේවත්ත පද්ධතියෙන් පරිබාහිර කුඩා ජල විදුලි බලාගාරය තුළ විදුලිබල ආරක්ෂණ අනුකූලතා පරීක්ෂණයන් දෙකක් පවත්වන ලදි.

# මානව සම්පත්

2012 වසරේදී කොමිෂන් සභාව සතු මානව සම්පත් පුහුණුවීම් සහ වර්ධනය, හානි පූර්ණ පරිපාලනය, අලුතෙන් බඳවා ගැනීම, සේවානියුක්තික සබඳතා, වැඩ පරිසරය සහ සමස්ත කාර්යක්ෂමතාව තුළින් කොමිෂන් සභාවේ අභිවෘද්ධිය සාක්ෂත් කරගත්තේය.

2012 වසරේදී අර්ථාන්විතව සිදුකළ කාර්යමණ්ඩල වර්ධනයත් සමඟ 22 යුත් නව කාර්යමණ්ඩලයක් කොමිෂන් සභාව සතු විය. මෙම නවක කාර්යමණ්ඩල බඳවා ගැනීමත් සමඟ ඔවුන්ගේ පරමාර්ථ, ප්‍රවීණත්වය සහ අත්දැකීම් මෙම කර්මාන්තයේ දක්ෂ ලෙස වර්තමාන විදුලිබල කර්මාන්තයේ ජාතික අවදානම් තත්ත්වය සමනය කරන්නට මහෝපකාරී විය.

2012 දෙසැම්බර් මස 31 වන දින සිට කාර්ය මණ්ඩලය

| තනතුර | අනුමත කළ සේවක සංඛ්‍යාව | | සේවක සංඛ්‍යාව 2012 දෙසැම්බර් මස 31 සිට | |
|---|---|---|---|---|
| | ස්ථිර | කොන්ත්‍රාත් පදනම | ස්ථිර | කොන්ත්‍රාත් පදනම |
| අධ්‍යක්ෂ ජනරාල් | 1 | – | 1 | – |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් | 1 | – | 1 | – |
| කොමිෂන් සභා ලේකම් | 1 | – | 1 | – |
| අධ්‍යක්ෂ | 5 | – | 4 | 1 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ | 12 | – | 7 | 3 |
| සහකාර අධ්‍යක්ෂ | 13 | – | 13 | – |
| කළමණාකරණ සහකාර | 8 | – | 8 | – |
| රියදුරු | 4 | – | 2 | 2 |

# 2013 වැඩසටහන්

කොමිෂන් සභාව විසින් 2013 -2015 වර්ෂය සඳහා කොමිෂන් සභාවේ ආයතනික සැලැස්ම තුළ පැහැදිලිව සඳහන් කරන ලද ඉලක්කයන් අනුව 2013 වර්ෂය වෙනුවෙන් ව්‍යාපෘති 38ක් සකස් කර ඇත. මෙම ඉලක්කයන් පහතින් දැක්වේ.

විදුලි පාරිභෝගිකයින්ට ආරක්ෂාව සහතික කිරීම

- විදුලි අයකුමය සහ සේවා ගාස්තුවල සාධාරණත්වය සුරක්ෂිත කිරීම
- බලශක්ති සුරැකුම, සංරක්ෂණය, කාර්යක්ෂම භාවිතය සහ පාරිසරිකමය සම්බන්ධයන් සුරක්ෂිත කිරීම
- විදුලිබල සැපයුමේ තත්ත්වයේ සහ විශ්වාසනීයත්වයේ ප්‍රමාණවත් බව සුරක්ෂිත කිරීම
- විදුලිබලයෙන් පුද්ගලයින්ට සහ දේපලවලට ආරක්ෂාව සහතික කිරීම
- පාර්ශවකරුවන් වෙත විදුලිබල අංශයේ තොරතුරු බෙදා හැරීම
- තරගකාරිත්වය වැඩි කිරීම සඳහා විදුලිබල වෙළඳපල ව්‍යුහයක් ස්ථාපිත කිරීම
- වෙළඳපල තුළ පසුභාග ඛණිජතෙල් නිෂ්පාදන නියාමනය කිරීම

මෙම අරමුණු 2002 අංක 35 දරණ මහජන උපයෝගිතා කොමිෂන් සභා පනත සහ 2009 අංක 20 දරණ විදුලිබල පනතින් නියම කර ඇති පරමාර්ථ සහ කාර්ය තුළින් ජනිත වේ.

මෙම අරමුණු අනුව කොමිෂන් සභාව විසින් 2013 වර්ෂය සඳහා සකස් කරන ලද ව්‍යාපෘතින් පිළිබඳ කෙටි විස්තරයක් පහතින් දැක්වේ.

| අභිමතාර්ථය | ව්‍යාපෘති විස්තරය | ක්‍රියාකාරකම් | ප්‍රතිලාභ |
|---|---|---|---|
| **විදුලි පාරිභෝගිකයන්ගේ ආරක්ෂාව සහතික කිරීම** | විදුලිබල කර්මාන්ත රෙගුලාසි පිළිබඳ පාරිභෝගික දැනුවත්භාවය ඉහළ නැංවීම | ■ සම්මන්ත්‍රණ 20 ක් | ■ පාරිභෝගික සුභසෙත සුරැකීමට සහයවීම |
| | කේත සේවා සැපයීම: පාරිභෝගිකයන් සඳහා සැපයීමට අවශ්‍ය විදුලිබල සේවයේ ගුණාත්මකබව හා මාදිලිය පිළිබඳ ප්‍රතිචාර ලබා ගැනීම | ■ කේත ක්‍රියාත්මක කිරීම පිළිබඳ දත්ත හා ප්‍රතිචාර ලබාගැනීම | ■ සපයා ඇති සේවයේ ගුණාත්මකභාවය පිළිබඳ සිය අදහස් දැක්වීමට පාරිභෝගිකයන් වෙත අවස්ථාවක් සපයා දීම |
| | ප්‍රාදේශීය පාරිභෝගික සංගම් පිහිටුවීම | ■ පළාත් 9 තුළ පාරිභෝගික සංගම් පිහිටුවීම<br>■ පාරිභෝගික උපදේශක කොමිසම සඳහා අනුග්‍රහය දැක්වීම | ■ විදුලිබල කර්මාන්ත රෙගුලාසි පිළිබඳ පාරිභෝගික දැනුම ඉහළ නැංවීම<br>■ මෙම ක්‍රියාවලිය පිළිබඳ පාරිභෝගික දැනුම ගොඩනැගීම හා ඊට සහභාගීවීමේදී වේදිකාවක් ලෙස කටයුතු කිරීම<br>■ පාරිභෝගිකයන් වෙනුවෙන් වඩා හොඳ සේවාවක් සැපයීම |
| | පාරිභෝගිකයන් දැනුවත්කිරීම සඳහා අත් පත්‍රිකා සැකසීම | ■ අත් පත්‍රිකා සැකසීම<br>■ දැනුවත් කිරීමේ වැඩසටහන්වලදී බෙදාහැරීම<br>■ කාර්යාලය ඇතුළු අදාළ ස්ථානවල තොරතුරු ලබා ගත හැකි ස්ථාන පිහිටු වීම | ■ බලශක්ති නිමානය ගණනය සහ බලශක්ති මාපක පිළිබඳ පාරිභෝගික දැනුම ඉහළ නැංවීම<br>■ පාරිභෝගික අයිතිවාසිකම් සුරැකීම |
| | පාරිභෝගික අයිතිවාසිකම් හා බැඳීම් ප්‍රකාශනයක් මුද්‍රණය කිරීම | ■ ප්‍රකාශනයක් මුද්‍රණය කිරීම | ■ සාමාන්‍ය ජනතාව පාරිභෝගික අයිතිවාසිකම් හා බැඳීම් පිළිබඳ දැනුවත්වීම |

| | | | |
|---|---|---|---|
| **විදුලිබල සේවා ගාස්තු සහ අයක්‍රමයන්හි සාධාරණභාවය සුරක්ෂණය කිරීම** | 2013-2015 දක්වා කාලය තුළ විදුලිය සම්ප්‍රේෂණයේදී සහ බෙදාහැරීමේදී ඇතිවන අවභාවිතය අවම කිරීම | ■ කළමණාකරන සහ ආයෝජන අසමාර්ථයන් තාක්ෂණික සාධක ඔස්සේ අධ්‍යනය කිරීම<br>■ බලපත්‍රලාභීන්ට පාඩු වූ ඉලක්ක සඳහා යථාර්තරූපී ජාලයක් ඇති කිරීම | ■ බලපත්‍රලාභීන් සඳහා කාර්යක්ෂමව ක්‍රියාකිරීම වැඩිදියුණු කිරීම<br>■ බලපත්‍රලාභීන් සඳහා බලශක්ති කතිකාවත් වැඩිදියුණු කිරීම සහ ආදයම් වර්ධනය කිරීම<br>■ ජනන ආයෝජන අවශ්‍යතා අවම කිරීම<br>■ දිගුකාලීන ආකර්ෂණීය පාරිභෝගික අයක්‍රමයන්<br>■ මෙම අංශයේ ආයෝජන වර්ධනය කිරීම |
| | සාධ්‍යතාව අධ්‍යනයඃ විදුලි පාරිභෝජන කාලයට සරිලන ලෙස අනුකූලනය මගින් පාරිභෝගික විදුලිබිල පහත දැමීම | ■ සාධ්‍යතාව අධ්‍යනය මෙහෙයවීම | ■ ජාතික ධාරිතාවට ඇති ඉල්ලුම පහත හෙලීම<br>■ පද්ධති පිරිවැය පූර්ණ වශයෙන් අවම කිරීම<br>■ සැපයුම් පිරිවැය අවම කිරීම<br>■ සමස්ත විදුලි පාරිභෝගික නාස්තිය අවම කිරීම<br>■ අනාගත අයක්‍රම දත්ත ප්‍රතිශෝධනය |
| | විදි විදුලි පහන් කාර්යක්ෂමව කළමණාකරනය කිරීම | ■ ස්ථාපිත කිරීම සහ කණු සිටුවීම පිළිබඳ මාර්ගෝපදේශ වර්ධනය කිරිම<br>■ දේශීය සංවිධාන මගින් වියදම් රැස්කර ගැනීමේ උපායමාර්ගය | ■ පාරිභෝගික අයක්‍රම වැඩි දියුණු වීම<br>■ කාර්යක්ෂම වීදි විදුලි පහන් කළමණාකරනය පිළිබඳ ප්‍රතිපත්ති උපදේශනය |
| | විදුලිබල සැපයුම් අඩාල වීම් කළමණාකරනය | ■ විශේෂිත අඩාලවීම් පිළිබඳ සොයාබැලීමට පවතින දත්ත ප්‍රසාරණය කිරීම | ■ සැපයුම් දාමයේ අඩාලවීම් අවම කිරීම<br>■ පාරිභෝගිකයන් සඳහා අයක්‍රමයන් වැඩිදියුණු කිරීම |
| | අති විශාල පාරිභෝගික සැපයුම් වර්ගීකරණයට සඳහා වූ අයක්‍රම යෝජනාවන්හි පාරදෘශ්‍යභාවය සහ විශ්වාසනීයත්වය සහතික කිරීම | ■ අයක්‍රම යෝජනා සඳහා විශේෂිත ක්‍රියාමාර්ගයක් අනුගමනය කිරීම | ■ පාර්ශවකරුවන් හට අයක්‍රම යෝජනා සඳහා ප්‍රතිචාර දැක්විය හැක<br>■ සාධාරණත්වය සහ පාරදෘශ්‍යභාවය වර්ධනය විය |
| | වර්ධනය වු අයක්‍රම යෝජනාවන්හි පාරදෘශ්‍යභාවය සහ විශ්වාසනීයත්වය සහතික කිරීම හා පාරිභෝගිකයන් සඳහා ගැලපීම | ■ අයක්‍රම යෝජනා ක්‍රියාවට නැංවීම සහ ගැලපුම් වර්ධනය සඳහා මාර්ගෝපදේශනය<br>■ විදුලිබල කර්මාන්තයේ ප්‍රවීණයන් සමඟ උපදේශන සම්මන්ත්‍රණ පැවැත්වීම | ■ පාර්ශවකරුවන් හට අයක්‍රම යෝජනා සඳහා ප්‍රතිචාර ලබා ගැනීම<br>■ සාධාරණත්වය සහ පාරදෘශ්‍යභාවය වර්ධනය විය |
| | රෙගුලාසි තීරණ නිර්මාණය වර්ධනය කිරීමඃ රෙගුලාසි ගිණුම්කරණය පිළිබඳ මාර්ගෝපදේශය | ■ රෙගුලාසි ගිණුම්කරණය පිළිබඳ මාර්ගෝපදේශන මාලාවක් නිකුත් කිරීම සහ එය වර්ධනය කිරීම | ■ රෙගුලාසි ක්‍රියාමාර්ග පිළිබඳ පාරදෘශ්‍යභාවය සහ විශ්වාසනීයත්වය වර්ධනය විය |
| **බලශක්ති සුරක්ෂිතභාවය, සංරක්ෂණය, කාර්යක්ෂම භාවිතය සහ පාරිසරික අදාළවීම සහතික කිරීම** | පුනර්ජනනී බලශක්ති (NCRE) අංශය සඳහා ප්‍රතිපත්ති වර්ධනයට ආධාර කිරීම | ■ මහජන උපදේශන පැවැත්වීම සහ වෙනත් රටවල පුනර්ජනනී බලශක්ති (NCRE) ප්‍රතිපත්ති අධ්‍යනය<br>■ පුනර්ජනනී බලශක්ති (NCRE) තාක්ෂණවේදය සඳහා බලපෑම් කළ හැකි බාධක තක්සේරු කිරීම<br>■ පුනර්ජනනී බලශක්ති (NCRE) තාක්ෂණවේදය සඳහා උපායමාර්ග ක්‍රමවත් කිරීමට අනුග්‍රහය දැක්වීම | ■ ආනයනය කරන ලද පොසිල ඉන්ධන මත වු රඳා පැවැත්ම අවම කිරීම<br>■ බලශක්ති ගාස්තුවල නිරන්තර වෙනස්වීම අඩු කිරීම සහ දීර්ඝකාලීන අයක්‍රම වර්ධනය විය<br>■ පුනර්ජනනී බලශක්ති ක්ෂේත්‍රයේ ආයෝජන දිරිමත් කිරීම<br>■ පුනර්ජනනී බලශක්ති (NCRE) උප අංශයන් පිළිබඳව රජයට තොරතුරු සැපයීම |
| | 2013- 2017 කාල පර්ච්ඡේදය සඳහා විදුලිබල ඉල්ලුම පූර්වකථනය කිරීම | ■ බෙදාහැරීමේ බලපත්‍රලාභීන්ගෙන් යෙදවුම් ලබාගැනීම<br>■ බලය සහ බලශක්ති අවශ්‍යතාවය පූර්වකථනය | ■ බලශක්ති අංශයේ අයෝජන සඳහා තොරතුරු සැපයීම<br>■ 2013/17 සඳහා බලශක්ති සුරක්ෂිතභාවය පවත්වාගෙන යාම |

| | | | |
|---|---|---|---|
| **බලශක්ති සුරක්ෂිතභාවය, සංරක්ෂණය, කාර්යක්ෂම භාවිතය සහ පාරිසරික අදාළවීම සහතික කිරීම** | පාරිභෝගිකයන්ට බලශක්ති පාරිභෝජන රටාව ගලපා ගැනීමට සහය වීමඃ ආකර්ශනීය ගණනය කිරීම් සංකල්පයක් අදාලකරගැනීම තක්සේරු කිරීම | ■ ආකර්ශනීය ගණනය කිරීම් තාක්ෂණවේදය යොදාගැනීම තක්සේරු කිරීම | ■ තාක්ෂණවේදය පිළිබඳ මූල්‍යමය අනුමිතිය තක්සේරු කිරීම සහය වීම<br>■ පාරිභෝගිකයන්ට බලශක්ති පාරිභෝජන රටාව ගලපා ගැනීමට සහය වීම<br>■ බලශක්ති නාස්තිය අවම කිරීම |
| | කුඩා කර්මාන්ත පාරිභෝගිකයන් මගින් බලශක්ති කාර්යක්ෂමතාවය වර්ධනය කර ගැනීම | | ■ බලශක්ති සංරක්ෂණයට නැඹුරු වූ කර්මාන්ත පාරිභෝගිකයන්<br>■ දේශීයව දීර්ඝකාලීන බලශක්ති සුරක්ෂිතභාවය ඇති කිරීම |
| | ජාතික විදුලිබල පද්ධතියෙන් බැහැරව පිහිටි කුඩා පරිමාණ විදුලිබලාගාර සඳහා ප්‍රශස්ථ මෙහෙයුම් යාන්ත්‍රණය පිළිබඳ දැනුම ප්‍රවර්ධනය | ■ උපචාරයන් පෙළක් පැවැත්වීම | ■ ජාතික විදුලිබල පද්ධතියෙන් බැහැරව පුනර්ජනනී බලශක්ති (NCRE) කාර්යක්ෂමව භාවිතා කරන අන්දම පිළිබඳ ග්‍රාමීය ප්‍රජාවට තොරතුරු සැපයීම<br>■ ජාතික ධාරිතාවට ඇති ඉල්ලුම පහත හෙළීම |
| | පුනර්ජනනී බලශක්ති (NCRE) ව්‍යාපෘති සඳහා වන මෙහෙයුම් සහ නඩත්තු කටයුතු වලට සම්බන්ධ කාර්යමණ්ඩලයේ සුරක්ෂිතභාවය තහවුරු කිරීම | පුනර්ජනනී බලශක්ති (NCRE) සැලසුම් 20ක ආරක්ෂක වැඩසටහන් සහ අනුකූලතා දැකවීම් අධීක්ෂණය කිරීම | ■ පුනර්ජනනී බලශක්ති (NCRE) වැඩසටහන් සඳහා සම්බන්ධ වන කාර්යමණ්ඩලයේ සුරක්ෂිතභාවය තහවුරු කිරීම<br>■ දීර්ඝකාලීන බලශක්ති සුරක්ෂිතභාවය සහ සංරක්ෂණය සහතික කිරීම |
| | විදුලි ජනනය සඳහා අවශ්‍ය ප්‍රමිතීන් පිහිටුවීම | ■ අන්තර්ජාතික වශයෙන් ප්‍රමුඛස්ථානයේ රැඳීසිටින දර්ශක හඳුනාගැනීම<br>■ බලපත්‍රලාභින් සමග වැඩමුළු පැවැත්වීම | ■ බලපත්‍රලාභින්ට ඔවුන්ගේ ක්‍රියාකාරකම්වලදී නායකත්වය ගැනීමට හැකිවීම<br>■ වර්තමාන අඩාලවීම සහ අකාර්යක්ෂමතා පවතින ප්‍රදේශ හඳුනාගැනීම<br>■ දේශීයව දීර්ඝකාලීන බලශක්ති සුරක්ෂිතභාවය ඇති කිරීම |
| **විදුලිබල සැපයුමෙහි තත්වය සහ විශ්වාසනීයත්වයේ ප්‍රමාණාත්මක බව සහතික කිරීම** | විදුලිබල සැපයුමෙහි තත්වය සහ විශ්වාසනීයත්වයේ ප්‍රමාණාත්මකබව සහතික කිරීමට ජාල කේතය සහ බලාත්මක කිරීමේ මණ්ඩලය | ■ ජාල කේතය සහ බලාත්මක කිරීමේ මණ්ඩලය පිහිටුවීම | ■ ආරක්ෂාකාරී සහ විශ්වාසනීය විදුලිබල සැපයුමක් සහතික කිරීම |
| | සුදුසු ප්‍රමිතීන් ඇතිකිරීම සහ විදුලිබල බෙදාහැරීමේ ක්‍රියාවලියට නායකත්වය සැපයීම | ■ පරීක්ෂණ මණ්ඩලයක් පිහිටුවීම | ■ ප්‍රමිතීන් පිහිටුවීමේදී පාර්ශවකරුවන්ගේ නියෝජනය |
| | බලපත්‍රලාභින්ට විදුලිබල බෙදාහැරීමේ ක්‍රියාවලියට නායකත්වය සැපයීම (CEB සහ LECO) | ■ ක්‍රියාකාරී ප්‍රමිතින් හඳුනාගැනීම සහ විශේෂිකරණය | ■ බලපත්‍රලාභින් සහ පාරිභෝගිකයන් අතර වූ ආරවුල් ඉවත්කිරීම<br>■ පාරිභෝගික සුහසිද්ධිය ආරක්ෂා කිරීමට උපකාර කිරීම |
| | විදුලිබල සැපයුමෙහි තත්වය සහ විශ්වාසනීයත්වය වැඩිදියුණු කිරීම | ■ ජාතික සැපයුමේ විදුලිබල ශක්ති ප්‍රමාණය, සංඛ්‍යාතය, ප්‍රසංවාද අන්තර්ගතය ගණනය කිරීම | ■ වර්තමාන විදුලිබල සැපයුමෙහි තත්ත්වය සහ විශ්වාසනීයත්වය වැඩිකිරීම<br>■ නව කර්මාන්ත ආයෝජකයන් ධෛර්යමත් කිරීම |
| | බලපත්‍රලාභින්ගේ සේවාස්ථානවල විදුලිබල ආරක්ෂාව | ■ ක්‍රියාපටිපාටියේ සුරක්ෂිතභාවය පරීක්ෂා කිරීම<br>■ සාධාරණ වාර්තාවක් සැකසීම | ■ ආරක්ෂක උපද්‍රව අවම කිරීම<br>■ අනතුරු අවම කිරීම |
| | විදුලි බිල්පත් ගෙවීමේදී පාරිභෝගික ආරක්ෂා සහතික කිරීම | ■ අහඹුලෙස නියැඳිකරගත් බලශක්ති මීටර වසර 13 පමණ පැරණිය<br>■ වසර 13 පමණ පැරණි බලශක්ති මීටර ප්‍රතිස්ථාපනය නිශ්චය කිරීම විශ්ලෙෂණය කිරීම | ■ විදුලි බිල්පත් නිමානයේදී විශ්වාසනීයත්වය වැඩිදියුණු කිරීම |

| | | | |
|---|---|---|---|
| **විදුලිබල සුරක්ෂිතභාවය සහතික කිරීම** | විදුලි බලශක්ති සුරක්ෂිතභාවය සහ ආරක්ෂව පිළිබඳ දැනුවත්භාවය | ■ DVD සම්පාදනය කිරීම<br>■ DVD ද්විතීය පාසල් තුළින් මහජනයාට ලබාගත හැක | ■ මහජන අධ්‍යාපනය සහ තරුණ පරපුර විදුලි බලශක්ති සුරක්ෂිත<br>■ පාසල් පද්ධතියේ විදුලි බලශක්ති සුරක්ෂිතභාවය පිළිබඳ දැනුවත්බව වැඩිවීම<br>■ ශ්‍රී ලංකාවේ පාසල් තුළ සිදුවන විදුලිය සම්බන්ධ අනතුරු අවම කිරීම<br>■ විදුලිසැර වැදීම්වලට සම්බන්ධ සමාජ ආර්ථික ප්‍රතිවිපාක අවම කිරීම |
| | විදුලිබල සුරක්ෂිතභාවය සඳහා මාර්ගෝපදේශයන් සූදානම් කිරීම | ■ තාක්ෂණික මාර්ගෝපදේශයන් සඳහා සූදානම් කිරීම<br>■ මාර්ගෝපදේශයන් කලින් කලට යාවත්කාලීන කිරීම | ■ විදුලිබල සුරක්ෂිතභාවය පිළිබඳ මාර්ගෝපදේශයන් ගැන දැනුවත්බව වැඩිවීම<br>■ පාරිභෝගික ආරක්ෂා සහතික කිරීම |
| | ආරෝග්‍යශාලා සඳහා විදුලිබල සුරක්ෂිතභාවය පිළිබඳ මාර්ගෝපදේශයන් | ■ මූලික රෝහල් 12 පරීක්ෂාවට ලක්කිරීම<br>■ ආරෝග්‍යශාලා සඳහා මාර්ගෝපදේශයන් සැකසීම | ■ රෝහල් තුළ සිදුවන විදුලිය සම්බන්ධ අනතුරු අවම කිරීම<br>■ සෞඛ්‍ය අංශයේ අවශ්‍යතාවලට ගැලපෙන වැඩිදියුණු කළ විදුලි සැපයුම්ක්‍රම සැළසුම් කිරීම<br>■ රෝහල තුළ විදුලිබල ස්ථාපිත නිරීම වර්ධනය වීම<br>■ පද්ධතියේ විශ්වාසනීයත්වය සහ කාර්යක්ෂමභාවය සහතික කිරීම සඳහා වූ ක්‍රියාපටිපාටිය වර්ධනය වීම<br>■ රෝහල්වල විදුලිබල සුරක්ෂිතභාවය පිළිබඳ කළමණාකරන වගකීම් ඉස්මතු කිරීමට සහය වීම |
| | පාසල් සඳහා විදුලිබල සුරක්ෂිතභාවය පිළිබඳ මාර්ගෝපදේශයන් | ■ විදුලිබල සුරක්ෂිතභාවය පිළිබඳ මාර්ගෝපදේශයන් සැකසීම<br>■ මාර්ගෝපදේශයන් පිළිබඳ පිටපත් භාෂා තුනෙන්ම මුද්‍රණය කිරීම<br>■ පාසල් පද්ධතිය තුළ එය බෙදි හැරීම | ■ පාසල් පද්ධතියේ විදුලි බලශක්ති සුරක්ෂිතභාවය පිළිබඳ දැනුවත්බව වැඩිවීම<br>■ ශ්‍රී ලංකාවේ පාසල් තුළ සිදුවන විදුලිය සම්බන්ධ අනතුරු අවම කිරීම<br>■ විදුලිසැර වැදීම්වලට සම්බන්ධ සමාජ ආර්ථික ප්‍රතිවිපාක අවම කිරීම |
| | විදුලිය සම්බන්ධ මාරක අනතුරු සහ විදුලි සැර වැදීම්වලින් පරීක්ෂණය සම්බන්ධයෙන් ක්‍රියාපටිපාටියක් සකස් කිරීම | ■ නිල පරීක්ෂණය වශයෙන් සම්බන්ධයෙන් ක්‍රියාපටිපාටියක් වර්ධනය කිරීම | ■ විදුලි සැර වැදීම්වලට මූලික වන හේතු විමර්ශනය කිරීමට උනන්දුවක් දක්වන පාර්ශවයන්ට ඒ සඳහා උපකාර කිරීම<br>■ පීඩාවට පත් පාර්ශවයන්ට වන්දි ගෙවීමේ සාධාරණ යාන්ත්‍රණයක් හඳුන්වා දීම<br>■ රටේ පවතින නීතිමය රාමුව තුළ වගනිවයුතු පාර්ශවයන් සඳහා ක්‍රියාමාර්ග ගැනීමග<br>■ ආරක්ෂාව සම්බන්ධයෙන් විදුලිබල පද්ධතියේ පවතින අඩුලුහුඩුකම් අවම කිරීමට පවතින රෙගුලාසි සංශෝධන සඳහා නිර්දේශ ලබා දිම |

| | | | |
|---|---|---|---|
| **විදුලි ක්ෂේත්‍රයේ තොරතුරු ප්‍රචාරණය කිරීම** | විදුලිය සම්බන්ධ අනතුරු සහ සිද්ධි පිළිබඳ පරිසනක දත්ත ගබඩාවක් වැඩිදියුණු කිරීම | ■ පරිසනක දත්ත ගබඩාවක් වැඩිදියුණු කිරීම<br>■ කර්මාන්තයට අදාල වන තොරතුරු ප්‍රකාශයට පත්කිරීම | ■ වඩා කාර්යක්ෂම නියාමන යාන්ත්‍රණයක් වැඩිදියුණු කිරීම |
| **විදුලිබල වෙළඳපොළ ආකෘතියක් පිහිටුවීම මඟින් තරඟකාරීත්වය ප්‍රවර්ධනය** | නව විදුලිබල ජනන යන්ත්‍රෝපකරණ සඳහා මෘදු ක්‍රියාපටිපාටියක් වර්ධනය කිරීම | ■ විශේෂ උපදෙස් ලබා ගැනීම<br>■ උචිත ලෙස සම්පාදන මාර්ගෝපදේශ වර්ධනය කිරීම<br>■ කෙටුම්පත්කිරීමට රෙගුලාසි සැකසීම සහ ව්‍යවස්ථාදායක අනුමැතිය සඳහා යොමුකිරීම | ■ බලශක්ති අංශයේ ආයෝජන සඳහා මූල්‍ය කාර්යක්ෂමතාවය ප්‍රවර්ධනය<br>■ දීර්ඝකාලීනව පාරිභෝගිකයන් වෙනුවෙන් විදුලිබල අනුපාතය පහත හෙලීම<br>■ විදුලි සැපයුමේ විශ්වාසනීයත්වය වර්ධනය කිරීම |
| **පසුභාග ඛණිජතෙල් නිෂ්පාදන අංශය නියාමනය** | ඛණිජතෙල් කර්මාන්තය පිළිබඳ දැනුම වර්ධනය කිරීම | ■ පාර්ශවකරුවන් සඳහා වැඩමුළු පැවැත්වීම | ■ විදුලිබල රෙගුලාසි පිළිබඳ පාරිභෝගිකයන්ගේ දැනුවත්භාවය වැඩිවීම<br>■ කර්මාන්ත රෙගුලාසි පිළිබඳ පාරිභෝගිකයන්ගේ දැනුවත්භාවය වැඩිවීම<br>■ වෙළඳපළ නිෂ්පාදනයන්හි ගුණාත්මකභාවය පිළිබඳ තොරතුරු වැඩි වීම |
| | ඛණිජතෙල් කර්මාන්තයට අදාළ PUCSL විසින් පාලනය කරන ක්‍රියාකරකම් හඳුනාගැනීම | ■ ආකෘති සකස්කිරීම | ■ මෙහෙයුම් ක්‍රියාවට නැංවීමේදී භාවිතා කරන නියමයන් සහ කොන්දේසි හඳුනාගැනීමට සහය වීම |
| | ඛණිජතෙල් කර්මාන්තයට කර්මාන්තය සඳහා අයදුම්පත් යොමුකළ කර්මාන්තකරුවන් අනුකූලනය | ■ ඛණිජතෙල් නිෂ්පාදන මිල ගණන් පාලවයේ පවතින බව හඳුනාගැනිම<br>■ ගැසට්පත්‍ර තොරතුරු | ■ පාර්ශවකරුවන්ගේ උනන්දුව ආරක්ෂා කර ගැනීමට සහය වීම |
| | ඛණිජතෙල් නිෂ්පාදන ප්‍රවාහනය සහ ගබඩාකරනයට අදාල නීතිරීති වර්ධනය කිරීම | ■ නීතිරීති සහ කොන්දේසි විශේෂීකරණය<br>■ මහජනතාව සඳහා තොරතුරු විවෘත කිරීම | ■ අනතුරුවලින් පුද්ගලයන් සහ දේපළ අරක්ෂා කර ගැනීම |
| | ඛණිජතෙල් නිෂ්පාදනවල මිල පාලනයට සහය වීමට මිල නියම කිරීමේ ක්‍රමවේද වර්ධනය | ■ ක්‍රමවේද වර්ධනය | ■ පාරිභෝගික ආකර්ෂණය ආරක්ෂා කර ගැනීම<br>■ මෙහෙයුම් සඳහා බලපත්‍රලාභීන්ගේ මූල්‍යමය ජීව්‍යතාව සහතික කිරීම |

# විගණකාධිපති වාර්තාව

**විගණකාධිපති දෙපාර්තමේන්තුව**
**கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்**
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல / My No. FB/J/PUC/FA/2012
ඔබේ අංකය / உமது இல / No.
දිනය / திகதி / Date 22 අගෝස්තු 2013

සභාපති,
ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව,

ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

---

ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ 2012 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව පනතේ 34 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන අතර මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් කොමිෂන් සභාවේ සභාපතිවරයා වෙත 2013 ජුනි 13 වන දින නිකුත් කරන ලදි.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණනකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට අයත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ඉදිරිපත් කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරණ මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයන් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිලිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

විගණනයේ ගණන් බැලීම්වලට අනුව සමාලෝචිත වර්ෂයේ පාරිතෝෂිත වෙන් කිරීම රු.2,080,272 ක් වුවද, එය රු.1,749,232 ක් ලෙස ගිණුම් ගත කිරීම හේතුවෙන් පාරිතෝෂිත වෙන් කිරීම රු.331,040, ක් අඩුවෙන්ද, වර්ෂයේ ලාභය රු.331,040 ක් වැඩියෙන් ද ගිණුම් ගත කර තිබුණි.

#### 2.2.2 පැහැදිලි නොකළ වෙනස්කම්

පරිගණක හා කාර්යාල උපකරණ, ලී බඩු සහ සවිකිරීම් හා මෘදුකාංග යන ස්ථාවර වත්කම් විෂයයන් තුනක් සම්බන්ධයෙන් 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල හා ස්ථාවර වත්කම් උපලේඛන අතර පිළිවෙලින් රු.892ල519 ක්ද, රු.2,009,952 ක්ද හා රු.92,822 ක්ද වෙනසක් නිරීක්ෂණය විය.

#### 2.2.3 නීති, රීති හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 120 (අ) වගන්තිය | උපයන විට ගෙවීම් බදු රු.546,440 ක් ඊලඟ මාසයේ 15 දින වන විට දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) මුදල් රෙගුලාසි 341 | ආදායම් රැස් කිරීම සඳහා භාවිතා කරන කුවිතාන්සි පොත් සඳහා උප පත්‍රිකා පොත් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (ඇ) මු.රෙ.387 | 2012 දෙසැම්බර් 31 දිනට මුදල් පොතේ ශේෂය ඉක්මවා එකතුව රු.1,437,745 ක චෙක්පත් නිකුත් කර තිබුණි. |
| (ඈ) මු.රෙ.756 (5) | 2012 වර්ෂය සඳහා නියමිත ආකෘති පත්‍ර භාවිත කරමින් භාණ්ඩ සමීක්ෂණය විධිමත් ලෙස සිදුකර නොතිබුණි. |
| (ඉ) 2000 ජනවාරි 31 දිනැති අංක පීඑෆ්/පීඊ/6 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 24 ඡේදය | ඉකුත් වර්ෂවලදී මෙන්ම සමාලෝචිත වර්ෂයේදීද සේවකයන් විසින් ගෙවිය යුතු එකතුව රු.665,579 ක්ව උපයන විට ගෙවීම් බදු කොමිෂන් සභාවේ අරමුදලෙන් ගෙවා නොතිබුණි. |
| (ඊ) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක හා උපාංග ලේඛනය නිසි පරිදි යාවත්කාලීන කර නොතිබුණි. |

#### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු පහත සඳහන් ගණුදෙනු සඳහා දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් වී නොතිබුණි.

i. කොමිෂන් සභාව විසින් 2012 වර්ෂයට ගිණුම්ගත කර තිබූ රු.160,470,441 ක වටිනාකමින් යුතු ජර්නල් සටහන් 234 ක් සඳහා විධිමත් අනුමැතියකින් යුතු මූලාශ්‍ර ලියවිලි ඉදිරිපත් කර නොතිබුණි.

ii. විදේශ ගමන් සහ පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වූ නිලධාරින්ට සංයුක්ත සහ අනියම් දීමනා ගෙවීමේදී වවුචරයන්හි ගමන් විස්තරය, ගමන සඳහා ගතවූ කාලය හා රේටයන් ගණනය, ගුවන් ගමන් විස්තර, විදේශ අනුග්‍රහයන් ලබාදීම ආදී විස්තර කිසිවක් ඇතුළත් නොකර ගෙවන ලද මුළු මුදල පමණක් සඳහන් කර තිබුණි.

# 3 මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ කොමිෂන් සභාවේ අරමුදල් මෙහෙයුම්වලින් රු.29,967,560 ක වියදම් ඉක්මවූ ආදායම් අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා වියදම් ඉක්මවූ ආදායමේ අතිරික්තය රු.55,978,423 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.26,010,863 ක අඩුවීමක් දක්නට ලැබුණි. මෙම අඩුවීම ඉකුත් වර්ෂයට වඩා සමාලෝචිත වර්ෂයේ වියදම් රු.47,669,634 කින් වැඩිවීම බලපා තිබුණි.

# 4 මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 වර්ෂය සඳහා පිළියෙල කර ඇති ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රධාන කාර්යයන් 7 ක් යටතේ ඉටු කළ යුතු කාර්යයන් 66 ක් පැවතියද 2012 දෙසැම්බර් 31 දින වන විට එම කාර්යයන් 32 ක් ක්‍රියාත්මක මට්ටමේ පැවතුණි.

(ආ) 2012 වර්ෂය තුළ කොමිසමට ලැබුණු මහජන පැමිණිලි 446 ක් අතරින් 425 කට විසඳුම් ලබාදී තිබූ අතර තවත් 41 සම්බන්ධයෙන් 2012 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) 2002 අංක 35 දරණ ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභා පණතේ 14(2)(1) වගන්තිය යටතේ වූ විදුලිය, ජලය හා ඛනිජ තෙල් කර්මාන්ත සම්බන්ධයෙන් නියාමන කටයුතු කිරීම සඳහා 2004 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා පුනරාවර්තන වියදම් ලෙස රු.356,177,653 ක් හා ප්‍රාග්ධන වියදම් ලෙස රු.61,383,125 ක් වැය කර තිබුණි. 2009 අංක 23 දරණ ශ්‍රී ලංකා විදුලිබල පනත අනුව විදුලි කර්මාන්තයේ නියාමන කටයුතු 2009 අප්‍රේල් 08 දින සිට කොමිෂන් සභාව ඉටු කරනු ලබන අතර, ජලය හා ඛනිජ තෙල් කර්මාන්තය සම්බන්ධයෙන් අදාළ පනත් සංශෝධන අනුමත නොවීම නිසා එම කර්මාන්තවල නියාමන කටයුතු ඉටු කිරීමට නොහැකි වී තිබුණි. නමුත් අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව ලිහිසි තෙල් සම්බන්ධ නියාමන කටයුතු සභාවට පැවරුණි.

(ඈ) 2009 අංක 20 දරණ ශ්‍රී ලංකා විදුලිබල පණතේ 9 වන වගන්තිය ප්‍රකාරව මෙ.වො. 25 ට වැඩි ධාරිතාවකින් විදුලිය උත්පාදනය කරන 2007 අංක 7 දරණ සමාගම් පණත අනුව පිහිටුවා ඇති රජයේ කොටස් ප්‍රාග්ධනය සියයට 50 කට අඩු සමාගම්වලට විදුලිය උත්පාදනය කිරීම සඳහා බලපත්‍ර නිකුත් කළ නොහැක. දැනටමත් ධාරිතාව මෙ.වො. 25 ඉක්මවා විදුලිය උත්පාදනය කරන සමාගම් 06 කට බලපත්‍ර නිකුත් කර නොතිබූ අතර, එම සමාගම් විසින් උත්පාදනය කරනු ලබන විදුලිය ශ්‍රී ලංකාවේ විදුලිබල ධාරිතාවයට එක් කර ගෙන තිබිණි. එම තත්ත්වය නිවැරදි කිරීමට 2012 වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. එකී සමාගම් අවශ්‍යතා සපුරා නොමැති බැවින් බලපත්‍ර නිකුත් කිරීමට නොහැකි බව සභාපති දැනුම් දී ඇත.

(ඉ) ලිහිසි තෙල් වෙළඳපල කටයුතු තුළ සමාගම් 14 ක් ලියාපදිංචි වී තිබුණු අතර, ඉන්වොයිස් වටිනාකමෙන් සියයට 0.5 ක විචල්‍ය ලියාපදිංචි ගාස්තුවලින් රු. මිලියනය ඉක්මවා ගනුදෙනු කර තිබුණේ සමාගම් 11 ක් පමණි. ඒ අනුව 2012 වර්ෂයේ සමාගම් 11 කින් විචල්‍ය ලියාපදිංචි කිරීමේ ගැස්තු ලෙස රු.32,704,473 ක් කොමිෂන් සභාව වෙත ලැබී තිබුණි.

## 4.2 අනාර්ථික ගණුදෙනු

සේවක භාරකාර අරමුදල් (ETF) ගෙවීම් ප්‍රමාද වීම නිසා රු.8,571 ක අධිභාරයක් ගෙවා තිබුණි.

# 5 ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 විගණක කමිටු

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2003 ජුනි මස 02 දිනැති අංක පීඊඩී 12 චක්‍රලේඛයේ 7.4.1ඡේදය අනුව වර්ෂයකට අවම වශයෙන් විගණන කමිටු රැස්වීම් 4 ක් පැවැත්විය යුතු වුවද 2012 වර්ෂය සඳහා කොමිසම විසින් පවත්වා තිබුණේ රැස්වීම් 02 ක් පමණි.

## 5.2 අයවැය පාලනය

### ප්‍රතිපාදන ඉක්මවා වියදම් දැරීම

2012 වර්ෂයේ වියදම් වර්ග 4 ක් සඳහා සලසා තිබූ ප්‍රතිපාදන ඉක්මවා රු.1,137,023 ක් වියදම් කර තිබුණි.

# 6 පද්ධති හා පාලනය

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතයේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කල යුතුය.

(අ) ආයෝජනය කිරීම
(ආ) ආදායම් පාලනය
(ඇ) ස්ථාවර වත්කම් පාලනය

එච්.ඒ.එස්.සමරවීර
විගණකාධිපති

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව
இலங்கைப் பொதுப்பயன்பாடுகள் ஆணைக்குழு
PUBLIC UTILITIES COMMISSION OF SRI LANKA

ඔබේ අංකය
உமது இல
Your No. } PUCSL/FIN/AGD/02

අපේ අංකය
எமது இல
Our Ref No. }

19.06.2013
විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
බත්තරමුල්ල

ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනය පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

---

ඔබ විසින් 2012 ජුනි 13 දින අපවෙත එවන ලද ඔබගේ අංක එෆ්බී/ජේ/පීයූසී/එෆ්ජ් /2012 දරණ කෙටුම් පත් වාර්තාව සම්බන්ධයෙන් මාගේ අදහස් ඔබගේ කාරුණික අවදානයට යොමු කරවමි.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

සේවකයන් 6 දෙනෙකුගේ ජීවන වියදම් දීමනාව නොසලකා පාරිතෝශික ගණනය කිරීමෙන් පාරිතෝශික වෙන් කිරීම රු.331,040/- ක් අඩුවෙන් ගිණුම් ගත වී ඇත. මෙම වරද ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

### 2.2.2 පැහැදිලි නොකළ වෙනස්කම්

අ) මෘදුකාංග අතර වෙනසට පහත දැක්වෙන වැරදි හේතු වී ඇත.

1. ස්ථාවර වත්කම් ලේඛනයට පහත දැක්වෙන සටහන් ඇතුළත් නොවීම

| | |
|---|---|
| Symentec Antivirus Software | 58.800.00 |
| QB Pro 2011- User License | 34.272.00 |
| | 93.072.00 |
| 2. රු.52,250 න් මෘදුකාංගයක් රු.52,500 ක් ලෙස ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුලත් වීම. | (250.00) |
| | 92,822.00 |

පරිගණක හා කාර්යාල උපකරණ වල වෙනස්කම් හඳුනා ගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇති අතර ඉදිරියේදී නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ.

ආ) 2001 වර්ෂයේ සමුච්චිත අරමුදල් ගිණුමට රු. 769,400 ක් බැරවී පාරිතෝෂික සඳහා ආයෝජන ගිණුමට රු. 769,400 ක් හරවූ වරද නිවැරදි කිරීමෙන් හා වෙනත් පූර්ව වර්ෂ ගැලපුම් ලෙස රු. 3,675 ක් සමුච්චිත අරමුදල ගැලපීමෙන් වර්ෂයේ ආරම්භක ශේෂය රු. 119,749,761,89 ක් ලෙස ඉදිරියට ගෙනවිත් ඇත.

ඇ) හඳුනා නොගත් රු. 754.00 බැර ශේෂයෙන් රු 600,00 ක් පසුගිය වසර වලට අදාළව සන්නිවේදන පහසුකම් මත වැඩිපුර ගෙවීම් අයකර ගැනීමකි. ඉතිරි රු 154.00 සුළු සුළු අයකිරීම් වලදී වැඩිපුර ලැබීම් වලින් සමන්විත වේ. මෙම සටහන් පසුගිය වර්ෂවලට අදාළ ආදායම් බැවින් සමුච්චිත අරමුදලට ගලපා ඇත.

විගණනය

### 2.2.4 නීති රීති හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.

**අ) මු.රෙ. 135 ගෙවීම් කටයුතු**

ගිණුම් අංශයට කළමණාකාර සහකාරවරුන් දෙදෙනකු පමණක් අනුයුක්ත කර ඇති බැවින් වැඩ බෙදා හැරීමේදී විගණන විමසුමේ සඳහන් ආකාරයට වැඩ පැවරීමට සිදුව ඇත. මුදල් පොතේ ගිණුම් පැකේජය මගින් ද ලබා ගන්නා බැවින් අදාළ නිළධාරියාගේ මුදල් පොත ගිණුම් පැකේජයේ මුදල් පොත සමඟ සැසඳීමක් සිදු වේ.

**ආ) මු.රෙ. 138 (1) වැය විස්තර සකස් කිරීම**

විගණනය පෙන්වා දුන් පරිදි ගෙවීම් වවුචර් වල වැය විස්තර සඳහන් කිරීමට අවශ්‍ය පියවර දැනටමත් ගෙන ඇත.

**ඇ) මු.රෙ. 245 වවුචර් සහතික කිරීමෙන් තොරව ගෙවීම් කිරීම**

සීමිත කාර්ය මණ්ඩලයක් ගිණුම් කටයුතු සඳහා යොදවා ගනිමින් ගිණුම් කටයුතු කිරීමේදී වවුචර් කීපයක් පිළිබඳව මෙම තත්වය ඇතිවුවත් ඉදිරියේදී මෙවැනි තත්වයක් ඇතිවීම වැළක්වීමට  අවශ්‍ය පියවර ගනු ලැබේ.

**ඈ) මු.රෙ. 341 රිසිට් පොතේ ලේඛනයක් නඩත්තු කිරීම**

2013 වර්ෂයේ සිට ආදයම් රැස්කිරීම සඳහා භාවිතා කරන රිසිම් පොත් සඳහා ලේඛනයක් නඩත්තු කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

**ඉ) මු.රෙ. 342 රිසිට් පොත්වල භාරකාරිත්වය**

රිසිට් පොත් ලැබීම හා නිකුත් කිරීම පිළිබඳ ලේඛනයක් නියෝජ්‍ය අධ්‍යක්ෂ- (මුදල්) ගේ අධීක්ෂණය යටතේ පවත්වාගෙන යාමට දැනටමත් පියවර ගෙන ඇති බැව් කාරුණිකව දන්වමි.

**ඊ) මු.රෙ. 387 මුදල්පොතේ අයිරා ශේෂයක් වීම**

ඉදිරියේදී සිදුනොවීමට වගබලා ගන්නා බවත් ශේෂය අයිරාවක් මුදල් පොතේ සටහන්ව තිබූ නමුත් බැංකු ගිණුමේ බැංකු ශේෂය ඉක්මවා ගොස් නොතිබූ බවත් කාරුණිකව දන්වමි.

**උ) මු.රෙ. 756 (5) භාණ්ඩ සමීක්ෂණයට නියමිත ආකෘති භාවිතා කිරීම**

2001 වර්ෂයේ අවසන් ගිණුම් වල දැක්වෙන වත්කම් තහවුරු කිරීමට හා වත්කම් නිවැරදිව හඳුනාගෙන සමීක්ෂණ කටයුතු සැලසුම් කර ඇති බවත් ඒ අවස්ථාවේදී නියමිත ආකෘති පත්‍ර භාවිතා කර සමීක්ෂණ කටයුතු සිදුකිරීමට සටහන් කරගත් බව දන්වා සිටිමි.

**ඌ) උපයනවිට ගෙවීම් බදු**

වැටුප් හා ඊට සම්බන්ධිත කටයුතු පිළිබඳව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී සාකච්ඡා කරන ලද පරිදි භාණ්ඩාගාර උපදෙස් ලබා දුන් පසු ඒ අනුව කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ.

**එ) උපයනවිට බදු ගෙවීම් ඊළඟ මාසයේ 15 දිනට ප්‍රථම යැවීමට පියවර ගෙන ඇත.**

**ඒ) මුද්දර බද්ද මාස 3ට වරක් දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කිරීමට පියවර ගෙන ඇත.**

### 2.2.5 - විගණනය සඳහා සාක්ෂි නොවීම

I. වැටුප්, මුද්දර බදු, අත්තිකාරම් පියවීම් හා සුළු වියදම් ගිණුම් ගත කිරීම සඳහා ජර්නල් සටහන් යොදා ඇත. වැටුප් ගෙවීම් සඳහා වවුචරයක් අනුමත කරන අතර අනෙකුත් ජර්නල් සටහන් සඳහාද භාවිතා කිරීමට හා අදාළ අනුමැතියන් ලබා ගැනීමට උපදෙස් දී ඇත.

II. විදේශ ගමන් වියදම් වවුචර් වල අදාළ විස්තර හා ලිපිලේඛන වවුචරයට ඇතුලත් කිරීමට පියවර ගෙන ඇත.

## 3 මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචන වර්ෂය තුළ කොමිෂන් සභාවේ මෙහෙයුම් කටයුතු වර්ධනය වීමට සාපේක්ෂව කාර්ය මණ්ඩල බඳවා ගැනීම සිදුවූ අතර එමගින් වැටුප් විශ්‍රාමික ප්‍රතිපාදන, පාරිභෝජන ද්‍රව්‍ය, ගිවිසුම් ගත සේවා, අළුත් වැඩියා හා නඩත්තු වැනි වියදම් වල ඉහළ යාමක් සිදුව ඇත. තවද ප්‍රාග්ධන වත්කම් අවශ්‍යතාව වැඩිවීම මත වත්කම් මිලදී ගැනීම නිසා ක්ෂය ප්‍රතිපාදන ඉහළ යාමක් ද සිදුව ඇත.

### 4.1 කාර්ය සාධනය

අ) ක්‍රියාකාරී සැලැස්මේ කාර්යයන් පිළිබඳ තත්වය උපලේඛන 1 මගින් ඉදිරිපත් කර ඇත. (උපලේඛන 1 අමුණා ඇත)

ආ) දෙසැම්බර් මස අවසානයේ ලැබෙන මහජන පැමිණිලි පිළිබඳව ඊළග වර්ෂයේ කටහුතු කිරීමට සිදුවේ. පැමිණිලි 41ක් සම්බන්ධයෙන් කටයුතු කිරීම එම වර්ෂය තුළ ආරම්භ කිරීමට නොහැකි වූයේ එම පැමිණිලි සාමාන්‍යයෙන් දෙසැම්බර් මස ලැබීමය.

ඇ) 2002 අංක 33 දරන ඛනිජ තෙල් නිෂ්පාදන (විශේෂ විධි විධාන) පනත් කෙටුම්පත් සහ 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් සංස්ථා පනතට අදාළ සංශෝධන කෙටුම්පත් කර එම සංශෝධනයන් සඳහා කැබිනට් මණ්ඩල අනුමැතිය සහ පාර්ලිමේන්තු කාරක සභා අනුමැතිය ලබා ගැනීමට ක්‍රියා කිරීම. මෙම සංශෝධිත කෙටුම්පත් 2011 වසර තුළදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා නැවත නැවත කළ සංශෝධනයන්ට අවශ්‍ය අනුමැතිය බලාපොරොත්තුවෙන් ඉදිරි කටයුතු සම්පාදනය කරනු ඇත.

ඈ) මේ සම්බන්ධයෙන් අදාළ ආයතන විසින් 2009 අංක 20 දරන විදුලිබල පනතේ වගන්ති 9(1) ප්‍රකාරව අවශ්‍යතා සපුරා නොමැති බැවින් අප ආයතනයට බලපත්‍ර නිකුත් කිරීමේ හැකියාවක් නොමැත. එබැවින් ඊට අදාළ කටයුතු සම්පාදනය කර දෙන මෙන් ඉල්ලුම් කරමින් විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය වෙත අවධානය යොමු කොට ලිපියක් යවා ඇත. තවද බලපත්‍ර නිකුත් කිරීමට නොහැකි බව දන්වමින් අදාළ ආයතන වෙතද ලිපි මගින් දැනුම් දී ඇත.

ඉ) විගණන විමසුම් අනුව මිලියනය ඉක්ම වූ සමාගම් ගණන 8ක් ලෙස දක්වා තිබුනද, විචල්‍ය ලියාපදිංචි කිරීමේ ගාස්තුවලට ඇතුළත් සමාගම් 11ම ආදායම මිලියනයට වඩා ඉක්ම වූ සමාගම් වලට ඇතුළත් විය යුතුය.

### 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

ETF සඳහා ගෙවීම් නියමිත පරිදි සිදු කර ඇතත් උපලේඛන 2 මගින් ලබා දිය යුතු විස්තර නියමිත පරිදි ඉදිරිපත් නොවීම මත අධි භාර අය කර තිබේ.

## 5. ගිණුම් කටයුතු භාවය සහ යහ පාලනය

### 5.1 විගණන කමිටු

2001 වර්ෂයේ මුල් මාස 6 තුළ විගණකවරයෙකු නොසිටි බැවින් නියමිත විගණන කමිටු පැවැත්වීමට නොහැකි වුවද 2013 වර්ෂයේ සිට විගණන කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතු යොදා ඇත.

### 5.2 අයවැය පාලනය

ප්‍රතිපාදන සීමාව තුළ වියදම් දැරීමට අදාළ ක්‍රියා මාර්ග ගනු ලැබේ.

## 6. පද්ධති පාලනය

විගණන විමසුමේ දැක්වෙන ක්ෂේත්‍රයන් විධිමත් කිරීම මඟින් අභ්‍යන්තර පාලන ක්‍රමය විධිමත් කිරීමට උපදෙස් දී ඇත.



දමිත කුමාරසිංහ
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත: ලේකම්- මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය

# මූල්‍ය ප්‍රකාශන 2012

**මූල්‍ය තත්ව ප්‍රකාශන 2012**
**ශේෂ පත්‍රය දෙසැම්බර් 31 දිනට**

| | සටහන් | 2012 රු. ශත. | 2011 රු. ශත. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ පිරියත සහ උපකරණ | 25 | 31,804,899.46 | 23,387,209.39 |
| **ජංගම වත්කම්** | | | |
| ආයෝජන | 15 | 121,674,405.00 | 87,011,431.23 |
| ඉන්වෙන්ටරි භාණ්ඩ | | 97,795.75 | 117,889.50 |
| කුලී තැන්පතු | 16 | 828,070.80 | 828,070.80 |
| ලැබිය යුතු ගාස්තු | 17 | 17,834,030.02 | 15,050,351.00 |
| අත්තිකාරම් සහ පූර්ව ගෙවීම් | 18 | 2,239,440.23 | 8,050,617.98 |
| ලැබිය යුතු පොළිය | 19 | 4,499,976.03 | 1,827,092.43 |
| උත්සව අත්තිකාරම් | | 73,000.00 | 23000.00 |
| උපදා ණය | | 1,345,609.60 | |
| තැම්පතු-ස්ථාවර | | 2,010,497.02 | |
| මුදල් ශේෂය | | (1,437,744.76) | 742,174.25 |
| | | **149,165,080.27** | **113,650,627.19** |
| **මුළු වත්කම්** | | **180,969,979.73** | **137,037,836.58** |
| **අරමුදල් සහ බැරකම් අරමුදල්** | | | |
| සංචිත අරමුදල | 20 | 150,545,880.68 | 120,522,836.89 |
| ප්‍රත්තක්සේරුකරණ සංචිත | 21 | 1,193,453.14 | 1,193,453.14 |
| ආසියානු සංවර්ධන බැංකු තාක්ෂණික සහන ව්‍යාපෘති-අරමුදල | | 2,227,880.00 | 2,227,880.00 |
| සංචිත/FSD | | 1,500,000.00 | 1,500,000.00 |
| | | **155,467,213.82** | **125,444,170.03** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| පාරිතෝශික සඳහා වෙන්කිරීම් | | **3,974,460.00** | **2,579,778.00** |
| ප්‍රතිපාදන සැලසීම | 22 | **6,908,568.00** | **8,370,447.00** |
| ජංගම වගකීම් | | | |
| ගෙවිය යුතු ගිණුම් | 23 | 14,319,737.91 | 443,441.55 |
| විගණකාධිපති ගාස්තුව | 24 | 300,000.00 | 200,000.00 |
| වාර්ෂික නියාමන ගාස්තු ආපසු ලබා දීම | | | |
| **මුළු වගකීම්** | | **14,619,737.91** | **643,441.55** |
| | | **180,969,979.73** | **137,037,836.58** |

දමිත කුමාරසිංහ
අධ්‍යක්ෂ ජනරාල්

ජනාධිපති නීතිඥ
ආචාර්ය ජයතිස්ස ද කොස්තා
සභාපති

**විස්තීරන ආදායම් ප්‍රකාශය**
**දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා**

| | සටහන් | 2012<br>රු. ශත. | 2011<br>රු. ශත. |
|---|---|---|---|
| ආදායම | | | |
| විචල්‍ය ලියාපදිංචි කිරීමේ ගාස්තු | 1 | 32,704,472.00 | 25,590,562.53 |
| වාර්ෂික නියාමන ගාස්තු | 2 | 106,386,000.00 | 98,722,500.00 |
| බලපත්‍ර අයදුම්පත් ගාස්තු | 3 | 350,000.00 | 320,000.00 |
| වෙනත් ආදායම් | 4 | 10,961,312.79 | 4,397,562.05 |
| **මුළු ආදායම්** | | **150,401,785.43** | **129,030,624.58** |
| **වියදම්** | | | |
| පුද්ගල පඩිනඩි | 5 | 55,033,814.99 | 27,666,758.60 |
| විශ්‍රාමික ප්‍රතිලාභ | 6 | 4,376,047.89 | 3,461,338.29 |
| විදේශීය සහ දේශීය ගමන් වියදම් | 7 | 16,098,365.73 | 11,031,926.11 |
| පාරිභෝජ්‍ය භාණ්ඩ | 8 | 2,212,562.52 | 1,662,943.73 |
| කොන්ත්‍රාත්තුමය සේවා | 9 | 29,401,927.88 | 20,215,854.97 |
| අනෙකුත් සේවා | 10 | 3,025,896.90 | 2,732,593.93 |
| ප්‍රාග්ධන වත්කම් අලුත් වැඩියාව හා නඩත්තුව | 11 | 1,029,842.18 | 284,655.69 |
| මූල්‍ය පිරිවැය | 12 | 10,405.00 | 8,600.00 |
| හඳුනාගත් පාඩු | 13 | 5,630.22 | 293,240.05 |
| **මුළු වියදම්** | | **(111,194,538.31)** | **(67,357,911.37)** |
| **මෙහෙයුම් අතිරික්තය** | | **39,207,247.12** | **61,672,713.21** |
| ක්ෂය ප්‍රතිභාගය - වෙන්කිරීම | 25 | 7,490,454.99 | 5,043,658.24 |
| - පාරිතෝෂික ප්‍රතිපාදන | | 1,749,232.00 | 748,378.00 |
| | | (9,239,686.99) | (5,792,036.24) |
| පෙර වසරේ ගැලපීම් | 14 | | 97,746.28 |
| **වර්ෂය සඳහා අතිරික්තය/හිගය** | | **29,967,560.13** | **55,978,423.25** |

**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**
**දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා**

| | 2012 රු. ශත. | 2011 රු. ශත. |
|---|---|---|
| **මෙහෙයුම් කටයුතුවලින් ඇති වූ මුදල්** | | |
| වර්ෂය තුල මෙහෙයුම් අතිරික්තය/(හිගය) | 29,967,560.13 | 55,978,423.25 |
| **ගැලපීම්** | | |
| ක්ෂය ප්‍රතිභාගය | 7,490,454.99 | 5,043,658.24 |
| පාරිතෝෂික ප්‍රතිපාදන | 1,749,232.00 | 748,378.00 |
| ලැබුණු බැංකු පොලිය | (10,688,065.18) | (2,540,228.10) |
| පෙර වසරේ කාලය සඳහා ගැලපීම් | 363,320.24 | (56,063.77) |
| මූල්‍ය වියදම | 10,405.00 | 8,600.00 |
| ස්ථාවර වත්කම් අපහරණය කිරීමේ ආදායම | (139,672.08) | |
| | **28,753,235.10** | **59,182,767.62** |
| **කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම්** | | |
| ඉන්වෙන්ට්‍රි භාණ්ඩ වැඩිවීම්/අඩුවීම | 20,093.75 | (2,524.89) |
| ලැබිය යුතු පොළී වැඩිවීම/අඩුවීම | (2,672,883.60) | |
| ණය ගැතියන්ගේ වැඩිවීම/අඩුවීම | (2,783,679.02) | (7,858,834.10) |
| ගෙවිය යුතු මුදල්වල වැඩිවීම/ අඩුවීම | 13,976,296.36 | 7,038,446.30 |
| වෙන් කිරීම් වල වැඩිවීම/ අඩුවීම | (1,461,879.00) | |
| අත්තිකාරම් ඉදිරියට ගෙවීම සහ ආපදා ණය වැඩිවීම/ අඩුවීම | 4,415,568.15 | |
| **කාරක ප්‍රාග්ධන ශුද්ධ වෙනස්වීම** | **11,493,516.64** | **(822,912.69)** |
| **මෙහෙයුම් කටයුතුවලින්/(භාවිතයෙන්) ඇති වූ මුදල්** | **40,246,751.74** | **58,359,854.93** |
| **ආයෝජන කටයුතුවලින් ඇති වූ මුදල් ප්‍රවාහය** | | |
| | 139,672.08 | |
| මූල්‍ය පිරිවැය | (10,405.00) | (8,600.00) |
| සංචිතවල වැඩිවීම/අඩුවීම | | |
| ස්ථාවර වත්කම් මිලට ගැනීම | (15,908,145.06) | (13,963,410.84) |
| ලැබුණු පොළිය | 8,015,181.58 | 2,540,228.10 |
| ස්ථාවර තැන්පතු සහ භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය | (34,662,974.35) | (50,301,992.35) |
| | **(42,426,670.75)** | **(61,733,775.09)** |
| **මෙහෙයුම් කටයුතුවලින් (භාවිතයෙන්) ඇති වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(2,179,919.01)** | **(3,373,920.16)** |
| අඩුකළා: වසර ආරම්භයේ දී මුදල් සහ මුදල්වලට සමාන දේවල් | 742,174.25 | 4,481,171.41 |
| **වසර අවසානයේ දී මුදල් සහ මුදල්වලට සමාන දේවල්** | **1,437,744.76** | **1,107,251.25** |
| මුදල් සහ මුදල්වලට සමාන දේවල් | | |
| අතැති සහ බැංකුවේ ඇති මුදල් | (1,437,744.76) | 1,107,251.25 |
| | **1,437,744.76** | **1,107,251.25** |

**ශුද්ධ වත්කම් පිළිබඳ ප්‍රකාශය**
**දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා**

| | සමුච්චිත අරමුදල | සංචිත | නැවත තක්සේරු කිරීමේ සංචිත | එකතුව |
|---|---|---|---|---|
| | රු. ශත. | රු. ශත. | රු. ශත. | රු. ශත. |
| 2012.01.01 දිනට ශේෂය | 120,522,836.89 | 1,500,000.00 | 1,193,453.14 | 123,216,209.03 |
| පූර්ව වර්ෂ ගැලපුම | 55,483.66 | | | |
| **2012 ජනවාරි 01 දිනට ශේෂය** | **120,578,320.55** | **1,500,000.00** | **1,193,453.14** | **123,271,773.69** |
| ආදායම් ප්‍රකාශයේ අතිරික්තය/(හිඟය) | 29,967,560.13 | 29,967,560.13 | | |
| **2012 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **150,545,880.68** | **1,500,000.00** | **1,193,453.14** | **153,239,333,82** |

# පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති

## පොදු කරුණු

ජාතික ඒකාබද්ධතා ප්‍රතිපත්තියකට අනුකූලව යම් යම් උපයෝගීතා කර්මාන්ත නියාමනය කිරීම පිණිස ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව (PUCSL) ස්ථාපිත කරන ලදි.
ඉහත ප්‍රතිපත්තිය අනුව, 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත බලාත්මක වීමත් සමගම ශ්‍රී ලංකාවේ විදුලිබල කර්මාන්තය නියාමනය කිරීම සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත පූර්ණ බලය පැවරිණි.

## පිළියෙල කිරීමේ පදනම

2.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කොට ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති, 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනතේ අවශ්‍යතා සහ 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනතේ අවශ්‍යතා අනුව මූල්‍ය ප්‍රකාශන සකස් කොට තිබේ.
2.2 මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කොට ඇත්තේ ඓතිහාසික පිරිවැය සම්ප්‍රදාය අනුවය.
2.3 මූල්‍ය කාල පරිච්ඡේදය
කොමිෂන් සභාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය වේ.

## වර්ෂය තුළ නව සහ සංශෝධිත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් අනුගමනය කිරීම

කොමිෂන් සභාව විසින් ප්‍රවර්තන මුදල් වර්ෂය තුළ ක්‍රියාත්මකව පවතින පහත දැක්වෙන නව සහ සංශෝධිත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLAS) අනුගමනය කර ඇති අතර අවශ්‍ය අවස්ථාවන්හිදී, මෙම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්හි සංශෝධන පිළිබිඹු කිරීම පිණිස සංශෝධනය කර තිබේ.
නව සහ සංශෝධිත ප්‍රමිති අනුගමනය කිරීම ඉදිරිපත් කිරීමේ ක්‍රම වෙනස් වීමට හේතු වී ඇති අතර මූල්‍ය ප්‍රකාශනවල අමතර හෙළිදරව් කිරීම්ද සිදු කර තිබේ.

කොමිෂන් සභාවට අදාළ වන සහ සංශෝධිත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් පහතින් දක්වා තිබේ.
LKAS 1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
LKAS 2 වට්ටෝරු භාණ්ඩ
LKAS 8 ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු සහ දෝෂවල වෙනස්කම්
LKAS 10 ශේෂ පත්‍ර දිනට පසු සිදු වීම
LKAS 16 දේපළ, පිරියත සහ උපකරණ
LKAS 40 ආයෝජනය කිරීම් සඳහා ගණනය කිරීම්
LKAS 20 රජයේ ප්‍රදාන සඳහා වන ගිණුම්කරණය කිරීම් සහ රජයේ සහය හෙළිදරව් කිරීම
LKAS 18 ආදායම්
LKAS 24 අදාළ පාර්ශව හෙළිදරව් කිරීම්
LKAS 26 විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් අනුව ගිණුම්කරණය සහ වාර්තා කිරීම

## සංසන්දනාත්මක තොරතුරු

කොමිෂන් සභාව විසින් භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති, ප්‍රකාශිතව දක්වා නොමැති නම් හැර පසුගිය වසරේ අනුගමනය කළ ප්‍රතිපත්ති හා අනුකූල වේ. පසුගිය වසරේ සංඛ්‍යාලේඛන සහ වාක්‍යාංග, අවශ්‍ය අවස්ථාවන්හිදී, ප්‍රවර්තන වර්ෂයේ ඉදිරිපත් කිරීම පිණිස නැවත සකසා තිබේ.

## ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්.

ශේෂ පත්‍ර දිනට පසු සියලු වැදගත් සිදුවීම් සැලකිල්ලට ගෙන ඇති අතර සුදුසු ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශනවල අදාළ සටහන්වල සිදුකර තිබේ.

## වත්කම් පිළිබඳ තක්සේරු කිරීම සහ ඒවායේ මිණුම්වල පදනම

### 6.1 දේපළ පිරියත සහ උපකරණ

දේපළ පිරියත සහ උපකරණ වාර්තා කර ඇත්තේ පිරිවැය/ අඩු සමුච්චිත ක්ෂය වීම් පිරිවැය මත සහ පහතින් විස්තර කර ඇති නැවත තක්සේරු කිරීමේ ප්‍රතිලාභ හා පාඩු මත වේ.
දේපළ පිරියත සහ උපකරණ පිරිවැය යනු අභිමත භාවිතය සඳහා වත්කම් ඒවායේ ක්‍රියාකාරී තත්වයට ගෙන ඒම පිණිස දැරූ යම් යම් වියදම්ද ඇතුළුව මිලට ගැනීමේ හෝ ඉදිකිරීමේ පිරිවැය වේ.

### 6.2 දේපළ පිරියත සහ උපකරණ නැවත තක්සේරු කිරීම

දේපළ පිරියත සහ උපකරණ නැවත තක්සේරු කිරීම පිණිස අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කමිටුවක් පත් කරන ලදි. මෙම ක්‍රියාවලියේදී, සලකා බැලීම පිණිස සාධාරණ වටිනාකම් පිළිබඳ වෙළඳපල වටිනාකම්වල සාක්ෂි නොවීය. වත්කම් නැවත තක්සේරු කිරීම ආරම්භ වනුයේ 2009 දෙසැම්බර් 31 දින සිටය. වත්කමක් නැවත තක්සේරු කරනු ලබන විට, වටිනාකමේ කිසියම් වැඩිවීමක් වෙතොත් එය නැවත තක්සේරු කිරීමේ සංචිතවල අතිරික්තයට කෙළින්ම ගලපනු ලැබේ.

## නොමිලේ භාවිතා කෙරෙන වත්කම්

කොමිෂන් සභාව විසින් මුද්දරවලට මුද්‍රා ගැසීමේ යන්ත්‍රයක් නොමිලේ තැපැල් දෙපාර්තමේන්තුව වෙතින් ලබා ගෙන තිබේ. කොමිෂන් සභාව විසින් එහි ගාස්තු වැය කර ඇති අතර එම මුදලද උපකරණ නඩත්තු ගිණුමට බැර කර තිබේ. තවද මෙම දේපළ තැපැල් දෙපාර්තමේන්තුව සතු දේපළක් ලෙස සලකා තිබේ. එම නිසා එය ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ දේපළක් ලෙස සැලකිය හැක.

6.3 ක්ෂය ප්‍රතිභාගය

ක්ෂය ප්‍රතිභාගය සඳහා වන ප්‍රතිපාදනය ගණනය කරනු ලබන්නේ, 2011 දෙසැම්බර් 31 දින ප්‍රති තකිසේරු කළ දේපළ පිරියත සහ උපකරණ පිරිවැය නොවන යන්ත්‍ර දේපළ පිරියත සහ උපකරණ සම්බන්ධයෙන් ඍජු රේඛීය පදනමක් භාවිතා කිරීමෙනි. වත්කම්වල ක්ෂය ප්‍රතිභාග වනාකම් පහත පරිදි වේ:

| | | |
|---|---|---|
| 1 | ගෘහ භාණ්ඩ සහ සවිකිරීම | 20% |
| 2 | පරිගණක සහ කාර්යාලයීය උපකරණ | 20% |
| 3 | වාහන | 20% |
| 4 | පරිගණක මෘදුකාංග | 33 1/3% |

ක්ෂය ප්‍රතිභාග සඳහා වන ගණනය කිරීම් අදාළ වනුයේ ප්‍රවර්තන වර්ෂය තුළ දේපළ යන්ත්‍ර සහ උපකරණ මිලට ගත් දින සිටය.
2011 වර්ෂය තුළ නැවත තක්සේරු කරන ලද වත්කම් තීරණය කර ඇත්තේ, ක්ෂය වීම් ගණනය කිරීමේ පදනම ලෙස පහත දැක්වෙන අනුපාතිකයන් සැලකිල්ලට ගෙන ඉදිරි වර්ෂවල ක්ෂය වන ආකාරයටය.
පරිගණක සහ කාර්යාල උපකරණ 100%
ප්‍රයෝජනවත් ජීවිත, ශේෂ වටිනාකම් සහ වත්කම් ක්ෂය කිරීම් ක්‍රම අවශ්‍ය වුවහොත්, එක් එක් මුදල් වර්ෂය අවසානයේදී සිදු කරනු ලැබේ.

## භාණ්ඩ තොග ලේඛන

තොග භාණ්ඩ තක්සේරු කරනු ලබන්නේ අඩු වටිනාකම් යටතේය. එක් එක් ඉන්වෙන්ටරි භාණ්ඩ කාණ්ඩය තීරණය කරනු ලබන්නේ පහත පදනමිනි.
ලිපි ද්‍රව්‍ය- මිලට ගත් මිල

## ආයෝජන

කොමිෂන් සභාව වෙත හිමිවන ප්‍රතිලාභ උපරිම කිරීම පිණිස මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය සහිතව, කොමිෂන් සභාව සිය අතිරික්ත ආදායම ලංකා බැංකුවේ ස්ථාවර තැම්පතු සහ භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර තිබේ.

## ලැබිය යුතු මුදල්

ලැබිය යුතු මුදල් ප්‍රකාශ කර ඇත්තේ ඒවායේ උපලබ්ධි වීමට නියමිත මුදල් ආකාරයටය. බොල් හෝ අවිනිශ්චිත ණය සඳහා කිසිදු ප්‍රතිපාදනයක් වෙන් කර නැත.

## අත්තිකාරම් සහ පෙර ගෙවුම්

අත්තිකාරම් ගිණුමෙහි කාර්ය මණ්ඩලය වෙනුවෙන් වන වෛද්‍ය රක්ෂණය සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංසථාව වෙත ගෙවන ලද වාරිකයේ කොටසක් අඩංගු වේ. මෙම ඔප්පුව 2012 සැප්තැම්බර් මස 30 දක්වා බලාත්මක බැවින්, ගෙවන ලද වාරිකය සමානුපාතික පදනමින් සැලකීමට අවශ්‍ය වී තිබේ.

## මුදල් හා මුදල්වලට සමාන දේ

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ තිබෙන මුදල් හා මුදල්වලට සමාන දේ තුළ බැංකුවේ සහ අතැති මුදල් අන්තර්ගත වේ.

## වගකීම සහ ප්‍රතිපාදන

ශේෂ පත්‍රයේ ජංගම වගකීම් ලෙස වර්ග කර ඇති වගකීම් ඉල්ලුම මත හෝ ශේෂ පත්‍රයේ දින සිට එක් වසරක කාලයක් තුළ ගෙවිය යුතු වගකීම් වේ. ජංගම නොවන වගකීම් ලෙස වර්ග කර ඇති වගකීම් යනු ශේෂ පත්‍රයේ දින සිට එක් වසරකට වැඩි කාලයකදී කල් ඉකුත් වන වගකීම් වේ.
2011 වර්ෂයේ කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ සැලසුම් කරන ලද පහත සඳහන් වියදම් වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කරන ලදි.

| | රු |
|---|---|
| විදේශ පුහුණු සඳහා ප්‍රතිපාදන | 1,908,568 |
| පාරිභෝගික උපදේශන කමිටුව | 5,000,000 |
| | 6,908,568 |

## අංශ සංවර්ධනය සඳහා වන අරමුදල්

පාරිභෝගික අධ්‍යාපනය සහ මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ හැකියාවන් සංවර්ධනය කිරීමට මෙන්ම ඔවුන් සඳහා සෞඛ්‍ය රක්ෂණයක් ලබා දීම සඳහාත් අංශ සංවර්ධනය සඳහා වන අරමුදල නමින් වෙනමම අරමුදලක් පිහිටුවා ගැනීමට කොමිෂන් සභාව තීරණය කරන ලදි. කෙසේවෙතත් භාණ්ඩාගාරය විසින් නියම කළේ කිසියම් යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කළ යුත්තේ නියාමන ගාස්තුවලින් ලබා ගන්නා ආදායම භාවිතා කළ යුත්තේ නියාමන ගාස්තුවලින් ලබා ගන්නා ආදායම් භාවිතා කරමින් බවය. රුපියල් මිලියන 1.5ක ස්ථාවර තැන්පතුවක් පවත්වා ගෙන යාමට අනුමැතිය ලබා දෙන ලදි.

## විශ්‍රාමික ප්‍රතිලාභ සැලැස්ම- පාරිතෝෂිකය

14.1 අංක 42 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය වන සේවය ආරම්භ කළ දින සිට එක් එක් වසර සඳහා මාස භාගයක වැටුපට සමාන 'විශ්‍රාමික ප්‍රතිලාභ පිරිවැය' හා අනුකූලව, කොමිෂන් සභාවේ ප්‍රතිපත්ති තීරණයට අනුව සේවකයෙකු විසින් අවුරුද්දක සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසුව විශ්‍රාමික පාරිතෝෂිකය ලබා දීමට පූර්ණ විධිවිධාන සලසා තිබේ.
1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම අනුව, සේවකයෙකු සඳහා වන පාරිතෝෂික හා සම්බන්ධ බැඳීම් ආරම්භ වනුයේ කොමිෂන් සභාව අඛණ්ඩ එක් අවුරුදු කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසුවය. එමනිසා, පාරිතෝෂික පනත අනුව පාරිතෝෂික ප්‍රතිපාදන සලසා තිබේ.
ශේෂ පත්‍ර දිනට පසුව වගකීම සඳහා වන ප්‍රතිපාදන බාහිර වශයෙන් ආයෝජනය කෙරේ.

14.2 සේවක අර්ථසාදක අරමුදල් සහ සේවක භාරකාර අරමුදල
සුදුසුකම් ලත් සේවකයන් සඳහා අදාළ ව්‍යවස්ථාවන් සහ නියමයන් අනුව දායක මුදල් ගෙවීම් කොට තිබේ.

## ගෙවිය යුතු මුදල්

ගෙවීම් ප්‍රකාශ කොට ඇත්තේ ඒවායේ පිරිවැය මතය.

## ආසියානු සංවර්ධන බැංකු තාක්ෂණික සහන ව්‍යාපෘතිය යටතේ පවරන ලද වත්කම්

පහත සඳහන් පරිගණක සහ උපකරණ තොග ආසියානු සංවර්ධන බැංකු තාක්ෂණික සහන ව්‍යාපෘතිය යටතේ මහජන උපයෝගිතා කොමිෂන් සභාවට පවරන ලදී. අදාළ ආසියානු සංවර්ධන බැංකු ආධාර මුදල ඊට අදාළ වත්කම් ක්ෂය වන කාල පරිච්ඡේදය තුළ කපා හැරීමට තීරණය කරන ලදී.

| | රු |
|---|---|
| වෙබ් පාදක බලපත්‍ර තොරතුරු සම්පාදන පද්ධතිය | 451,880 |
| ලැප්ටොප් පරිගණක-9 | 1,418,580 |
| ඩෙක්ස්ටොප් පරිගණක-4 | 357,420 |
| | 2,227,880 |

## 17 ආදායම් හඳුනාගැනීම

17. 1 විචල්‍ය ලියාපදිංචි (බලපත්‍ර) ගාස්තු
ශ්‍රී ලංකා රජය සමඟ ලියා අත්සන් කළ "ලිහිසි තෙල් ගිවිසුමේ" 2වන වගන්තිය අනුව, රුපියල් මිලියන පහක උපරිමයකට යටත්ව, අදාළ කාල පරිච්ඡේදය සඳහා ඉන්වොයිසි ඉදිරිපත් කළ මුළු විකුණුම්වලින් 0.5%ක් හෝ රුපියල් මිලියන එකකට සමාන ස්ථාවර සහ විචල්‍ය ලියාපදිංචි කිරීමේ (බලපත්‍ර) ගාස්තුවක් (දෙකෙන් වැඩි මුදල) ලිහිසිතෙල් වෙළඳපලේ සහභාගිවන්නන් විසින් අර්ධ වාර්ෂිකව ගෙවිය යුතුය. අර්ධ වාර්ෂික කාලය සඳහා වෙළඳපල සහභාගීකරුවන්ගේ ඉන්වොයිස් ඉදිරිපත් කළ මුළු විකුණුම්වල වටිනාකම රුපියල් මිලියන එකකට වඩා වැඩිනම්, අදාළ කාලය අවසන් වී දින 30ක් ඇතුළත අතිරේක මුදල් මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත ගෙවිය යුතුය.

17. 3 වාර්ෂික ගාස්තුව
2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 46 වන වගන්තිය ප්‍රකාරව, වාර්ෂික නියාමන ගාස්තුවක් පැනවීම සඳහා කොමිෂන් සභාව වෙත බලය පැවරෙන අතර එම වසරේ ජුනි මස 30 වන දිනට පෙර සෑම බලපත්‍රලාභියෙකු වෙතින්ම එම ගාස්තුව අය කර ගත යුතුය. මෙම පනත 2009 අප්‍රේල් මස 08 වන දින සම්මත කරන ලද අතර එදින පටන් කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරන ලදී.

17.4 බලපත්‍ර අයදුම්පත් ගාස්තු
එවා ඇති ගාස්තුවලට අමතරව, ශ්‍රී ලංකා විදුලිබල පනතේ 11 වන වගන්තිය ප්‍රකාරව, විදුලිබලය උත්පාදනය, සම්ප්‍රේෂණය හෝ බෙදා හැරීම සඳහා වන බලපත්‍ර අයදුම්පත් සමඟ අයදුම්පත් සැකසීමේ ගාස්තුවක් අය කර ගැනීමේ බලය කොමිෂන් සභාව වෙත පැවරී තිබේ.

17. 5 පොළී ආදායම
පොළී ආදායම ගණනය කරන ලද්දේ උපචිත පදනමිනි. ගණුදෙනුව හා අදාළ ආර්ථික ප්‍රතිලාභ කොමිෂන් සභාව වෙත ගලා එනු ඇති බවට විශ්වාසයක් ඇති විට පමණක් ආදායම හඳුනාගැනේ. එම නිසා 2006 අංක 10 දරන දේශීය ආදයම් පනතේ 133 (1) වන වගන්ති අනුව 10% රඳවා ගැනීමේ බද්ද මුළු බද්ද ලෙස අඩු කිරීමෙන් පසුව මූල්‍ය ප්‍රකාශනවල ශුද්ධ පොළී ආදායම පෙන්නුම් කර තිබේ.

17.6 රජයේ ප්‍රදාන
ඇස්තමේන්තුගත වියදම 2009 ජුනි මස සිය ආදායමින් පියවා ගැනීමට කොමිෂන් සභාව තීරණය කර ඇති හෙයින් සමාලෝචනය කෙරෙන වර්ෂය තුළ කිසිදු රජයේ ප්‍රදානයක් එය වෙත නොලැබුණි.

## 18 වියදම් හඳුනාගැනීම

කොමිෂන් සභාව විසින් අනුමත කළ අයවැය ප්‍රතිපාදන පිළිබඳ ආදයම් ප්‍රකාශයේ වියදම් හඳුනාගෙන තිබේ.

## 19 අනෙකුත් තොරතුරු

2006 අංක 10 දරන දේශීය ආදයම් පනතේ 7 (අ) වගන්තිය අනුව කොමිෂන් සභාව ආදයම් බද්දෙන් නිදහස් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දෙන ලෙස ආදයම් කොමිෂන් සභාව ක්‍රමසම්පාදන සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යවරයාගෙන් ඉල්ලා තිබේ. මේ සම්බන්ධයෙන් තීරණය තවමත් දේශීය ආදයම් දෙපාර්තමේන්තුවෙන් ලැබී නොමැත. එම නිසා අවිනිශ්චිත බැරකමක් ශේෂ පත්‍ර දිනට පවතී. කොමිෂන් සභාවේ අරමුණු සහ කර්තව්‍යයන්හි ස්වභාවය අනුව බදු නිදහස් වීමක් ලැබීමේ හැකියාව ඉහළ බැවින්, ගෙවීමට නියමිත ආදායම් බදු බැරකම් වෙනුවෙන් ප්‍රතිපාදනයක් සිදු කර නොමැත.

# අදාළ පාර්ශ්ව සම්බන්ධතා

| නම | තනතුර | වෙනත් තනතුරු | 30 වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ විස්තර කර ඇති පරිදි අදාළ පාර්ශ්ව සම්බන්ධතා |
|---|---|---|---|
| ජනාධිපති නීතිඥ, ආචාර්ය එච්. ජේ. ඩී. කොස්තා මහතා | සභාපති | - | - |
| ආචාර්ය සී. ටී. එස්. බන්දුල පෙරේරා මහතා | නියෝජ්‍ය සභාපති | 1. සභාපති, DR TV (ප්‍රයිවට්) ලිමිටඩ්<br>2. අධ්‍යක්ෂ පිරමල් ග්ලාස් (සිලෝන්) පීඑල්සී<br>3. අධ්‍යක්ෂ කැළණි කේබල් පීඑල්සී<br>4. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික කාර්මික තාක්ෂණ ආයතනය | අදාළ නොවේ |
| මහාචාර්ය ආර්. ඒ. අතලගේ මහතා | කොමිෂන් සභාවේ සාමාජික | 1. නියෝජ්‍ය උප කුලපති මොරටුව විශ්ව විද්‍යාලය<br>2. අධ්‍යක්ෂ ඉනර්ටැබ් (ප්‍රයිවට්) ලිමිටඩ්<br>3. අධ්‍යක්ෂ එන්වයර්න් ග්ලෝබල් (ප්‍රයිවට්) ලිමිටඩ් | අදාළ නොවේ |
| නීතිඥ සංජය ගමගේ මහතා | කොමිෂන් සභාවේ සාමාජික | 1. ලේකම් ශ්‍රී ලංකා නීතීඥ සංගමය<br>2. නීතීඥ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය<br>3. නිල නොලත් මහේස්ත්‍රාත් | අදාළ නොවේ |
| ප්‍රසාද් ගල්හේන මහතා | කොමිෂන් සභාවේ සාමාජික | සභාපති ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය | අදාළ නොවේ |

# මුදල් ප්‍රකාශ පිළිබඳ සටහන්

| | 2012 රු. ශත. | 2011 රු. ශත. |
|---|---|---|
| **1. විචල්‍ය ලියාපදිංචි කිරීමේ ගාස්තු** | | |
| ලංකා ඉන්දියන් ඔයිල් කොම්පැනි ලිමිටඩ් | 6,446,280.00 | 5,604,330.00 |
| සිව්රොන් ලුබ්රිකන්ට් ලංකා | 8,000,000.00 | 8,000,000.00 |
| මැක්ලරන්ස් ලුබ්රිකන්ට් | 5,759,888.00 | 3,509,488.00 |
| ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | 7,070,274.30 | 4,857,948.94 |
| ලාෆ්ස් | 1,013,972.23 | 1,567,099.59 |
| ඉන්ටර්ඕෂන් සර්විසස් ලිමිටඩ් | 432,700.58 | 742,785.00 |
| ඇසෝසියේටඩ් මෝටර්ස් | 1,290,775.55 | 477,569.00 |
| ඔඞී ලලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් | 840,703.35 | 831,342.00 |
| යුනයිටඩ් මෝටර්ස් | 259,037.88 | |
| ටොයොටා ලංකා පුද්ගලික සමාගම | 1,048,087.63 | |
| එන් එම් ඩිස්ට්‍රිබියුසන් පුද්ගලික සමාගම | 542,752.67 | |
| | **32,704,472.64** | **25,590,562.53** |
| **2. වාර්ෂික නියාමන ගාස්තු** | 106,386,000.00 | 98,722,500.00 |
| | **106,386,000.00** | **98,722,500.00** |
| **3. බලපත්‍ර අයදුම්පත් ගාස්තු** | 350,000.00 | 320,000.00 |
| | **350,000.00** | **320,000.00** |
| **4. වෙනත් ආදායම්** | | |
| පොළිය | 10,688,065.18 | 4,444,225.81 |
| අඩුකළා: රැදවුම් බද්ද | - | (76,905.28) |
| | 10,688,065.18 | 4,367,320.53 |
| නිදහස් කිරීමේ ගාස්තු | | 6,000.00 |
| විවිධ ආදායම් | 36,160.98 | 24,241.52 |
| සත්‍යාපනය කිරීමේ ගාස්තු-ග්‍රීන් එනර්ජි | 97,414.55 | |
| ස්ථාවර වත්කම් අපහරණය | 139,672.08 | |
| | **10,961,312.79** | **4,397,562.05** |
| **5. පුද්ගල පඩිනඩි** | | |
| කොමසාරිස්වරුන්ගේ පඩිනඩිථ | 1,848,000.00 | 1,895,024.33 |
| වැටුප් | 36,431,317.89 | 23,685,816.27 |
| උපදේශනය | 15,845,313.56 | 1,663,436.00 |
| අතිකාල | 909,183.54 | 422,482.00 |
| | **55,033,814.99** | **27,666,758.60** |
| **6. විශ්‍රාමික ප්‍රතිලාභ** | | |
| සේවක අර්ථ සාදක අරමුදලට දායක මුදල් | 3,500,838.29 | 2,769,070.61 |
| සේවක භාරකාර අරමුදලට දායක මුදල් | 875,209.60 | 692,267.68 |
| | **4,376,047.89** | **3,461,338.29** |
| **7. විදේශීය සහ දේශීය ගමන් වියදම්** | | |
| විදේශීය සහ දේශීය පුහුණු වැඩසටහන් | 8,377,648.16 | 2,899,893.46 |
| විදේශීය ගමන් වියදම් | 2,579,158.72 | 3,103,624.00 |
| ආනුෂංගික/දෛනික | 4,268,021.85 | 4,341,528.65 |
| ගමන් වියදම් (දේශීය) | 873,537.00 | 686,880.00 |
| | **16,098,365.73** | **11,031,926.11** |

| | 2012 රු. ශත. | 2011 රු. ශත. |
|---|---|---|
| **8. පාරිභෝජ්‍ය භාණ්ඩ** | | |
| ලිපිද්‍රව්‍ය | 664,426.91 | 604,664.46 |
| ආරම්භක ශේෂය 01-01-2012 | 117,889.50 | |
| අවසාන ශේෂය 31-12-2012 | (97,795.75) | |
| ඉන්ධන හා ගාල්කිරීම | 1,249,294.45 | 840,629.60 |
| පාරිභෝජ්‍ය භාණ්ඩ | 179,206.16 | 62,777.07 |
| විනෝදාස්වාදය | 99,541.25 | 154,872.60 |
| අනෙකුත් වියදම් | - | - |
| | **2,212,562.52** | **1,662,943.73** |
| **9. කොන්ත්‍රාත්තුගත සේවා** | | |
| ප්‍රවාහනය සහ වාහන කුළියට ගැනීම | 5,149,918.36 | 4,306,599.47 |
| පුවත්පත් සහ තැපැල් ඇතුළුව පණිවුඩ හුවමාරුව | 2,489,376.07 | 2,000,851.60 |
| මුද්‍රණ සහ වෙළඳ දැන්වීම් | 4,126,355.24 | 1,912,698.13 |
| සමීක්ෂණ | 4,408,978.60 | 1,479,045.00 |
| කුළී සහ ගොඩනැගිලි ගාස්තු | 7,696,652.61 | 6,977,200.49 |
| විදුලිබලය | 800,017.48 | 459,775.15 |
| වෛද්‍ය | 2,300,585.45 | 1,870,710.80 |
| ජලය | 272,428.37 | 199,542.75 |
| රක්ෂණය | 483,681.95 | 470,513.92 |
| දායකත්වය | 423,968.00 | - |
| පවිත්‍ර කිරීමේ සේවා | 523,010.75 | 331,022.69 |
| නීති සහ පර්යේෂණ ගාස්තු | 727,000.00 | 207,894.97 |
| අනියම් වියදම් සහ වෙනත් වියදම් | - | - |
| | **29,401,972.88** | **20,215,854.97** |
| **10. වෙනත් සේවා** | | |
| මහජන දැනුවත් කිරීමේ වියදම | 613,437.50 | 828,958.00 |
| වෙබ් අඩවි නිර්මාණය කිරීම | 51,000.00 | 22,571.43 |
| විගණකාධිපති ගාස්තුව | 100,000.00 | 100,000.00 |
| සුභසාධන සහ මහජන සම්බන්ධතා | 1,349,674.00 | 189,146.50 |
| මල් සැරසිලි | 28,504.40 | 18,700.00 |
| පාරිභෝගික උපදේශන කොමිටි වියදම් | 594,607.00 | 1,386,258.00 |
| වෙනත් (පරිවර්තන ගාස්තු) | 288,674.00 | 186,960.00 |
| | **3,025,896.90** | **2,732,593.93** |
| **11. ප්‍රාග්ධන භාණ්ඩ අළුත් වැඩියා සහ නඩත්තු වියදම්** | | |
| වාහන නඩත්තු | 276,265.90 | 99,512.00 |
| කාර්යාල ගොඩනැගිලි | 369,322.78 | 19,273.60 |
| කාර්යාල උපකරණ සහ පරිගණක | 384,253.50 | 165,870.09 |
| | **1,029,842.18** | **284,655.69** |
| **12. මූල්‍ය පිරිවැය** | | |
| බැංකු ගාස්තු | 10,405.00 | 8,600.00 |
| **13. හඳුනාගත් පාඩු** | | |
| අධිභාර | | 5,990.62 |
| වන්දි | | 284,000.00 |
| විදේශ විනිමය හුවමාරු කිරීමේ පාඩු | 5,603.22 | 1,549.93 |
| වෙනත් පාඩු | | 1,699.50 |
| අත්තිකාරම් මත පාඩු | - | - |
| | **5,603.22** | **293,240.05** |

| | 2012 රු. ශත. | 2011 රු. ශත. |
|---|---|---|
| **14. පෙර වසරේ ගැලපීම්** | | |
| SAFIR සාමාජිකත්වය සඳහා වැඩිපුර වෙන්කිරීම් | | 44,682.51 |
| උයඹ අඩුවෙන් සටහන්වීම නිවැරදි කිරීම | | (3,000.00) |
| වාර්ෂික නියාමන ගාස්තු ආපසු ලබාදීම | | 56,063.77 |
| නිදහස් කිරීමේ ගාස්තුව | - | - |
| | **828,558.26** | **97,746.28** |
| **15. ආයෝජනය** | | |
| ස්ථාවර තැන්පතු | 117,151ල906 | 33,680,035.63 |
| පාරිතෝෂික සඳහා | 3,022,499.25 | 1,831,400.00 |
| විශේෂ අරමුදල සඳහා | 1,500,000.00 | 1,500,000.00 |
| භාණ්ඩාගාර බිල්පත් | | 49,999,995.60 |
| | **121,674,405.58** | **87,011,431.23** |
| **16. කුළී තැන්පතු** | | |
| තැන්පතු ගිණුම | 1,500.00 | - |
| බැන්ක් ඔෆ් සිලෝන් ප්‍රොපටි ඩිවෙලොප්මන්ට් ලිමිටඩ් | 826,570.80 | 828,070.80 |
| | **828,070.80** | **828,070.80** |
| **17. ලැබිය යුතු ගාස්තු විචල්‍ය ලියාපදිංචි කිරීමේ ගාස්තු** | | |
| ලංකා ඉන්දියන් ඔයිල් කොම්පැණි ලිමිටඩ් | 3,475,080.00 | 3,060,255.00 |
| සෙව්රොන් ලබ්රිකන්ට් | 4,000,000.00 | 4,000,000.00 |
| මැක්ලරන්ස් ලුබ්රිකන්ට් | 3,332,874.45 | 2,595,500.00 |
| ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | 3,705,701.89 | 2,650,000.00 |
| ලාෆ්ස් | 374,382.22 | 1,029,186.00 |
| ඉන්ටර්ඕෂන් සර්විසස් ලිමිටඩ් | 149,857.56 | 742,785.00 |
| ඇසෝසියේටඩ් මෝටර්ස් | 650,000.00 | 365,077.00 |
| ඔඩී ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් | 377,618.83 | 607,548.00 |
| යුනයිටඩ් මෝටර්ස් | 259,037.88 | - |
| ටොයොටා ලංකා පුද්ගලික සමාගම | 606,724.00 | - |
| එන් එම් ඩිස්ට්‍රිබියුසන් | 337,104.32 | - |
| වාර්ෂික නියාමන ගාස්තු | 492,000.00 | |
| වැඩිපුර ගෙවූ සන්නිවේදන වියදම් | 28,648.87 | |
| | **17,843,030.02** | **15,050,351.00** |
| **18. අත්තිකාරම් සහ පූර්ව ගෙවීම්** | | |
| අත්තිකාරම් | | 1,427,078.58 |
| තැපැල් දෙපාර්තමේන්තුව | 2,215,955.23 | 14,804.00 |
| විදේශ පුහුණු/ සේවා ගිවිසුම | 23,485.00 | 387,935.40 |
| පාරිතෝෂික ආයෝජන සඳහා වෙන් කිරීම් | | |
| තොරතුරු තාක්ෂණ හා විදුලි පරීක්ෂණ | - | 769,400.00 |
| උපකරණ මිලදී ගැනීම සඳහා ප්‍රතිපාදන | - | 5,451,400.00 |
| | **2,239,440.23** | **8,050,617.98** |
| **19. ලැබිය යුතු පොළිය** | | |
| භාණ්ඩාගාර බිල්පත් | - | 1,311,428.31 |
| ස්ථාවර තැන්පතු | 4,499,976.03 | 515,664.12 |
| | **4,499,976.03** | **1,827,092.43** |

| | 2012 රු. ශත. | 2011 රු. ශත. |
|---|---|---|
| **20. සමුච්චිත අරමුදල** | | |
| 2012 ජනවාරි 01 දිනට ශේෂය | 119,749,761.89 | 64,544,413.64 |
| 2012 වර්ෂය සඳහා අතිරික්තය/හිගය | 29,967,560.13 | 55,978,423.25 |
| පූර්ව වර්ෂ ගැලපුම | 828,558.66 | |
| | **150,545,880.68** | **120,522,836.89** |
| **21. ප්‍රතිතක්සේරුකරණ සංචිත** | | |
| ශේෂය ඉ/ගෙ | 1,193,453.14 | 2,833,933.83 |
| වැඩි වූ/ අඩු වූ වටිනාකම | | (1,640,480.69) |
| | **1,193,453.14** | **1,193,453.14** |
| **22. විවිධ ප්‍රතිපාදන සැලසීම්** | | |
| විදේශ පුහුණු සඳහා ප්‍රතිපාදන | 1,908,568.00 | 1,305,000.00 |
| ෂඔ සහ විදුලි පරීක්ෂණ උපකරණ සඳහා ප්‍රතිපාදන | 0.00 | 5,451,400.00 |
| පාරිභෝගික උපදේශන කමිටු ක්‍රියාකාරකම් සඳහා ප්‍රතිපාදන | 0.00 | 665,000.00 |
| උපයනවිට ගෙවීම් බදු සඳහා ප්‍රතිපාදන | 0.00 | 145,137.00 |
| ලී බඩු සහ සවිකිරීම් සඳහා ප්‍රතිපාදන | 0.00 | 303,910.00 |
| ලිහිසි තෙල් අංශයේ මහජන ප්‍රචාරන කටයුතු සඳහා ප්‍රතිපාදන | 0.00 | 500,000.00 |
| උපදේශන සේවා | 5,000,000.00 | |
| | **6,908,568.00** | **8,370,447.00** |
| **23. ගෙවිය යුතු ගිණුම්** | | |
| SAFIR 2009 දායකත්ව ගාස්තු සඳහා ඉතිරි ශේෂය | 1,450.00 | - |
| SAFIR 2010 දායකත්ව ගාස්තුව | | - |
| වෙළඳ දැන්වීම් | 411,564.00 | - |
| පණිවුඩ හුවමාරුව | 268,010.13 | 192,130.45 |
| නීති සහ පර්යේෂණ | | 8,571.22 |
| පුවත්පත් | 30,885.00 | 5,420.00 |
| වෙනත් | - | - |
| අතිකාල | 83,928.75 | 59,370.00 |
| ලිපිද්‍රව්‍ය | 1,040.00 | 11,852.48 |
| පරිවර්තන | 7,570.50 | 14,566.50 |
| ප්‍රවාහනය | 20,526.84 | 47,311.36 |
| ගමන් වියදම් | 80,240.00 | 9,500.00 |
| සුහසාධනය | 550,000.00 | - |
| පැමිණීම් දීමනා | 45,000.00 | - |
| කාර්යාල ගොඩනැගිලි නඩත්තුව | 17,607.68 | - |
| දේපළ පිරියත සහ උපකරණ | 2,125,497.02 | - |
| පවිත්‍ර කිරීම් සේවා | 46,450.00 | - |
| ජලය | 31,639.03 | - |
| විදුලි බලය | 72,969.75 | 37,979.95 |
| මල් සැරසිලි | - | - |
| රක්ෂණ | 43,714.10 | 3,801.26 |
| උපදේශනය | 9,880,861.11 | 39,984.00 |
| ගෙවිය යුතු මුද්දර ගාස්තු | 13,025.00 | 9,125.00 |
| උපයනවිට බදු | 184,009.00 | - |
| දේශීය පුහුණු වියදම් | 275,000.00 | - |
| වෙනත් | | 3,829.33 |
| වෙනත් දීමනා | 128,750.00 | |
| | **14,319,737.91** | **443,441.55** |
| **24. විගණකාධිපති** | | |
| ඉ/ගෙ ශේෂය | 200,000.00 | 100,000.00 |
| 2010/2009 සඳහා ප්‍රතිපාදන | 100,000.00 | 100,000.00 |
| | **300,000.00** | **200,000.00** |

2011 දෙසැම්බර් 31 දිනට දේපළ පිරියත සහ උපකරණ

| | ගෘහ භාණ්ඩ සහ සවිරීම් | පරිගණක සහ කාර්යාලීය උපකරණ | වාහන | උපකරණ | මෘදුකාංග | එකතුව |
|---|---|---|---|---|---|---|
| | රු. ශත. | රු. ශත. | රු. ශත. | රු. ශත. | රු. ශත. | රු. ශත. |
| **වර්ෂය ආරම්භ වන විට** | **8,120,023.31** | **7,894,159.88** | **14,719,060.00** | **30,305.00** | **1,198,762.62** | **31,962,301.81** |
| වර්ෂය තුල එකතුවීම් | 4,064,608.80 | 4,661,124.34 | 5,500,000.00 | - | 1,682,411.92 | 15,908,145.06 |
| එකතු කළාග වත්කම්වල ප්‍රත්‍යාගණනය | | | | | | |
| අඩුකළා. ප්‍රත්‍යාගණනය කළ වත්කම්වල පොත් අගය | | | | | | |
| **වර්ෂය අවසානය වන විට** | **12,184,632.11** | **12,555,284.22** | **20,219,060.00** | **30,305.00** | **2,881,175.54** | **47,870,455.87** |
| ක්ෂය ප්‍රතිභාය | | | | | | |
| වර්ෂය ආරම්භය වන විට | 3,009,510.97 | 3,287,032.96 | 2,112,726.28 | - | 75,831.21 | 8,575,101.42 |
| වර්ෂය තුළ වෙනස්වීම් | 1,635,231.20 | 2,375,361.40 | 3,004,085.97 | - | 475,776.42 | 7,490,454.99 |
| බැහැර කිරීම් සඳහා | | | | | | |
| අඩුකළා. ප්‍රත්‍යාගණනය කළා වත්කම්වල ක්ෂය | | | | | | |
| **වර්ෂය අවසාන වන විට** | **4,734,743.17** | **5,662,394.36** | **5,116,812.25** | **-** | **551,607.63** | **16,065,556.41** |
| 2012 දෙසැම්බර් 31 දිනට ශුද්ධ පොත් වටිනාකම | 7,449,889.94 | 6,892,889.86 | 15,102,247.75 | 30,305.00 | 2,329,566.91 | 31,804,899.46 |

සියලු පාර්ශ්වකරුවන්, පාර්ලිමේන්තුව හා මුදල් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කෙරෙන
ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවෙහි 2012 වර්ෂය සඳහා වූ වාර්තාව.

2002 අංක 35 දරණ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනතෙහි
37(1) වගන්තියට අනුකූලව ඉදිරිපත් කළයුතු වාර්තාවද අන්තර්ගතය.

Designed & Produced by
The Extrem Media
etm.ceylon@gmail.com , +94 114 994 377 , +94 716 826 037